# බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව
# මහා සභා රැස්වීමේ වාර්තාව.
# 2021.04.09

වර්ෂ 2021 ක් වූ අප්‍රේල් මස 09 වන සිකුරාදා දින පෙ.ව. 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වූ අප්‍රේල් මස මහා සභා රැස්වීමේ වාර්තාවයි.

**සහභාගීත්වය.**

01. ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා
02. ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා
03. ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා
04. ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා
05. ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා
06. ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා
07. ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා
08. ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා
09. ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය
10. ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා
11. ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා
12. ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා
13. ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා
14. ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා
15. ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය
16. ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය
17. ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය
18. ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා
19. ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා
20. ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා

**නොපැමිණි.**

01. ගරු උප සභාපති ජේ.ඒ. ධම්මික සුමිත් ජයසේකර මැතිතුමා
02. ගරු මන්ත්‍රීනි ඩී.ජී. වාසනා උදයංගනී මැතිණිය

මීට අමතරව ප්‍රාදේශීය සභාවේ ලේකම් එල්.එච්. අනිල් රංජන් මහතා ද සහභාගී විය.

**ආගම සිහි කිරීම හා සභාව පිළිගැනීම.**

ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා විසින් සියලුම ගරු සභිකවරුන්, ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් හා මාධ්‍යවේදීන් පිළිගැනීමෙන් අනතුරුව පළමුව ආගම සිහිපත් කරන ලදී. ඉන් අනතුරුව විනාඩියක නිශ්ශබ්දතාවය රැකීමෙන් රට වෙනුවෙන් සටන් වැද මියගිය රණවිරුවන් හා මියගිය සභිකවරුන්, නිලධාරීන් හා සේවකයන් සිහිපත් කරන ලදී.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**01) 2021-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා, විරෝධතා හෝ නිවැරදි කිරීම් තිබේ නම් ඉදිරිපත් කරන්න. නැත්නම් 2021-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ලියා ඇති පරිදි ස්ථිර කරන ලෙස යෝජනා කරන්න. සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** 2021-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සංශෝධනවලට යටත්ව සභා සම්මත කිරීමට මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** මාම්පිටිය මහවත්ත මාවත ආරම්භයේ සවිකර තිබූ එල්.ඊ.ඩී වීදි ලාම්පුව ගලවා ඇති බැවින්, නව වීදි ලාම්පුවක් සවි කරන්න යෝජනා කරලා තියෙනවා. සභාපතිතුමා මම ඒක අළුත්වැඩියා කරන්න කියලා කිව්වේ. මේ තියෙන්නේ ඒ දීපු ලිස්ට් එකේ පිටපතක්. මම කියපු තැන නෙමෙයි ඒ වීදි ලාම්පුව සවි කරලා තියෙන්නේ. ඊට පස්සේ ඒකට චෝදනාවක් කරනවා.

"මාම්පිටිය, මහවත්ත පිවිසුමේ නව විදුලි ලාම්පුවක් සවි කරලා තිබුණා. මම දැක්කා ඒක සතියක් විතර තියෙනවා. ඊට පස්සේ ඒ වීදි ලාම්පුව ගලවාගෙන ගිහිල්ලා තියෙනවා. මට ඒ ඇතුලේ ඉන්න කෙනෙක්ගෙන් පැමිණිල්ලක් ආවා මෙහෙම වීදි ලාම්පුවක් සවි කරා නමුත් ඒක ගලවා ගෙන ගියා කියලා. එහෙම නම් ඒක ගලවා ගෙන යන්න අදහස් කර ගෙන ඉන්නවා නම් ඒක හයි නොකර ඉන්න ඕන. ඒකට නව එල්.ඊ.ඩී. විදුලි ලාම්පුවක් කොහෙන් හරි හොයලා සවි කරලා දෙන්න කියලා මගේ ඉල්ලීම තියෙන්නේ."

33 පිටුවේ ඩඩ්ලි මන්ත්‍රීතුමා එහෙම කියලා තියෙනවා. ගරු සභාපතිතුමා මම කියපු තැනට නෙමෙයි ඒ වීදි ලාම්පුව සවි කරලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයි තිස්ස මන්ත්‍රීතුමා මේ. ඔබතුමා මේ අදහසට විරුද්ධ කතාවක්ද කරන්නේ. ඒ දේ සිද්ධ වුණේ නැහැ කියලද කියන්නේ.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ඒක සිද්ධ වුණේ නැහැ. එතුමා චෝදනා කරනවා නම් හොයලා බලලා චෝදනා කරන්න ඕන. එතකොට එහෙම කිසි දෙයක් නැහැ. ඒක සංශෝධනය කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා කියපු එක මේකෙ අන්තර්ගත වෙන්න ඕන. ඒක අපිට සංශෝධනය කරන්න බැහැ. නමුත් ඒකෙදී එතුමා කියපු නැති දෙයක් මේකෙ සඳහන් කරලා තියෙනවා නම් හරි, එතුමා කියපු දෙයක් මේකෙ සඳහන් කරලා නැත්නම් හරි ඒක කරන්න පුළුවන්. ඒ ඇරෙන්න එතුමා කියපු දේ අපි මේකෙ සඳහන් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එතකොට වුණේ ඒ දේ නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ඔබතුමාට ඒ යෝජනාව සාකච්ඡා කරන අතරවාරයේදී කියන්න තිබුණා. සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන් නොකියපු දෙයක් සඳහන් වෙලා තියෙනවා නම් හරි, කියපු දෙයක් සඳහන් නොවී තියෙනවා නම් හරි තමයි. එහෙම නම් තමයි ඒක කරන්න පුළුවන්. ඒක තේරුම් ගන්න. සංශෝධනයක් කියන්නේ ඒක. ඒක යෝජනා සාකච්ඡා කරපු අතරවාරයේදී පැහැදිලි කිරීමක් කරන්න තිබුණා මේක ඉදිරිපත් කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සංශෝධන තිබේ නම් ඉදිරිපත් කරන්න.

සංශෝධන නැති බවයි පෙනෙන්නේ.

2021-03-17 දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද තාක්ෂණ නිලධාරීන් සභා රැස්වීමට සහභාගී වෙන්නේ නැහැ. මොකද ඔවුන්ට කලින් සැලසුම් කරපු පුහුණු වැඩමුළුවක් සහ පරිසර කමිටුවක් පැවැත්වෙන හින්දා. අද තාක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වය අපිට බලාපොරොත්තු වෙන්න අමාරුයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිසර කමිටුව අද පැවැත්වෙනවා. ඒ වගේම තාක්ෂණ නිලධාරීන් පුහුණු වැඩමුළුවකටත් සම්බන්ධ වෙනවා.

පසුගිය වර්ෂයේදී මේ වන විට තිබුණ තත්ත්වය සියළුදෙනාම දන්නවා. කොරෝනා වසංගතයත් සමඟ රටම ඒ වෙන කොට ලොක්ඩවුන් කරලා තිබුණේ. අපිට මේ වර්ෂයේදී කොරෝනා වසංගතය තුරන් කරන්න බැරි වුණත්, ජන ජීවිතය අඩාල නොවී යම්තාක් දුරට අළුත් අවුරුද්ද සමරන්න පුළුවන් මට්ටමක් අද ඇති වෙලා තියෙනවා.

ලබන්නා වූ සිංහල දමිළ අළුත් අවුරුද්ද මන්ත්‍රීවරු සියළුදෙනාටම සහ ලේකම්තුමා ප්‍රධාන නිලධාරීන් සියළු දෙනාටමත් මාධ්‍යවේදී මහත්ම මහත්මීන් සියළුදෙනාටමත් සුභම සුභ අළුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම බෝපෙ පෝද්දල ජනතාවටත් සුභම සුභ අළුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

(ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මම විශේෂයෙන්ම අද දවසේදී ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා. අවුරුද්ද දැන් කටටම ඇවිල්ලා තියෙන්නේ. මම මේ අවුරුද්ද කන්න ලේස්ති වෙනවා නෙමෙයි. වැඩ අධිකව තියෙන නිසා අපි විශේෂයෙන්ම සභාව පුළුවන් තරම් කෙටි කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම ඔබතුමාගෙන් තමයි ඉල්ලා සිටින්නේ. ඉන්දික මන්ත්‍රීතුමා තවම ඇවිත් නැහැ. ඒ හින්දා අවුලක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි විශේෂ සභාවක් දා ගමු ඇත්තටම. අපි ඒකට දිනයක් අදම යෝජනා කර ගෙන ප්‍රගතිය පිළිබඳව ඒකෙදී සාකච්ඡා කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතාමත්ම සතුටු වෙනවා අද උදේ ඔය වගේ ප්‍රකාශයක් අහන්න ලැබීම පිළිබඳව.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** විශේෂ සභාවක් ගමු අවශ්‍යතාවයක් ආවොත්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔබතුමා මගේ යෝජනාවක් අයින් කරපු එක පිළිබඳව මට විනාඩියක් කතා කරන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හිතුවා ඔබතුමා ඉස්සෙල්ලා නැගිට්ටේ ඒක අහන්න කියලා. ඒක ඔබතුමාගේ යෝජනා යටතේ ගමු.

**<u>ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.</u> ඃ- නැත**

**<u>(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න</u> ඃ- නැත**

**<u>(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා</u>**

**<u>ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ- 01.** ජල පිරිපහදු යන්ත්‍ර දෙකක් මිලදී ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන පොඩි අදහසක් දක්වන්න ඕන. එක ආයතනයකින් සභාවට ආවා. සභාවට ඇවිල්ලා ඒ අය දැනට අපි භාවිතා කරන ජලයට මැෂින් එකක් දාලා පෙන්නුවා. මඩ කොච්චර ප්‍රමාණයක් තියෙනවාද කියලා. ඒ වගේම තව උපකරණයකින් ඒක පෙන්නුවා. ඉතිං මම ඒකට 100% ක් එකග නැහැ. ඒ දාන එකෙන් මොකක් හරි රසායන ද්‍රව්‍යයක් යනවද කියලා දන්නේ නැහැ. මළකඩ වගේ සැහෙන්න ප්‍රමාණයක් වීදුරුවේ පෙන්වනවා. අපි ෆිල්ටරයෙන් පාවිච්චි කරන වතුර එකට දැම්මත්, ඒක දාලා විනාඩි ගාණක් වතුර උතුරනවා වගේ නට නට යන්නේ. එහෙම වුණාට පස්සේ මළකඩ වගේ ලොකු ස්ථරයක් එනවා. ඒක හිතා ගන්න බැහැ. ඒ අය ලික්විඩ් එකක් දාලා කියලා මම හිතුවේ. ඒ අය ගේන උපකරණය දාලා පරීක්ෂා කරලා පෙන්වනවා කිවුවා දෙකේ වෙනස. ඒක රු.52,000.00 ක වගේ මුදලක් වෙනවා. කාර්යාල දෙකට ඒවා දෙකක් ගන්න යන්නේ. මම නම් කිවුවේ අවුරුදු හතළිහක් ගාණක්, පනස්ගාණක් වතුර බිවුවා වගේ, ඉතුරු කාලයත් තව මොකක්ද කියලා හිතෙනවා.

**ගරු මන්ත්‍රීනි ජී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** තව එකක් තියෙනවා රු.19,000.00 ට. අපේ පැත්තේ හැම ගෙදරකම දැන් ඒක තියෙනවා. හැමෝම දැන් ඒක භාවිතා කරනවා. ඇත්තටම ඒ වතුරේ මළකඩ තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ඒක නෙමෙයි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** රු.52,000.00 ක එක ඇත්තටම හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කාර්යාල දෙකට දෙකක් ගන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**02.** 2021 අයවැය මගින් සේවක සුභ සාධනය සඳහා වෙන් කර ඇති රු.100,000.00ක මුදල අප ප්‍රාදේශීය සභාවේ සුහද සුභ සාධක සංගමයේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව සඳහා ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ වගේම තවත් රු.100,000.00 ක මුදලක් තියෙනවා මන්ත්‍රීවරුන්ට චාරිකාවක් යන්න. ඒකත් මේකට එකතු කරනවා. ඒ යෝජනාව සංශෝධනය කරනවා.

2021 අයවැය මගින් ගරු සභිකවරුන්ගේ සුභ සාධනය සඳහා වෙන් කර ඇති රු.100,000.00 ක මුදල අප ප්‍රාදේශීය සභාවේ ගරු සභිකවරුන් හට අධ්‍යාපන චාරිකාවක නිරත වීම සඳහා ලබා දීමට යෝජනා කරමින් මෙම යෝජනාව මම සංශෝධනය කරනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එම සංශෝධනය මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක පරිත්‍යාග කරන්න බැරිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගිය අවුරුද්දේ පරිත්‍යාග කරා. ගිය අවුරුද්දේ ගත්තේ නැහැනේ.

එම සංශෝධිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.** වගකීම් කාලය ඉක්මවා ගොස් ඇති දැවී ගිය එල්.ඊ.ඩී බල්බ් අළුත්වැඩියා කොට නැවත භාවිතය සඳහා අප ප්‍රාදේශීය සභාවේ සේවකයන් දෙදෙනෙකු පුහුණු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සහ උපකරණ මිලදී ගැනීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට පිච්චුණ බල්බ් එකක් නැවත අළුත්වැඩියා කරන්න රු.150.00 ක වගේ මුදලක් යන්නේ. අපි ඒක පරීක්ෂා කරලා බලමු. අපේ සේවකයෝ මේවා හදන්නේ. අපේ සේවකයෝ දෙන්නෙක් පුහුණු කරලා ගන්නවා ඒ සඳහා. එතකොට ඒ පිච්චුණ බල්බ් අපි හදන්නේ. හැබැයි එතකොට වගකීම් කාලය පහුවෙලා තියෙන්න ඕන. නැත්නම් තේරුමක් නැහැ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04.** අප ප්‍රාදේශීය සභාව සතු පෝද්දල පිහිටි ඉඩමේ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ අංගනයක් ඉදිකිරීමටත්, කසළ දාහක යන්ත්‍රයක් මිලදී ගෙන සවිකිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** පෝද්දල එකද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ආදාහනාගාරයක් හදන්න ගිහිල්ලා අපිට අර ප්‍රශ්නයක් ආපු ඉඩම මේ. මාතලේ ප්‍රාදේශීය සභාවේ පර්චස් 40 ක භූමියේ ඔය වැඩ දෙකම කෙරෙනවා. එදා ක්ෂේත්‍ර චාරිකාවට ගියපු මන්ත්‍රීවරු ඒක දන්නවා ඇති. සභාව සතු සියළුම කැලි කසළ ගෙනල්ලා දිරන ද්‍රව්‍ය වලින් වෙනම කොම්පෝස්ට් කරනවා. නොදිරන ඒවා කසළ දාහක යන්ත්‍රයෙන් පුච්චනවා. ඒක කරන්න තමයි අපි මේ නියමු ව්‍යාපෘතියක් විදියට මේක ආරම්භ කරන්න උත්සාහ කරන්නේ. ඒකට තමයි මේ යෝජනාව ඉදිරිපත් කරේ. දැනට හොරණ මේ වගේ එකක් සාර්ථකව කරනවා කිව්වා. අපි වෙනම දිනයක් දාගෙන ඒ දෙකම අවුරුද්දෙන් පස්සේ බලන්න යමු. මාතලේ එක නම් අපි බැලුවා. හොරණ එක බලන්න යමු කියලා මම කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක කරන්නේ මහායාන එකෙන්. ගන්න තිබුණ එක තමයි නැති කරේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම මේ යෝජනාවට එකතු කිරීමක් කරනවා. අපිට චාරිකාව සඳහා වෙන් වෙච්ච මුදල් මේ සඳහා අධ්‍යාපන චාරිකාවක් විදියට යොදා ගත්තට කමක් නැහැ. ඒක සුදුසුයි කියලා මම යෝජනා කරනවා. ඒක අධ්‍යයනයක් සහිතව කරන්න ඕන එකක්නේ. අපි අමතරව මුදලක් නාස්ති කරනවාට වැඩිය ඒක ඵලදායි විදියට යොදා ගන්නවා නම් හරි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** පවුලේ කට්ටියත් එක්ක යන්න මේ කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙමද, කොයි පවුලද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පවුලේ කට්ටිය ඉන්න කෙනා කිව්වේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මම කියන්නේ ඒකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන අපි ඉස්සරහට කතා කරලා බලමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක වඩා සුදුසුයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මෙතනට දා ගන්න එපා. මන්ත්‍රීවරුන්ට රිලැක්ස් වෙන්න යන්න ඒක තියෙන්නේ. එහෙම එකකට තමයි අපි මේක යෝජනා කරේ. නිලධාරිනුත් දන් එකක් යනවානේ. නිලධාරීන්ටත් රු.100,000.00 ක් වෙන් කරලා තියෙනවානේ මන්ත්‍රීතුමා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05.** වටරක නැගෙනහිර ප්‍රජාශාලාව සෙනසුරාදා සහ ඉරිදා දිනයන්හීදි පමණක් භාවිතයට ලබා ගැනීම සඳහා වූ ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කර ගැනීමට කරනු ලැබූ ඉල්ලීම අනුව ජී. සම්පත් ඩයස් මහතා හට තවත් වසරකින් (2021-04-01 සිට 2022-03-31 දක්වා) එම ගිවිසුම දීර්ඝ කර ලබා දීමටත්, ගිවිසුම්ගත බදු මුදල රු.2,250.00 ක් කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06.** වර්තමානයේ වසා ඇති ව්‍යාපාරික ස්ථාන පැවතීම, සෞඛ්‍ය වෛද්‍ය නිර්දේශ නොමැති ව්‍යාපාර පැවතීම, ස්ථාන පරීක්ෂාවට ලිපිනය ප්‍රමාණවත් නොමැති ව්‍යාපාර පැවතීම සහ වෙළඳාමේ අයිතිය වෙනස් වූ ව්‍යාපාරික ස්ථාන පැවතීම යන හේතුන් නිසා 2019 වර්ෂයට අදාළව උප කාර්යාලයට අයත් වෙළඳ බලපත්‍ර ලේඛනයේ පවතින රු.33,000.00ක හිඟ ශේෂයන් පොත්වලින් කපා හැරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ ලැයිස්තුව ලබා දීලා ඇති.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**07.** දැනට පුරප්පාඩුව ඇති රියදුරු තනතුර සඳහා අප ප්‍රාදේශීය සභාවේ විශ්‍රාමික රියදුරු පී.ඒ. ආරියසේන මහතාද, මැයි මාසයේදී ඇතිවන රියදුරු පුරප්පාඩුව සඳහා අප ප්‍රාදේශීය සභාවේ විශ්‍රාම යාමට නියමිත රියදුරු බී.කේ. සරත් මහතාද වසරක කොන්ත්‍රාත් කාලයක් සඳහා බඳවා ගැනීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**08.** 2021 වර්ෂය සඳහා අදාළ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සභා සම්මත කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ලබා දීලා තියෙන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**09.** ගිංතොට, පියදිගම, ශ්‍රී සුදර්ශන මාවතේ සිට ගෝලුව දක්වා දිවෙන අතුරු මාර්ගය සිරිගුණ මාවත නමින් නම් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක 1979 දී ආපු යෝජනාවක්. අපේ පියදිගම ස්වාමීන්වහන්සේ ඇවිල්ලා ඒකට ඉල්ලීමක් කරා. මේක නැවත සභාවට දාලා අළුත් කරලා දෙන්න කියලා. 1979 දී ගනිපු තීන්දුවක් මේක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අර වීඩියෝ එකේ ඉන්න හාමුදුරුවන්ගේ නම මේකට දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මරුනේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ හාමුදුරුවන්ට අපේ මන්ත්‍රීවරු දෙන්නෙකුත් වැන්දා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා අපි සාමාන්‍යයෙන් හාමුදුරුනමක් ආවම වඳිනවා. ඒ සිවුරට ගරු කරන්න. හාමුදුරුවෝ කවුද කියලා අපි දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊයේ තව වීඩියෝ එකක් යනවා දැක්කා. වාහනයේ එකක්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ කතාව ආව හින්දා මම මේක කියන්නේ. ඇත්තටම ශාසනයටත් අපකීර්තියක් වෙන විදියේ සිදුවීමක් මේක. ඒක විතරක් නෙමෙයි, ඒ භික්ෂුවක් නෙමෙයි, සිවුර දා ගනිපු පුද්ගයෙක්, මේ චීවරදාරියෙක්. මේ පුද්ගලයා දකුණු පළාත් සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ උපදේශකවරයෙක් විදියට කටයුතු කරනවා. මම දැන් ඒකට පෞද්ගලිකව ඉල්ලීමක් කරනවා. මම ඒකට යෝජනාවක් දාන්න හිටියේ මේ පුද්ගලයාව ඒ තනතුරෙන් අයින් කරන්න කියලා. සම්පූර්ණයෙන්ම සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ බලයත් අරගෙන කටයුතු කරලා තියෙනවා. එතනත් දැන් අපකීර්තියට පත් වෙලා තියෙනවා. ඒ නිසා මම ඒක කිව්වේ. මම ලබන සභාවට යෝජනාවක් ගේනවා මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා ආණ්ඩුකාරවරයාට දන්වා යවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ එතන ආශ්‍රය කරන යාළුවන්ගේ වැරැද්ද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං අපි චන්දිම හාමුදුරුවන්වත් ආශ්‍රය කරනවානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** හාමුදුරුවන්ගේ යාළුවන් කිව්වේ කවුද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යාළු හාමුදුරුවරු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මට ඒකට අර්ථකථනයක් දක්වන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක උත්තරයක් බලාපොරොත්තුවෙන් කියපු එකක් නෙමෙයි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මම පහුගිය දිනයක ගංගාතිලක පන්සලේ දානයක් බෙදන්න ගියා. මම විතරක් නෙමෙයි ගමේ සියළුදෙනා පන්සලේ හිටියා. මම දානය බෙදා ගෙන යනකොට ඒ හාමුදුරුවෝ කිව්වා මන්ත්‍රීතුමාගේ ෆේස්බුක් ගිණුම හොඳයි, ඒක හොඳට පවත්වා ගෙන යනවා කියලා. මගේ වැඩපිළිවෙල හොඳයි කියලා කිව්වා. මට කිව්වා හාමුදුරුවන්ගේ වැඩක් තියෙනවා කියලා කර ගන්න. මගෙන් උදවු ඕන කිව්වා. ඒක කියන්නත් ඕන. නැත්නම් මේක දිගේ යනවා. එතකොට ඒක අවුලක්නේ. පස්සෙදී මම සභාපතිතුමාටත් කියලා අපේ ප්‍රාදේශීය සභාවේ කම්කරුවෝ හතර දෙනෙක්ව දානවා ඒ ඉඩම සුද්ධ කරන්න. දැන් මේ හාමුදුරුවෝ අපිට කිව්වේ දේශීය වෛද්‍ය ප්‍රතිකාර වලට ගන්න පැළ තවානක් තියෙනවා කියලා. මේ ඉඩම තියෙන්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය ඇතුලේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මේකෙන් ජාත්‍යන්තරයටත් ගියා කොහොම හරි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක හරි. ඉතිං ඇත්තටම ඒක වැරැද්දක් නෙමෙයි. මේ ඉඩම තියෙන්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ. ඒ කියන්නේ වැලිපිටිමෝදර කොට්ඨාශයේ, පියදිගම ග්‍රාම නිලධාරි වසමේ. එතකොට අපි ඉඩම සුද්ධ කරලා දීලා, පැළ තවාන් කරලා දුන්නා. අපේ නායකයොනුත් ගෙන්වලා අපි ඒක විවෘත කරා පැළ තවානක් විදියට. ෆොටෝ ගහලා ඒක තියෙනවා. ඉතිං අපි ගිහින් මේක ගැන ගාල්ල නගරාධිපතිතුමාටත් කිව්වා. අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවෙන් දවස් දෙකක් කම්කරුවන්ව යෙදෙව්වා. හැබැයි නගරාධිපතිතුමා විසින් බැකෝ එකක් දීලා සම්පූර්ණයෙන්ම පාරවල් කපලා ඉඩම සුද්ධ කරා. ඒ ඉඩම සුද්ධ කරලා තමයි මේ කාර්යය සිද්ධ කරේ. ඉතිං අපි ඒක කරේ හාමුදුරුවෝ කරපු ඉල්ලීමට. ඊට පස්සේ අපි මෙතනට ප්‍රභූවරුන් එක්ක එන්න හදනකොට ඇවිත් අපෙන් ඇහුවා මෙතන ප්‍රශ්නයක් තියෙනවද කියලා. අපිට එවෙලේ ප්‍රශ්නයක් පෙනුනේ නැහැ. එදා එතන අබේසේකර මන්ත්‍රීතුමයි, ලියනගේ මන්ත්‍රීතුමයි හිටියා. මට හාමුදුරුවෝ කිව්වා මෙන්න මෙතන පොඩි ප්‍රශ්නයක් තියෙනවා ඒක පන්සලට ගිහින් බලමු කියලා. එවෙලේ තමයි අපි හාමුදුරුවන්ට වැන්දේ. හාමුදුරුවෝ කිව්වා ගියපු ගමන්ම ඔන්න මහත්තයෝ ඇමතිතුමා එනවා කියලා හරියටම හවස 04.30ට. අපිටත් එන්න කිව්වා. ඒක තමයි ඇත්ත කතාව. ඊට එහාට වෙන යාළුකමක්වත්, වෙන සම්බන්ධකමක්වත්, ඔය හිතන් ඉන්න දේවල්වත් නැහැ. අපි අපේ යාළුවොත් එක්ක අපේ සම්බන්ධකම් වෙනම තියෙනවා. ඒක

වෙනම දෙයක්. ඒ හාමුදුරුවොත් එක්ක ඒ සම්බන්ධකම් නැහැ. හාමුදුරුවොත් එක්ක අපි ඒවාට යන්නේ නැහැ. ඉතිං ඒක හින්දා ගරු සභාපතිතුමා මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා එහෙම විශේෂ යාළුකමක් අපි අතර නැහැ. හාමුදුරුවන්ගේ ඉල්ලීමට ඇහුම්කන් දීලා ඒ කාරණය අපි ඉෂ්ඨ කරා. ඒක තමයි අපි කරේ.

හැබැයි ඉතිං මම කියන්නේ වෙන එකක් නෙමෙයි. මේ ඉඩම තියෙන්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ. මේ ඉඩමට දැන් අයිතිකාරයෙක් නැති තත්ත්වයක් තමයි තියෙන්නේ. මම එතනදී ඒ ගැන සභාව දැනුවත් කරනවා. මේ ඉඩම කාගෙද කියලා හොයලා බලලා මේකෙ නියම අයිතිකාරයෙක් නැත්නම් මේ ඉඩම සභාවට පවරා ගන්න කියලා කියනවා. ඒක අපිට කරන්න පුළුවන්. දැන් මේ වෙන විට ඊට පස්සෙත් හාමුදුරුවන්ට විරුද්ධව යම්යම් අය පොලීසි ගියා. ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම් ගාවට ගියා. දිසාපතිතුමා ගාවටත් ගියා. දිසාපතිතුමයි, ප්‍රාදේශීය ලේකම්තුමියයි ඒ උත්සවයට එනවා. ආයුර්වේද ඖෂධ සංස්ථාවෙනුත් එනවා. ඒ අය මේ ඉඩමේ නිවැරදිභාවය තියෙන හින්දානේ එන්නේ. මේ ඉඩමට පිට අයිතිකාරයෙක් නැහැ. මේක පන්සලට අයිතියි කියන මතයේ තමයි ඉන්නේ. පිට අය කියනවා මේක පන්සලටත් අයිති නැහැ කියලා. මේ ඉඩමට ඔප්පුවක් තියෙන කෙනෙක් නැහැ. මේ ඉඩම අක්කර තුනහමාරක් පමණ වෙනවා. මේ ඉඩම ගැන අපි හොයලා බලමු. නැත්නම් මේක හැමදාම කැලේ වැවිලා යනවා. ඒකෙ තියෙන ගස් ටික කපන් යනවා. ඒ ගස් ටික කපන්න ගිහින් තමයි ඔය ප්‍රශ්නය ඇති වෙලා තියෙන්නේ. හාමුදුරුවෝ ගස් ටික කපා ගෙන ගිහිල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඒක ප්‍රාදේශීය ලේකම් එකෙන් අහමු. මේක අපිට පවරා දීමට කටයුතු කරන්න කියලා ඉල්ලමු.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** හරියටම හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලබන සභාවට විධිමත් යෝජනාවක් දාන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙහෙමයි. දැන් මම ඇත්ත කාරණාවට එන්නම්. අපේ රමේෂ් පතිරණ වැවිලි අමාත්‍යතුමත්, මේ අවස්ථාවට ආවා. ගාල්ල නගරාධිපතිතුමත් ආවා. දිසාපතිතුමත්, ප්‍රාදේශීය ලේකම්තුමියත් ආවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මමත් ගියානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඔව්. ඔබතුමත් ආවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මමත් ගියානේ ඉතිං.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපිට කරපු ආරාධනාවට අපි ගියා. දැන් අපිට පොටක් පෑදිලා තියෙනවා මේ ඉඩම ගැන. ඒකට මම ලබන සභාවට යෝජනාවකුත් ගේනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ අවස්ථාවේ ඡායාරූප භාවිතා කරමින් මේ හාමුදුරුවෝ පොදුජන පෙරමුණේ භික්ෂුවක් කියලා ඒ අයටත් හානියක් කරනවා. මම දැක්කා සරත් වීරසේකර ඇමතිතුමාගෙත්, අගමැතිතුමාගෙත් ඡායාරූප භාවිතා කරමින් ඒක කරනවා. මේක ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට සිදුවෙන හානියක් නිසා මම ආණ්ඩුකාරවරයාගෙන් ඉල්ලීමක් කරන්න හිටියේ. දැන් මේ වෙලාවේ ඒක න්‍යාය පත්‍රයට දාන්න බැරි නිසා මම හිටියේ. ලබන සභාවට මම ඒක දාන්නම්. මම පරීක්ෂණයක් ඉල්ලනවා මේ හාමුදුරුවන්ව ඒ තනතුරෙන් ඉවත් කරන්න කියලා. මේකෙදී ඒ සියළු දෙනාගේම ඡායාරූප අවභාවිතා කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**10.** උළුවිටිකේ, සඟබෝවත්ත මාර්ගයට යාබද වැයිහේනවත්ත, යූ.කේ. සම්මානි මහත්මියගේ ඉඩම අසල ඇති කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒ යෝජනාව මොකක්ද සභාපතිතුමනි. මේක කොහෙද තියෙන්නේ. නාවින්නේද, උළුවිටිකේද තියෙන්නේ. එහේ වැයිහේනවත්ත කියලා එකක් නැහැනේ. වැවේවත්ත නම් තියෙනවා.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** වැරදිලා වෙන්න ඇති.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයාගේ ඉල්ලීමට මේ යෝජනාව දැම්මේ. ඒක තියෙනවා නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** යූ. කේ. සම්මානි කියන කෙනාව මම දන්නෙත් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරියාගේ නිර්දේශයක් තියෙනවා. ඒක අනුව තමයි මේක සභාවට දාලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඊට වඩා අබලන් මාර්ග හදන්න තියෙනවා. සඟබෝවත්තේ රාජාලගේ අක්කගේ ගෙවල් ළඟ මාර්ගය කඩන් වැටිලා කාණුව බඳින්න තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අද තාක්ෂණ නිලධාරියා නැහැ මේක ගැන අහන්න. ඒකයි වැඩේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මමත් හෙව්වා ඒක හොයා ගන්න. සභාපතිතුමා යෝජනාව දැම්මට කවුද කියලා දන්නෙත් නැහැ. තියෙන තැනක් දන්නෙත් නැහැ. ග්‍රාම නිලධාරිගෙනුත් මම ඒක ගැන ඇහුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තාක්ෂණ නිලධාරීගේ නිර්දේශය අනුව, මේක දාලා තියෙන්නේ. සඟබෝවත්තේ පහළ කියලා කිවුවේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** සඟබෝවත්ත පහළ එක්කෝ නාවින්න වෙන්න ඕන, නැත්නම් බොකරමුල්ලගොඩ ග්‍රාමසේවා වසම වෙන්න ඕන. මාත් ඕක බැලුවා. තැන කොහේද කියලා හොයා ගන්න නැහැ. ඡන්දහිමි නාමලේඛනයේවත් එහෙම නමක් නැහැ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** මේ අළුතෙන් ඉඩමක් අරගෙන ගිය කෙනෙක්. මෙයා ගිංතොට එක්කෙනෙක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහේ එක්කෙනෙක් නෙමෙයි මේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඡන්දහිමි නාමලේඛනයේවත් එහෙම නමක් නැහැ.

**ගරු මන්ත්‍රීනි පී. ටෙක්ලා ශ්‍යාමලී මැතිණිය ඃ-** එයාට ඡන්දය ඇත්තේ ගිංතොටට.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මීට වැඩිය කළ යුතු දේවල් තියෙනවානේ සභාපතිතුමා. අර ඊයේ පෙරේදා ලොරියක් ගිහිල්ලා හැප්පිලා දෙන්නෙක් තුවාල වෙලා තියෙනවා සඟබෝවත්තේදී. ඒ අයට තාම අසාධ්‍යයයි සභාපතිතුමා. ලොරියක් පෙරලිලා ගෝලයා බේරුණා. ඩ්‍රයිවර් තවම දැඩිසත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක තියෙන්නේ බ්‍රයිට්වේ එක ළඟින් උඩට නගින තැනමලු.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ වැයිහේනවත්ත නෙමෙයි වැවේවත්තනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සඟබෝවත්තට නගින තැන මේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඒ වැවේවත්ත.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වැයිහේනවත්ත නෙමෙයි එහෙමනම් මේ වැවේවත්ත.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මෙයා ගැන ග්‍රාම නිලධාරි දන්නෙත් නැහැ. වැවේවත්ත නම් හරි. ඊට වැඩිය හදන්න ඕන සභාපතිතුමා සඟබෝවත්තේ උඩ රාජාලගේ අක්කගේ ගෙවල් ළඟ කාණුව. ඊයේ, පෙරේදා ලොරියක් එතනට ගිහිල්ලා පෙරලිලා තිබුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා අපිට ඇවිල්ලා නැහැනේ මන්ත්‍රීතුමා. මේ ඉල්ලීමක් ආපු එකට මම සටහන් කරා තාක්ෂණ නිලධාරීගෙන් වාර්තාවක් ගන්න. තාක්ෂණ නිලධාරි නිර්දේශ කරලා තියෙනවා ඒක.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එදා ඔබතුමා ගිහින් සඟබෝවත්තේ කාණු හදන්න බැලුවනේ. පසුගිය කාලයේ සංවර්ධන වැඩසටහනකට ඔබතුමා යෝජනා ගත්තනේ. මේ ඒකට ආපු යෝජනාවක්ද කියලා මගෙනුත් ඇවිත් ඇහුවා. අන්න ඒවාට මේ මිනිස්සු යෝජනා දාලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** අර සංවර්ධන වැඩ සටහනකට යෝජනා ගත්තානේ. ඒ යෝජනා වලට දාලා තියෙනවා පාර හදලා කාණුවත් හදලා දෙන්න කියලා. ඒවා තාම නැද්ද කියලා අහනවා මගෙන්. වැයිහේනවත්ත කියලා එකක් මෙහේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පසුවට දාන්නම්.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** ඒකට ඔබතුමාට චෝදනාවක් ඒවී. අරහෙට ඇවිත් යෝජනා ගත්තා. නමුත් ඒවා කරේ නැහැ කොහේවත් තියෙන ඒවා කරනවා කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ යෝජනාව මම ඉල්ලා අස්කර ගන්නවා.

මට සමාවෙන්න ඕන මම මේ දුරකථන ඇමතුම ආව නිසා කියන්නේ ඒකත් එක්කම සම්බන්ධ කාරණයක්. ඇත්තටම අපි අපිට වාරණයක් දා ගමු. මම ඊළඟ සභාවේදී ඒක යෝජනාවක් විදියටම ගේනවා. අපි පිළිවෙලකට මේක කරන්න ඕන. මට වුණත් දුරකථනයට එන ඇමතුමට ප්‍රතිචාර නොදක්වලත් බැහැ. නමුත් ඔය ප්‍රශ්නය දිගටම එනවා. මමත් දුරකථනයට ප්‍රතිචාර දක්වනවා. මන්ත්‍රීවරුත් දුරකථනයට ප්‍රතිචාර දක්වනවා. දුරකථනයෙන් ඡායාරූපත් ගන්නවා. සභාවට කිසි අවධානයක් නැහැ. දැන් අපි බලන්න ගියා මාතලේ ප්‍රාදේශීය සභාව. ඒහේ වුණත් බොහොම පිළිවෙලකට ප්‍රාදේශීය සභාවේ ඒ කටයුතු ටික කරනවා. ඒ අය කරන නිසා අපි කරන්න කියනවා නෙමෙයි. ඒක නෙමෙයි මේ කියන්නේ. නමුත් ගන්න ඕන දේ අපි ගන්න ඕන තැනින් ගන්න ඕන. අපි සභාව වෙලාවේදී දුරකථන පාවිච්චි කරන්න හොඳ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දුරකථන ඇමතුමක් ආවම සභාපතිතුමාට කියලා එළියට ගිහින් ඒකට ප්‍රතිචාර දක්වන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම මොකක් හරි ක්‍රමවේදයක් හදන්න ඕන එක්කෝ. ඒක නීතියක් නෙමෙයි. අපි ඒක සාකච්ඡා කරලා කරමු. සම්පූර්ණයෙන්ම සුදු අඳින්න ඕන. මම ඒකට යෝජනාවක් ඊළඟ සභාවට ඉදිරිපත් කරන්නම්. අපි කරන වැරැද්දක් ඉතිං ඇත්තටම ඒක. අපි සභාව වෙලාවේදී හරි ඒක හරියට කරන්න ඕන.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

<u>ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමාගේ යෝජනා</u>

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික ලියනගේ මැතිතුමා ඃ- 11.** බල ප්‍රදේශයේ මාර්ගයන් දෙපස පෞද්ගලික මායිමෙන් ඔබ්බට මාර්ගය දෙපස සිටුවා ඇති විවිධ ගස් වර්ග ඉවත් කර මාර්ගයන් පිරිසිදු කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකෙදී මම බැලුවේ සභාපතිතුමා මෙහෙමයි. දැන් හැම මාර්ගයකම වගේ නිවසේ තාප්පය ඉදිකරලා ඉවර වෙලා මේ පැත්තෙන් මල් වැටක් හරි හිටවනවා. කරාපිටිය පන්විලදූවවත්තේ ඒ ගස් ඉන්දලා නිසා දැන් ඒ ගස්වල අත්තක් කපන්න දෙන්නේ නැහැ ඒ මිනිස්සු එක්ක ගැටුම් ඇති වෙනවා. දැන් ඒක නිසා තමයි මම මේ යෝජනාව කරේ. ඒක කරාපිටියේ විතරක් නෙමෙයි සියළුම මාර්ගවල තියෙනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මේක නිසා මාර්ග වලට ගස් වලින් අවහිර වෙනවා.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, බටුවන්තුඩාව පාරෙත් ඔය ප්‍රශ්නයම තියෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** කොයි පාරෙත් ඔය ප්‍රශ්නය තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ නිසා අපි බලය පවරමු එහෙම ඒවා කපලා ඉවත් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා. මන්ත්‍රීවරුත් ඒ එකඟතාවයට එන්න ඕන. ඒ පාරේ ගස් කැපුවට පස්සේ ඒ මිනිස්සු කියනවා මේ අපි මල් පූජකරන ගහ කියලා. ඒක කැපුවා කියලා කිවුවම ආයේම මන්ත්‍රීවරුම තමයි එන්නේ ඒක ගැන අහන්න. ඒක මම කරලා පෙන්නුවා. ඔබතුමන්ලට ඒක ගිහිල්ලා බලන්න පුළුවන්. අදටත් යුනිවර්සල් සිටි ඉඩමේ අය මට බනිනවා. මුළු ඉඩමේම ඒවා කැපුවා. හැම පාරකම 90% ක් කපලා තියෙනවා. තව පොඩි ඒවා ටිකක් ඉතුරු වෙලා තියෙනවා. බනින එකට කරන්න දෙයක් නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ ප්‍රශ්නයම මගේ ගෙවල් ඉස්සරහම තියෙනවා. එකක් දෙකක් කපලා බැහැ. අනිත් ඔක්කොමත් කපන්න ඕන. එතකොට හරි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ගයාන් මන්ත්‍රීතුමාගේ යෝජනාව ඇත්තටම නිවැරදි යෝජනාවක්. මොකද හේතුව මේ යෝජනාව මම මීට කලින් ඉදිරිපත් කළා නරාවල ඉඩමකට. එතනදීත් සිද්ධ වුණේ මේක. ප්‍රශ්නය තියෙන්නේ මෙහෙමයි. මිනිස්සු උද්‍යාන අලංකාරයට සහ පාර දෙපස අලංකාරයට ඒක කර ගත්තට කමක් නැහැ. ඒක හොඳයි. ප්‍රශ්නය තියෙන්නේ මාර්ගය අවහිර වන පරිදි ගස් සිටුවා ගන්න එකයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන වැරැද්ද තියෙන්නේ ඕක නෙමෙයි මන්ත්‍රීතුමා. කීයටවත් ඒ අය පිළිගන්නේ නැහැ ඕක වැරැද්දක් කියලා. අපි නිකං පරිසරයට මහා හානියක් කරනවා කියලා ප්‍රචාරය යන්නේ ගස් කපලා ඉවර වුණාම. ඇත්ත කතාව ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ යෝජනාව සංශෝධනය කරනවා මේක මුළු බලප්‍රදේශයටම කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ඇත්තටම ප්‍රායෝගිකව ගත්තොත් හොඳ යෝජනාවක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක අධීක්ෂණය කරන්න ඕන. ඒක කරන්න අමාරු ඇති අපේ තාක්ෂණ නිලධාරීන්ට. නමුත් චෝදනාවක් හරි, පැමිණිල්ලක් හරි ආවොත් ඒ ගැන බලන්න ඕන. පාර අවහිර නොවන පරිදි කර ගත්තට ඒක හානියක් නෙමෙයි. සමහර පාරවල් වල තියෙනවා විශාල ගස්. ඒ නිසා වාහනයක්වත් යන්න බැහැ වදිනවා. වාහන දෙකක් මාරු වෙන්න බැහැ, පාරවල් පටුයි. ඒ නිසා වාහන හීරෙනවා. අන්න එවැනි දේවල් ඉවත් කරන්න අනිවාර්යයෙන්ම කටයුතු කරන්න. එහෙම කරලා කරහම හුඟක් දේවල් වලට චෝදනා එන්නේ නැහැ. අනවශ්‍යයම පොඩිම ගස් තිබුණට කමක් නැහැ. හානිකර දේවල්, අවධානම් තියෙන දේවල් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙදී තමන්ගේ තාප්පය හදලා තාප්පය ඇතුලේ ඕන දෙයක් කර ගන්න පුළුවන්. තාප්පය හදලා ඔක්කොම කරලා පාරේ ගස් ඉන්දනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපේ වැඩ කරන කම්කරු මහත්වරුන්ට අපි ඒ සම්පූර්ණ බලය පවරමු. ඕනම ගහක් කපලා ඉවත් කරන්න බලය පවරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ කිසි ප්‍රශ්නයක් නැහැ. ඕක මෙහෙම කරන්න. දැන් මන්ත්‍රීවරුන්ට තමන්ගේ කොට්ඨාශ වලට වැඩ කරන්න කම්කරුවන්ව එවනවානේ. එදාට කරන්න. ඒ තියෙන ඒවා කපන්න. එතකොට ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම යවනවාද කොට්ඨාශවල වැඩ කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යවනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කුරුඳුවත්ත කොට්ඨාශයේ නම් දැක්කේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අන්න අරක කරලා දුන්නා. ඒක ඔබතුමා හින්දා කරලා දුන්නේ. අරකට ලියුමක් ඉල්ලලා තිබුණානේ නිවාස සංවර්ධන අධිකාරියට. ඒක මම කරලා දුන්නා.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ- 12.** කරාපිටිය සන්සයිඩ් ඉඩමේ මැද මාර්ගයේ ගැටළු විසඳීමටත්, දෙපස වවා ඇති ගස් කඩිනමින් ඉවත් කිරීමටත් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් මේ සන්සයිඩ් ඉඩමේ අඩි 15 ක් තියෙනවා මැද මාර්ගය. ඉතිං දැන් අඩි 06 යි පාරේ දැනට තියෙන්නේ. ඒකට තාප්පයක් බැඳලා ඒ කොටස අල්ලගෙන ඉවර වෙලා තියෙනවා. පාරෙන් අඩි 06 ක් 07 ක් අල්ලා ගෙන ඉවර වෙලා ඊට පස්සේ කොන්ක්‍රීට් ගැට්ටක් ඉදිකරලා, ඊට මෙහායින් මල් වැටකුත් හදලා තියෙනවා. වටේම මිනිස්සු ඒ ගැන කතා කරනවා. ඒ මනුස්සයා කුණුහරුප කියලා බනිනවා කියලා අනිත් අය ඉන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ඔබතුමා මැදිහත් වෙන්න එපා. ඔබතුමාගේ දවස තියෙනවානේ සේවකයන්ව යොදවන. එදාට මට මතක් කරන්න. එදාට තාක්ෂණ නිලධාරීට කියලා, එයාව යවලා ඒක ඉවරයක් කරලා දාමු.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** ඒක නෙමෙයි මේ කියන්නේ. පාරෙන් අඩි 06 ක් විතර අල්ලගෙන තාප්පයක් ඉදිකරලා තියෙනවා. දැන් මේක ගැන මම සභාවාර තුනකදී විතර කිවුවා මේකට නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. 2012 ඉඳන් හෝ 2017 ඉඳන් මේකට එනවා මෙහාට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මේ පැල්පොලවත්තේ එක ගැනද කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** නැහැ. මේ පැල්පොලවත්තේ එක නෙමෙයි. කරාපිටියේ සන්සයිඩ් ඉඩමේ එක.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** මෙතන ගස් ගැනනේ කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** ගස් ටිකේ ප්‍රශ්නය හරි දැනට. අපි ඒක ඉවත් කරමු. ඒ පළාතට යන්න බැහැ, බනිනවා. ඒකට තඩු දාන්න කියලා යෝජනා දෙකක් ගෙනාවා ඒකටයි, අර මෙහා පැත්තේ එකටයි දෙකටම. දැන් අර කොන්ක්‍රීට් ස්ලැබ් එකක් දැම්මේ, ඒ දෙකටම කඩිනමින් නීතිය ක්‍රියාත්මක කරන්න කියලා යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :- 13.** පැල්පොලවත්ත තුන්වන පටුමගේ නිවාස හිමියන්ට වාහන ගමන් කළ හැකි ආකාරයට මාර්ගය සකසා දීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා :-** මම හිතන්නේ මේක සභාපතිතුමත් ගිහින් බලලා තිබුණා. ඒක නිසා අපි යකඩ නෙට් එකක් දාලා හරි පැල්පොලවත්තේ එක කරමු. ඔබතුමා ගිහින් බලලා තිබුණා ඒක ඉස්සරම. එතන වාහනය හරවා ගන්න බැහැනේ. යකඩ නෙට් එකක් දාලා හරි අපි එතන වාහනයක් හරවා ගන්න පුළුවන් විදියට කටයුතු කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා :-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :- 14.** අප ප්‍රාදේශීය සභාවට භාණ්ඩ සහ සේවා මිලදී ගැනීමේදී සහ වාහන සහ වෙනත් උපකරණ අළුත්වැඩියා කටයුතු වලදී බල ප්‍රදේශය තුළ පිහිටා ඇති ආයතන සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා :-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා :-** මම මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ විශේෂයෙන්ම හේතුවක් ඇතුව. මේ යෝජනාව ගැන මම අදහස් දක්වන්න ඕන. බෝපෙ පෝද්දල බලප්‍රදේශයේ ඡන්ද දායකයන්ගේ ඡන්දයෙන් තමයි අපි මේ ප්‍රාදේශීය සභාවට පත් වෙන්නේ. එතකොට මම හිතන්නේ එහෙම පත්වුණාම අපේ යුතුකමක් තියෙනවා මේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ ඉන්න අයගේ ඉල්ලීම් වලට කන් දෙන්න. අපි නිකං කිවුවොත් එහෙම, අපේ සභාවේ වාහන ඉස්සරත් හැදුවේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ තිබෙන ගැරිජ් වල. දැන් අද ඒක මොනයම් හෝ හේතුවක් හින්දා පිටතට යන තත්ත්වයකට ඇවිල්ලා තියෙනවා. ඒක සම්පූර්ණයෙන්ම වැරදි මතයක් විදියට තමයි මම දකින්නේ. ඒ නිසා එම වාහන හදන ගැරිජ් වගේම අපිට භාණ්ඩ සපයන ආයතන මේ ප්‍රදේශය තුළ තිබෙනවා. මේ ප්‍රදේශයේ ගල් මෝල් තිබෙනවා. ගල්, වැලි සපයන තැන් තියෙනවා. භාණ්ඩ සපයන සියළුම දේවල් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ තිබෙනවා. ඒ ආයතන වලින් ඒ දේවල් ගන්නවා නම් හොඳයි කියන එක මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා. හේතුව එතකොට සභාව තුළ තිබෙන මුදල් සහා බලප්‍රදේශය ඇතුලේ තමයි සංසරණය වෙන්නේ. මේ මුදල් පිටතට යන්න හේතුවක් වෙන්නේ නැහැ. මෙහෙමයි. වෙනත් තැන් වලින් මේවා ගන්න කියලා අපිට කොමසාරිස්තුමා හරි, වෙන කවුරු හරි කියන්න පුළුවන්. නමුත් එතුමන්ලා ඒ ආයතනවල නම් කිවුවට අපේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුළ තමයි අපි මේ දේවල් දකින්නේ. අපිට තමයි ඊට පස්සේ මන්ත්‍රීවරු විදියට මේවායේ චෝදනාවල් එන්නේ. සභාපතිතුමාටත් ඒ චෝදනා එනවා. ඇයි ඔයගොල්ලන්ට මේ දේ වත් අපිට කරලා දෙන්න බැරි ඇයිද කියලා අහනවා. අද මේ කොරෝනා වසංගතයත් එක්ක කවුරුත් කැමතියි තමන්ගේ ආදායම වැඩි වෙනවා නම්. තමන්ට කීයක් හරි එනවා නම් කවුරුත් කැමතියිනේ. ඒ නිසා ප්‍රදේශයේ කෙනෙකුට කීයක් හරි යනවා නම් අපිත් කැමතියි. කොළඹ කම්පැනි වලට ගියා කියලා වැඩක් නැහැනේ. ඇත්ත කතාව ඒක.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා :-** සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනාවට මම සංශෝධනයක් ඉදිරිපත් කරනවා. දැන් අපිට මිලදී ගැනීමේ කටයුතු සහ වෙනත් කටයුතු වලදී රජයේ මුදල් වියදම් කිරීමේදී අපිට කොන්දේසි තියෙනවා. විශේෂයෙන්ම මුදල් රෙගුලාසි වල තියෙන නිර්ණායක වලට අනුව තමයි කටයුතු

කරන්න ඕන. ඒ කාරණයේදී අපි අවස්ථාවක් දෙන්න ඕන බලප්‍රදේශයේ ඉන්න ව්‍යාපාරිකයන්ට සහ සේවා සපයන අයට. ඒ අවස්ථාව දිය යුතුයි. ඒක හොඳයි. ඒ අවස්ථාව දෙන ගමන් ඒක තරඟකාරී මිල ගණන් වලට කරන කොට අපිට බැහැ ඒ අයට විශේෂ අවස්ථාවක් ලබා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** තරඟකාරී මිල ගණන් යටතේ නෙමෙයිනේ මේ වැඩේ යන්නේ. ඒකනේ වැඩේ තියෙන්නේ. ඔතනදී මෙහෙමයි. ඕක ගැන මම දැනුවත් කරන්න ඕන. මට විනාඩියක් දෙන්නකෝ. දැන් අපි වර්ෂ අවසානයේදී ලබන වර්ෂයට ලියාපදිංචි වෙන්න කියලා සැපයුම්කරුවන්ව කැඳවනවා. එතකොට අපිට ඒක සීමා වෙන්නේ නැහැ ප්‍රදේශයට කියන කාරණය. අපි මුළු ලංකාවටම තමයි දැන්වීම දාන්නේ. එතකොට අපිට ඒක නවත්වන්න වෙනවා. සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ දැන්වීම දැම්මට පස්සේ ලංකාව පුරාම ඒවා එනවා. ඒක නවත්වන්න බැහැ. ඒක එක කාරණයක්.

දෙවෙනි කාරණය තමයි සුගත් මන්ත්‍රීතුමා කතා කරන කාරණයේ එක වැරැද්දක් තියෙනවා. ඒකෙ හොඳකුත් තියෙනවා. තනිකරම ඒකාධිකාරයක් යන්නේ ඕකෙදී. අපේ වාහනය ගලවලා ගාණ කීය කිව්වත් අපි ඒක කරන්න ඕන. ඒකට බිල දෙන එක තමයි කරන්නේ. තේරුණාද, ඒකට තනි ඒකාධිකාරයක් යන්නේ. මම කියන්නේ අඩුම තරමේ ඒවායින් සමහර ඒවාට හරි නිදහස් වෙන්න දෙන්න ඕන. අනිත් එක අපිට ඉංජිනේරුවන්ට අභියෝග කරන්න බැහැ. අපිට ඉංජිනේරුවා කියනවා නම් මේක මෙහෙමයි කියලා අපිට ඊට එහා මොකක්ද කරන්න තියෙන මේවා එක. අපිට ඒක වළක්වන්න පුළුවන් කාරණය මොකක්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඔබතුමා කියපු කාරණයේ මෙහෙම එක තැනක් තියෙනවා. ආයතන සැපයුම්කරුවන් විදියට ලියාපදිංචි කරාට පස්සේ අපි ඒ ආයතන වලට අවස්ථාවක් දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙතන වෙන කාරණයක් මන්ත්‍රීතුමා තියෙන්නේ. මෙතන තියෙන්නේ මෙහෙමයි මන්ත්‍රීතුමා. දැන් ඔය කතා කරන්නේ එක සිද්ධියක් සම්බන්ධව. ඔබතුමා දන්නවාද ඒක. ඉලේපෙරුම ගැරේජ් එකට අපේ කැබ් රථය හදන්න දැම්මා. අපේ පරණ කැබ් එක ඒ. ඒක හදන්න දැම්මට පස්සේ ගලවලා ඉංජිනේරුවරයා ඇවිත් බලලා එයා තීරණයක් අරගෙන තියෙනවා. ඒකට පන් ලක්ෂ ගාණක ඇස්තමේන්තුවක් ඉලේපෙරුම ආයතනයෙන් දීලා තියෙන්නේ. ඉංජිනේරුවරයා තීරණය කරලා තියෙනවා මේකට ඉලේපෙරුම ආයතනයට ගලවපු එකටයි, හයිකරන එකටයි විතරක් ගෙවීම් කරන්න. ඒකෙ එංජිම කොළඹ එදිරිසිංහ බ්‍රදර්ස් ආයතනයට දාලා සම්පූර්ණයෙන්ම ඒ අයගෙන් අළුත්වැඩියාව කරලා ඒ ආයතනයේ වගකීමකුත් එක්ක මේක ගෙන්වා ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එයා ඉදිරිපත් කරන තර්කය මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එයා කියනවා ලංකාවෙන්ම එංජින් රෙපෙයාර් එකකට වගකීමක් දෙන්නේ එදිරිසිංහ බ්‍රදර්ස් ආයතනය කියලා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒක හරි. ඉලේපෙරුම ආයතනය කරන්නෙත් එතනින්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එංජිමේ රෙපෙයාර් එකක් නම් කරන්න තිබුණේ ඒ ආයතනයටම දාන්න තිබුණානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැනේ මන්ත්‍රීතුමා. ගැලෙව්වට පස්සෙනේ ඒක ගැන දන්නේ. මම දැන් ඉන්න ස්ථාවරය වෙනස්. ඇත්තටම මම කණගාටු වෙනවා. අපි හැමදේම දාන්නේ එහෙට. හැම රෙපෙයාර් එකක්ම කරන්න දාන්නේ ඒකට. නමුත් ඉතිං මේ වගේ දේවල් වලදී අපිත් අසරණ වෙනවානේ අබේසේකර මන්ත්‍රීතුමා. ඉංජිනියර් කෙනෙක් රිපෝට් එක දුන්නට පස්සේ අපිට ඒකට අභියෝග කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ආයතනය මේ වගකීම දරන්නේ නැද්ද, ඇයි දැන් ඕක එදිරිසිංහ එකටම ගෙනියන්න කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දකුණු පළාත් සභාවේම වාහන හදන්නේ ඉලේපෙරුම ගැරේජ් එකේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉලේපෙරුම ආයතනය මේ වගකීම දරන්නේ නැද්ද ඒ කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉංජිනේරුවරයා අභියෝග කරනවා මේ මුදලට වඩා අඩුවෙන් එදිරිසිංහ ආයතනයෙන් මේක කරනවා කියලා. එතනනේ ප්‍රශ්නය තියෙන්නේ. අපි එතකොට කොහොමද, මේක කරන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මේ අය යන්නෙත් එහෙට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙමනම් එදිරිසිංහ ගැරිජ් එකටයි, ඉලේපෙරුම ගැරිජ් එකටයි දෙකටම කියමු මිල ගණන් දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ආයතන දෙකටම මිල ගණන් දෙන්න කියන්න.

(ගරු මන්ත්‍රීනි ඒ.ආර්.එස්. සංජීවනී අතුකෝරල මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** වාහනය බලලා හදලා ඉවර කරන්න කීයක් යනවද කියලා බලන්න. ලංකාවේ ඔක්කොටම ඒකට මිල ගණන් දෙන්න කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ අළුත්වැඩියාව මේකයි කියලා ඉංජිනේරු මහතා නිර්දේශ කරනවාද, මේක මෙහෙමයි කියලා එයා කියනවාද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එයා එදිරිසිංහ ආයතනය කියලා නමටම දෙන්න කියලානේ මේ කියන්නේ. ඒක වැරදියි.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙම නම් කරලා ආයතනයක් කියන්න බැහැනේ. එහෙම කොහොමද කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් සභාපතිතුමා අපිට වැරදිච්ච තැන් තියෙනවානේ. අපිට මෙහෙම වාහන හදන්න දාලා වෙච්ච දේවල් තියෙනවානේ. මාස කීයක් අපිට පාඩු වුණාද බැකෝ එක හදන්න දාලා. එතකොට දැන් ඉලේපෙරුම එකට නෙමෙයි වෙන ඕන තැනකට මේක හදන්න දෙන්න. මම කිවුවේ වෙන ගැරිජ් එකකට දුන්නත් අපිට වගකීමක් දෙනවා. දැන් වෙනදාට මාතර ගිහින් තමයි ඕක කරගෙන එන්නේ. ලංකාවේම ඕවා හදන්න එදිරිසිංහ එක විතරක් නෙමෙයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මම උදාහරණයක් කියන්නම්. නිලධාරීන්ගේ මේ මත පිළිබඳව මගේ එකඟතාවයක් නැහැ. දැන් පේන්නේ නැද්ද ආදාහනාගාරය ගැන. ඒකෙ කතාව ගත්තම මහා අසික්කිත කතාවක් තියෙන්නේ. ඉතිං මම ඇත්තටම ඔය මට්ටමට එකඟ නැහැ. ඉතිං මෙතනදී බොහොම පැහැදිළිව දාලා තියෙනවා ඒක ගැන. රමේෂ් පතිරණ ඇමතිතුමත්, මට ඕකට කතා කරා. එතුමා කිවුවේ දිල්රුක් සභාපතිතුමා ඔය කුණුගොඩ ගාගන්න එපා කියලා. ඒ පාර කියාවි කිව්වා ඉංජිනේරු වාර්තා තියෙද්දී ඕතනට දැම්මට පස්සේ දිල්රුක් සභාපතිතුමා මේකටයි දැම්මේ කියලා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඉතිං අපිත් කියන්නේ සභාපතිතුමා ප්‍රදේශයේ තියෙන ගැරිජ් එකට දෙන්න කියලානේ.

(ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දන්නේ නැහැ, මොකක්ද කරන්නේ කියලා

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මෙහෙම තියෙන්නේ. ඒ අයත් දැන් වගකීමක් දෙනවානේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් මෙහේ වාහන හදන තැන් තියෙද්දී එදිරිසිංහ එකට දෙන්න ඕන නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට JCB එකට මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** JCB එකටත් ඒක කරන්න ඕන. දැන් JCB එක බලන්න කෙනෙක්ව ගෙන්වලා ඒක ගලවලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් JCB එකෙත් බෙයාරින් ගිහිල්ලා. ඒකෙත් දැන් එංජින් රෙපෙයාර් එකක් කරන්න තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමා අපිට විතරක් නෙමෙයිනේ JCB තියෙන්නේ. මෙහේ JCB තියෙන තව ආයතන තියෙනවා. ආයතන තුන, හතරක්ම තියෙනවා. හැබැයි ඉතිං මේ හැමතැනකම JCB දුවන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දුවනවානේ. අන්න ඒකනේ අපි කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපේ JCB එක හදාගෙන ආවාට හැමදාම එකතැන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ගමේ ඉන්න බාසුන්නැහේ කෙනෙක් ගෙනත් ඒක බලන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අපි මෙහෙම යෝජනාවක් ගේමු. බලප්‍රදේශයේ මේවා අරගෙන බලප්‍රදේශය තුලම හදන්න කියලා. සුගත් මන්ත්‍රීතුමා යෝජනාව ගෙනල්ලා තියෙන්නෙත් එහෙමනේ. ඒ විදියට එතනින් මිල ගණන් අරගෙන කරමු.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** තුන් දෙනෙක්ට පෙන්වලා මිල ගණන් තුනක් ගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මිල ගණන් දහයක් ගත්තත් කමක් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් අවුරුදු දෙකක් ඉවර වෙන කොටම JCB එක ආයේමත් එකතැන. වැඩක් නැහැනේ එහෙම. ගියපාර ලක්ෂ 14 ක් විතර ගියානේ හදන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් ඒ අය හදලා දෙන්නෙත් නැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි ඒ කාලය තුළ බැකෝ යන්ත්‍ර ගත්තේ කුලියට.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මම නම් දකින්නේ JCB එක මේවා කරලා එක්ස්කැවේටර් යන්ත්‍රයක් ගත්තොත් තමයි මෙහෙට වටින්නෙම JCB යන්ත්‍රයකටත් වඩා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ JCB එක හෙට දුන්නත් කාටහරි ඒක හොඳට වැඩ කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද ඕකට කරන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් ලක්ෂ 14 ක් විතර දීලා JCB එක හදවලා අවුරුදු දෙකක් ඉවර වෙනකොට ඒක ආයේමත් කැඩෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමනි, සභාවට මම මේ කියන්නේ. අපිට කවුරුවත් ඇවිල්ලා කරලා දෙන්නේ නැහැනේ. දැන් ඔය ඉංජිනියර්ස්ලා ඇවිල්ලා අපිට කරලා දෙන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කියන්න බැහැ සුගත් මන්ත්‍රීතුමා. ඒවා අතහැරලා කරන්න පුළුවන්ද, එහෙමනම් ඉතිං මේක මරු වැඩක්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ඕවා අතහැරියොත්නේ ප්‍රශ්නයක් ඇති වෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අතහැරියොත් කියන්නේ මොකක්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් අපි ඉංජිනේරුවා කියන එකම කරන්න ඕන කියලා එකක් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කවුද එතකොට අන්තිමට බිල අත්සන් කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකට අපිට නීත්‍යානුකූල පදනමක් තියෙන්න ඕන. ඒකටනේ වගකියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නීත්‍යානුකූල පදනම වෙනයි. සාමාන්‍ය විදියට මිල ගණන් අරගෙන කරන්න ඉතිං.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දහ දෙනෙක් ඉන්නවා නම් ඒ දහදෙනාටම දාලා මිල ගණන් ගන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතකොට ඒක ඉංජිනේරුවාට පෙන්වන්න.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එතකොට එයා බලලා කියාවි මේක කරන්න ඕන විදිය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් මේකෙ වෙච්ච වැරැද්දක් තියෙනවානේ. දැන් ඒක මෙහෙමයි. ඔබතුමා හොඳටම දන්නවා ගලවපු වාහනයක් හදන්න තව කාටවත් දෙනවද, දැන් මේකෙ ඒකාධිකාරයක් තියෙන්නේ. දැන් මේකට ලක්ෂ 10 ක් කිව්වත් අපි කරන්න ඕන ඔය කියන විදියට. මම උදාහරණයකට ලක්ෂ 15 යි කිව්වත් වාහනය ගැලෙව්වොත් කරන්න ඕන ඔය කියන විදියට.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙම කරන්න පුළුවන්නේ. දැන් ඉලේපෙරුම ආයතනයෙන් කියනවානේ එංජින් ඕවරෝල් එකක් කරන්න ඕන කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක මට කියන්නකෝ. තව දෙයක් කිව්වා. මේකත් අහන්නකෝ. ඉංජිනේරුවරයා එක්ක මම ඕක ගැන දිගින් දිගටම කතා කරා. එතුමා ක්‍රම දෙකක් කියනවා. එක්කෝ මේක ගලවන්න යන වියදමයි, හයිකරන්න යන වියදමයි ගෙවලා ඕක එදිරිසිංහ ආයතනයට හදන්න ගෙනියන්න කියනවා. එහෙම නැත්නම් ඒ අයටම ඕක එදිරිසිංහ ආයතනයට ගෙනියලා එතනින් ඒක කරගෙන ඒ බිලයි, ප්‍රවාහනයට යන මුදලටයි සාධාරණීකරණය කරලා ගෙවන්නලු. ඕක තමයි එතුමා කරන්න කියන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා මෙහෙමයි. දැන් අපි වාහනය මෙතන ගලවලානේ තියෙන්නේ. දැන් ගලවපු වාහනය හයිකරන්න ආපහු ගෙවන්න වෙනවා. වාහනය හයිකර ගෙන එදිරිසිංහ එකට අරන් යනවා. එදිරිසිංහ එකට ගෙනිහිල්ලා ආයෙමත් වාහනය ගලවනවා. එයාලා දන්නේ නැහැනේ වෙච්ච දේ. එයාලා වාහනය ගලවලා බලලා ඉවර වෙලා කියනවා මෙච්චරයි ගාණ කියලා. එයාලා කියනවා එතකොට එංජින් ඕවරෝල් එකක් කරන්න තියෙනවා කියලා. මේ ගාණ යනවා කියලා කියනවා එතකොට. ඊට පස්සේ ඒ ගාණ වැඩි වුණාම ආයේමත් වාහනය හයි කරනවා. එදිරිසිංහලා විතරක් නෙමෙයි ඕක ලංකාවේ කරන්නේ. ටාටාලා කරනවා. අශෝක් ලේලන්ඩ් කරනවා. කිරිබත්ගොඩ ප්‍රදීප් මෝටර්ස් ආයතනයෙත් කරනවා. එදිරිසිංහලත් කරනවා. හොඳම විදියට අඩුවට කරන තැන් තියෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** මාතරත් කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මාතර ඇත්තටම හොඳ නැහැ. මාතර හොඳ නැහැ කියලා හැමතැනම ගැරිජ් වලින් කියනවා. නමුත් හොඳම තත්ත්වයෙන් කරනවා කිරිබත්ගොඩ ප්‍රදීප් මෝටර්ස් ආයතනය. එතන මිල ගොඩක් අඩුයි. එදිරිසිංහලාගේ වගේ භාගයක මුදලක් යන්නේ. මම කියන්නේ දැන් එංජින් ඕවරෝල් එකක් කරන්න මෙයාලා වාහනය ගලවලානේ තියෙන්නේ. එයාලගෙන් ඉල්ල ගන්න එංජින් එක. එංජිමේ ඕවරෝල් එක කරලා අපි ගෙනත් දෙන්නම් කියන්න. මේකෙ බුෂ් ගහන්නද, පිස්ටන් ගහන්නද, රින්ග්ස් ගහන්නද තියෙන්නේ. ඕනම දේවල් ටික අපි කරලා ගෙනත් දෙන්නම් කියන්න. ඒක අරගෙන ගිහිල්ලා එදිරිසිංහ එකෙනුයි, ටාටාලාගෙනුයි, ප්‍රදීප්ලාගෙනුයි මිල ගණන් තුනක් අරගෙන අඩුම එකට භාර දීලා හදලා ඉවර වෙලා මෙයාලට ගෙනත් දීලා කියන්න අපිට හයි කරලා දෙන්න කියලා. එතකොට වැඩේ ඉවරයි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** එතකොට ඒ අය වගකීම ගන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** වගකීම එයාලා ගන්නේ නැහැ. වගකීම ගන්නවා ඒක හදපු අය. ඒ අලුත්වැඩියාව කරපු ආයතනය වගකීම ගන්නවා. මගේ වාහනවල මම කරන්නේ ප්‍රදීප් මෝටර්ස් ආයතනයෙන්. ඒ අය හොඳටම හොඳයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පුද්ගලිකව මගේ වාහනයක නම් ඕක කරන්න පුළුවන්. මේක රජයේ වාහනයක්. එංජිම ගලවා ගෙන ගිහිල්ලා එහෙම මිල ගණන් ගන්නේ කොහොමද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඕකට වගකිව යුතු නිලධාරියා ඉංජිනේරුවානේ. දැන් එතකොට එතුමාට තමයි මේකෙ වගකීම තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා එකඟම නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපිට ඒකට අභියෝග කරන්න ක්‍රමයක් නැහැ. ඒක ඇත්ත. නමුත් රජයේ මුදල් රෙගුලාසි අනුව වාහන නඩත්තුවලදී සහ අළුත්වැඩියාවලදී කියන්නේ වාහනය ගිහින් ගලවලා ඉංජිනේරුවා පරීක්ෂා කරලා කියන්න ඕන ඒ මිල ගණන් සාධාරණයි කියලා. ඒක තමයි ක්‍රමවේදය. එතකොට ඒ ඉංජිනේරුවාගේ සහතිකය මත තමයි ඕක කරන්නේ. අපිට පුළුවන් විශ්වාසවන්ත, හොඳට දන්න කියන ආයතනයකින් ඒක කර ගන්න. ඒක ඉංජිනේරුවාට සහතික කරලා කියන්න බැහැ. ප්‍රශ්නය තියෙන්නේ එක තැනක. එතුමා කොහොමද මේක එදිරිසිංහ ආයතනය ලවා කර ගන්න කියලා කියන්නේ. එහෙමනම් ඒ ආයතනයෙන් මිල ගණන් කැඳවා ගන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි එතුමා මෙහෙම කතාවක් කිව්වා. මම දන්නේ නැහැ ඒක ඇත්තද, බොරුද කියලා. ලංකාවේ එංජින් ඕවරෝල් එකකට වගකීමක් දෙන්නේ එදිරිසිංහ ආයතනය විතරයි කියලා කිව්වා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේ ආයතනයෙන් මිල ගණන් ගෙන්වා ගන්නකෝ. දැන් ඉලේපෙරුම ආයතනයෙන් වගකීමක් ගන්න බැරිද, වගකීමක් ඒ අය දෙනවා නම් මොකක්ද තියෙන ප්‍රශ්නය. අපේ ඉංජිනේරුවරයාට බලන්න තියෙන්නේ මේ ගාණට මිල ගණන් සාධාරණද කියන එක. ඉදිරිපත් කරන මිල ගණන් අසාධාරණ නම් ඒ අය ඒක කියන්න ඕන. ගරු සභාපතිතුමනි, ඒ ඉංජිනේරුවා බලන්න ඕන ඉදිරිපත් කරන මිල ගණන් අසාධාරණද කියලා. ඒ මිල ගණන් ආසාධාරණ නම් එතුමා ඒවා සාධාරණ මිල ගණන් විදියට සංශෝධනය කරන්න ඕන. මිල ගණන් සංශෝධනය කරලා එයා ඒක ඉදිරිපත් කරන්න ඕන

මේ ගාණට ඒක කරන්න පුළුවන් කියලා. එහෙම නැතුව එයාට කියන්න බැහැ අහවල් තැනින් කර ගන්න කියලා. අන්න එතනයි අපිට ගැටළුව තියෙන්නේ. මේ මිල ගණන් අසාධාරණ නම් තව තැනකින් මිල ගණන් ගන්න පුළුවන්. ඊට පස්සේ වගකීමේ නම් ප්‍රශ්නය තියෙන්නේ ඉලේපෙරුම ආයතනයෙන් අපිට වගකීම ගන්න පුළුවන්නේ. ඉලේපෙරුම ආයතනයෙන් කිවුවොත් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට වගකීම දෙනවා කියලා මොකද කරන්නේ. එයාලා වගකීම දෙනවා නම් මොකද කරන්නේ. දැන් එයාලගෙන් අහලා තියෙනවද වගකීමක් තියෙනවද කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. ඕකට ඔහොම කියමුකෝ. දැන් JCB එකට මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගලවලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගලවලා බලලා ඔක්කොම කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔය හැමෝටම කියන්න ඇවිත් බලලා මිල ගණන් දෙන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඇවිල්ලා බලලා මිල ගණන් දෙන්න කියන්න. අඩුම එකට අපි ඕක හදන්න දෙමු. ගරු සභාපතිතුමා JCB එකටත් ඉංජිනේරුවා ලවා අළුත්වැඩියා කරන්න තියෙන්නේ මොනවද කියලා නිර්දේශ ගන්න. එහෙම නිර්දේශ අරගෙන අන්න ඒකටත් මිල ගණන් කැඳවන්න. එතකොට ප්‍රශ්නයක් නැහැ. පස්සේ ඒවා වෙනස් කරන්න එපා. ඔය ප්‍රශ්නය හැමදාම එනවා. අපි JCB එකත් හදනවා. පිට වාහනත් කුලියට ගන්නවා. අන්තිමට දෙකටම වියදම් කරලානේ. දැන් මේකෙ තේරුමක් නැහැනේ. එංජිම ගලවලා තියෙනවා නම් මිල ගණන් ගන්න පුළුවන්නේ සභාපතිතුමා. JCB එක ගලවලානම් තියෙන්නේ, මිල ගණන් කැඳවන්න පුළුවන්නේ. විවෘත මිල ගණන් කැඳවන්න ඒකට. එතකොට අඩුම එකට යන්න පුළුවන්. මේ මිල ගණන් ඉංජිනේරුවාට ඉදිරිපත් කරලා සහතික කර ගන්න මේ අඩුම මිල ගණන් කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා, ගැලෙව්වට පස්සේ තමයි කියන්නේ අර කෑල්ල නැහැ, මේක අඩුයි කියලා. ඒ නිසා හරියට මිල ගණන් ගන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** දැන් JCB එක ගලවලා කිවුවානේ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** JCB එක බලලා මිල ගණන් දෙන්න කියන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒකට එදිරිසිංහ ආයතනයටත් මිල ගණන් දෙන්න කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** JCB එක ගලවලා තියෙනවා නම් කාට වුණත් ඇවිත් බලන්න පුළුවන්නේ. JCB එක ගලවලා තියෙනවා නම් බලන්න පුළුවන්නේ. ඒ අයට ඇවිත් බලලා මිල ගණන් දෙන්න කියන්න. ඒක ලේසියිනේ. ඒ විදියට විවෘත මිල ගණන් කැඳවලා කරමු. නැත්නම් මේ වැඩේ කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකේ වැඩේ තියෙන්නේ මෙහෙමයි. කම්පැනි එකකට දැම්මට පස්සේ ඔක්කොම බලනවා ඒ මැෂින් වලට සවිකරලා. නොසෙල් එකද, මේවා එකද කියලා ඔක්කොම බලනවා. මෙහෙට කෙනෙක් බලන්න ආවට ඒ විදියට බලන්න හැකියාවක් නැහැ. උඩින් බලලා කියනවා. ඊට පස්සේ වාහනය හදන්න ගියාට පස්සේ කියනවා අරක ගිහිල්ලා, මේක ගිහිල්ලා කියලා. එතකොට තව කෑලි දම්මවනවා. ඇත්ත කතාව ඒක.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඔබතුමාට මතක ඇති ඔබතුමන්ලා අපි ඕකට හැප්පුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොම හරි මෙහෙම දෙයක් තියෙනවා. මම ඒක දන්නවා. මගේ ඩිලිවරි වාහනයක් අවුරුදු හයකට විතර කලින් ගැලෙව්වා කළු මල්ලි කියලා කෙනෙක්. එයාගේ ත්‍රීවිල් එකෙන් ඇවිත් මමත් එක්කම ඒක අරන් ගියා එදිරිසිංහ ආයතනයට. උදේ පාන්දර ගිහිල්ලා අංකයක් අරගෙන ඉඳලා හවස් වෙන කොට එන්ජිමේ බෝර් එක කරලා දෙනවා. උදේ ඉඳන් ඉන්න ඕන ඉතිං. මම මේ කියන්නේ අවුරුදු ගාණකට කලින් එකක්. ඉතිං එතකොට ඒ අය හදන්න දැම්මට පස්සේ කියනවා මෙන්න මේ අඩුපාඩුව තියෙනවා කියලා. ඒ ටික කරනවා, නැත්නම් අරගෙන එනවා. ඒ අයගේ මැෂින් වලට සවිකරලා තියෙන අඩුපාඩු ටික කියනවා. හැබැයි ඉතිං එදිරිසිංහ ආයතනය කියන්නේ සාමාන්‍යයෙන් හොඳ ආයතනයක්. දැන් අවුරුදු දහයකට විතර කලින් එකක් මම මේ කිවුවේ. නමුත් මේක නම් කරපු එකේ ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ලංකාවේ ඔච්චරමද තියෙන්නේ. ඒක වෙන්නේ නැහැනේ. දැන් සභාපතිතුමා JCB එක සෙනොක් එකට දානකොට ඔබතුමන්ලා අපි හැප්පුණානේ. JCB එක සෙනොක් එකට හදන්න දානකොට කිවුවා මේ බැකෝ එකේ තවත් අරවා මේවා හදන්න තියන්න එපා කියලා. අරවා මේවා නැහැ කියන්න එපා, මේකෙ සියළු අඩුපාඩු හදන්න කියලා කිවුවේ. මොකක්ද දැන් වුණේ අන්තිමට. මාස ගාණක් තියාගෙන ඉඳලා ඇවිල්ලා ඉවර වෙලා වැඩ කරන්න බැහැ. දැන් අනිත් පැත්තෙන් තියෙන කතාව ගන්නකෝ. මේ පැතිවල තව බැකෝ තියෙනවානේ. මේ මිනිස්සු ඒවාගෙන් වැඩ කරනවානේ, ඒවා දුවනවානේ. අනිත් එක අපිට මීට කලින් කරපු හැම ගැරිජ් එකකින්ම වගකීමක් දීලා තියෙනවා. මේ වගකීමට හරස් වෙන දෙයක් සිදු වෙලා නැහැනේ කවදාවත්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලක්ෂ 05 ක් වියදම් කරාට අවුරුද්දක වගකීමක් තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වාහනය පාවිච්චි කරන රියදුරුගේ අතේ වැඩේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකටත් උත්තර දෙන්නකෝ. මම දැන් මේ ප්‍රශ්නයට තුන් පාරක් කතා කරා. ඉංජිනේරුතුමා කිසිසේත්ම එකඟ නැහැ. එයාගේ වාර්තාව අන්තිමට දාන්න ඕනනේ. ඒක නැතුව ගෙවන්නේ කොහොමද, එතකොට කොහොමද ගෙවන්නේ කියලා කියන්න. මට ඒකට උත්තරයක් දෙන්න. නැත්නම් කට්ටියත් එක්ක ගිහින් ඉංජිනේරුවරයාට කතා කරන්න. මට ඒක ලොකු ප්‍රශ්නයක් නැහැ. ඉංජිනේරුතුමා එක්ක ඔබතුමා කතා කරන්නකෝ මොකක්ද මේ කරන වැඩේ කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි දැන් විවෘත මිල ගණන් කැඳවලා ඉංජිනේරුවරයාගෙන් සහතික කර ගමු. මිල ගණන් එයා සහතික කරන්න ඕන. එයාට අළුත්වැඩියාව කරන්න බැහැ කියලා කියන්න බැහැ. අපි ආයතන වලින් මිල ගණන් කැඳවලා ඒක ඉංජිනේරුවරයාට ඉදිරිපත් කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** වාහනය ගලවලා ඒක ගැරිජ් එකේ තියෙන කොට කොහොමද මිල ගණන් කැඳවන්නේ. ප්‍රශ්නය විසඳලා ඉමුකෝ ඉස්සෙල්ලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉංජිනේරුතුමා කියන්නේ වගකීමක් නැහැ කියලානේ. වගකීම් සහතිකයක් ඒ අය දෙනවානම් හරිනේ. ඒ මිල ගණන් වල ප්‍රශ්නයක් තියෙනවද කියලා බලලා තව අඩුවෙන්න ඕන නම් කියන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ දෙකම ගැන එතුමා කියන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක බරපතල ප්‍රශ්නයක්නේ. එහෙමනම් සංසන්දනය කරලා බලන්න ඕන එංජිම ගලවන්න කීයක් යනවද කියලා ඉස්සෙල්ලා. ඊට පස්සේ ආයේමත් අරහෙන් ගෙන්වලා බලන්න ඕන. ඕවාට අපිට තමයි අන්තිමට උත්තර දෙන්න වෙන්නේ. නීත්‍යානුකූලව ඒක කරන්න. අපි වැඩි ලාභයට කරන්න ගිහිල්ලා අන්තිමට අමතර ප්‍රශ්නයක් හැදෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් අපි ඕක පිළිගන්නවා. උදාහරණයක් මම දැන් මතක් කරන්නම්. අපේ කැබ් එකේ ටයිමින් බෙල්ට් එක දාන්න ගිහිල්ලා අපි ඒක මිට්ෂුබිෂි කම්පැනියට හදන්න දාන්න හැදුවම ඉංජිනේරුතුමා කිවුවා නෑ මේක මිට්ෂුබිෂි කම්පැනියට නෙමෙයි මාතර සමරසිංහ මෝටර්ස් ආයතනයට හදන්න දාන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සමරසිංහ මෝටර්ස් ආයතනය හොඳයි ඇත්තටම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** දැන් සභාපතිතුමා අපිට මෙහෙම කරන්න බැරිද, දැන් අපි ඉලේපෙරුම ගැරිජ් එක ගැනනේ කතා වුණේ. කලින් කලංසූරිය ගැරිජ් එක ගැන හරි කතා වුණා කියමුකෝ. අපේ JCB එක දැන් කැඩිලා තියෙන්නේ. අපේ JCB එක හරි, කැබ් එක හරි කැඩිලා තියෙනවා නම් ඒක ගිහින් භාර දෙනවා හදන්න. මෙන්න අපේ වාහනයේ ඒක කැඩිලා තියෙන්නේ, මේක ගලවලා බලලා හදලා දෙන්න කීයක් ගන්නවද කියලා අපි අහනවා. වාහනය ගලවලා කෑලි වලට යන ගණන් නෙමෙයි බලන්නේ. වැඩේ සම්පූර්ණයෙන් ඉවර කරන්න ගාණ බලන්නේ. එහෙමනේ අපි හදන්න දෙන්න ඕන. එතකොට ඒ අයට පුළුවන් විශේෂඥයෝ දම්මවලා මේකෙ අඩුපාඩුවක් තියෙනවා නම් ඒක හරියට හරි ගස්සවන්න. ඒක හරියට හරි ගස්සවලා දීලා අපිට වගකීමක් දෙන්න ඕන. කොච්චර කාලයක් වගකීම දෙන්න පුළුවන්ද කියලා කියන්න ඕන. එතකොට අවුලක් වෙන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට වාහනය තුන්පලකට ගෙනියන්න ඕන ගලව ගලවා බලන්න. ගෙනියලා තැනින් තැනට දාලා ගලවලා බලන්න ඕන. මේ මොකක්ද කියන්නේ කියලා මට තේරෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** තුන්පලකට ගෙනියනවා නෙමෙයි. මිල ගණන් ගන්න තුන් දෙනෙක්ගෙන්. අඩුම එකට දෙනවා.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** ඉලේපෙරුම ගැරීජ් එකේ තියෙන වාහනය තව දෙන්නෙක්ට ගිහින් බලන්න කියන්න ඕන. නමුත් එහෙම බලන්න යන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒ වාහනය ගැන නෙමෙයි අපි කියන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක තමයි මමත් කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකට තීන්දුවක් ගන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා. දැන් අද වෙන කොට වාහන වල අඩුපාඩු හොයන්න ස්කෑන් යන්ත්‍ර තියෙනවා. ඒකට දාලා අඩුපාඩු බලන්න පුළුවන්. එහෙම ස්කෑන් යන්ත්‍රයක් තියෙන කෙනෙක්ට දුන්නම හරි. මම කියන්නේ මේක වැරදි ක්‍රමයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං මට කියන්නකෝ බෝපෙ පෝද්දල එහෙම තියෙන එකක්. මේ වගේ පරිගණකගත කරලා ඒ විදියට බලන්න පුළුවන් එහෙම තැනක් බෝපෙ පෝද්දල තියෙනවා නම් කියන්නකෝ.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ඃ-** බුද්ධික ළඟ ඔක්කොම තියෙනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** නැතුව නෙමෙයිනේ. අපි ගැරීජ් එක සමඟත් සාකච්ඡා කරලා ඒ තීන්දුවට එන්න තමයි බැලුවේ. අපි ඒ ඉංජිනේරුවරයාව හම්බවෙන්න යන්න තමයි ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට තියෙන ප්‍රශ්නය මෙච්චරයි. ඕක කරලා බිල ගෙවන්න අන්තිමට මගේ පිටටමනේ එන්නේ. නැත්නම් මට ප්‍රශ්නයක් නැහැ. ඔයගොල්ලෝ ඕන තීන්දුවක් ගන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මටත් මේ සුගත් මන්ත්‍රීතුමාගේ යෝජනාවට එකතු කරන්න දෙයක් තියෙනවා. භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී සේවා ගැනනේ කතා කරේ වාහන සම්බන්ධව. භාණ්ඩ මිලදී ගැනීමේදීත් ප්‍රශ්නයක් තියෙනවා. දැන් ලයිට් සෙට් වලට ඇණවුම මාතරටනේ දීලා තිබුණේ. බලන්න ඒ ලයිට් සෙට් ටික පරීක්ෂා කරලා. ඒ පොට කපපු තැන මළකඩ කාලා තියෙන්නේ. බාර් එක නවපු තැන පේන්ට් එක ගිහිල්ලා එතන මළකඩ කාලා. අළුත් ලයිට් සෙට් ටික ගැන මේ කියන්නේ. දැන් හයිකරන්නෙත් මළකඩ කාපු ලයිට් සෙට් ටිකක්. ඒක නිසා ඒ පිළිබඳව ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා මේ පිළිබඳවත් ටිකක් හොයලා බලන්න. මේ යෝජනාවත් එක්ක මම ඒක ගැන එකතු කරන්න කැමතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒවා බලලා මාරු කරන්න කියලා කියන්නම්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා ලයිට් වල ප්‍රශ්නය තියෙන්නේ මෙහෙමයි. අපිට ඉදිරිපත් කරන්නේ සාම්පල් එකක්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රධාන ප්‍රශ්නය විසඳලා ඕන තීන්දුවක් ගන්න. වාහන දෙක හදන වැඩේ ගැන බලන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කැබ් එකේ වැඩේදී ඉංජිනේරුවරයාගේ නිර්දේශයට පිටින් අපිට අභියෝග කරන්න බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එංජින් දෙකක් හදන්න ගෙනියන්න ඕනනේ. මේ දෙකම එදිරිසිංහ මෝටර්ස් එකට ගෙනියමු. දැන් එංජින් දෙකක වැඩ තියෙනවානේ. JCB එකේ එංජිම ගලවපු බාස් කියලා තියෙන්නෙත් එදිරිසිංහ මෝටර්ස් ආයතනයට ඒක හදන්න දාන්න කියලා. දැන් ඔය එංජින් දෙකම හදන්න ගෙනියන්න ඕනනේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉංජිනේරුවාගේ නිර්දේශ අරගෙන යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නේ එහෙමනම් ඒ එංජින් දෙකම හදන්න දාමු.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉංජිනේරුවරයා නිර්දේශ කරනවා නම් එතන හොඳයි කියලා ඒක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** බාස් කියන්නෙත් ඒක එහෙට දාන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට ඉංජිනේරුවරයාගේ නිර්දේශය අරගෙන යවන්න. එයාගේ තීන්දුව අරගෙන යවන්න. එතකොට හරිනේ. අපි මේ කොහේවත් තියෙන කුණුගොඩවල් ඇගේ ගා ගත්තම වෙන්නේ අපිට ඒවාට උත්තර බදින්න වෙනවා. මිල ගණන් කැඳවන මොකක් හරි සාධාරණ ක්‍රමවේදයක් තියෙනවානේ. අන්න ඒ නීතිමය ක්‍රමවේදයට අනුව ඒ වැඩේ කරලා අදාළ නිර්දේශ අරගෙන කරහම මේවා අපේ ඇගේ ගෑ වෙන්නේ නැහැ. නැත්නම් ඕවාට අපිට වගකියන්න වෙනවා. අපිට තියෙන ක්‍රමවේදයට පිටින් වැඩ කරන්න බැහැ. එහෙම කරන්න ඉංජිනේරුවරයාගෙන් නිර්දේශය ගන්න. ඒකට නිර්දේශ අරගෙන යොමු කරන්න. එතකොට ප්‍රශ්නය ඉවරයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එකකට ඉංජිනේරුවරයාගේ නිර්දේශය දීලා තියෙනවා එදිරිසිංහ එකට දාන්න කියලා. නැහැ, දෙකටම නිර්දේශය දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එහෙමනම් ඉංජිනේරුවරයාගේ නිර්දේශයේ විදියට වැඩ කරන්න. අපිට ඊට පිටින් වැඩ කරන්න බැහැනේ. අපි ක්‍රමවේදයක් හදාගමු මේකට සාකච්ඡා කරලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒකට මොකක්ද කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඉංජිනේරුවරයාගේ නිර්දේශය අනුව කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඉතිං ඕකට මොකක් හරි ක්‍රමවේදයක් හැදෙන්න ඕන. ඒ ගැරිජ් එකට දාලා වාහනය ගලවනවා. එතන ප්‍රශ්නයක් තියෙනවා. නැත්තේ නැහැ. එහෙම දාලා ගලවන්න කලින් එක්කෝ කියන්න ඕන මේක එදිරිසිංහ මෝටර්ස් එකට දාන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි හදන්න දාන්න ඉස්සෙල්ලා නිර්දේශය ගත්තානම් ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දන්නේ නැහැනේ මොකක්ද කියලා. හදන්න දැම්මට පස්සෙ දන්නේ. එච්චර එකක් කියලා දන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගලවන්න කලින් කිව්වා නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි මෙහෙම කරමු. ඒක හොඳ නැද්ද සුගත් මන්ත්‍රීතුමා. අපි අරහෙට දාලා මිල ගණනක් ගමු. එතකොට අපිට බලන්න පුළුවන් ඒ මිල ගණන ආවාට පස්සේ. මෙයාගේ මිල ගණන අපිට දීලා තියෙනවානේ. ඉලේපෙරුම මහත්තයා ඒ මිල ගණන දීලා තියෙනවානේ. එහේ මිල ගණන එතකොට අපිට බලන්න පුළුවන්නේ. ඒක අරකට වඩා වැඩිනම් දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ඒ විදියට යමු. ඒක අවුලක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම කරමු. මොකද මෙතන දැන් එන්ජින් දෙකක් ගෙනියන්න ඕනනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඕක ගැන සභාපතිතුමා ඇත්තටම දැන් අපි ගිහින් ඉලේපෙරුම ගැරිජ් එකත් එක්ක කතා කරන්න හදන්නේ. මේක හරියට කර ගන්න ඕන අපිත් සවුත්තු නොවෙන්න. එයත් සවුත්තු නොවෙන්න මේ වැඩේ අපිට කරලා දෙන්න පුළුවන්ද කියලා බලන්න ඕන. ඒකට හේතුව මොකක්ද කියලා දන්නවාද, මේක අපේ ඕනකමට දෙන්න හදනවා නෙමෙයි. එතුමත් අපෙන් ඉල්ලීමක් කරා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතුමා මටත් කතා කරා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි ඒවාටත් සානුකම්පිත වෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, තව එකක් තියෙනවා. ආණ්ඩුකාරතුමාගේ චක්‍රලේඛනයක් තියෙනවාද වාහනයක් ගැලෙව්වොත් ඒක එම ගැරිජ් එකේම හදන්න ඕන කියලා. එහෙම එකක් ඇවිල්ලා තියෙනවාද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අරහෙට මිල ගණන් දෙන්න කියලා කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි ඉස්සෙල්ලා එහෙට දාලා මිල ගණන් ගමු. ඒක අරන් ගිහින් මිල ගණන් ගමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 15.** ඇලබඩ, රුහුණුවත්ත පන්සල දෙසට ඇති හරස් මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 16.** ඇලබඩ, රුහුණුවත්ත, දයානන්ද මහතාගේ නිවස අසළින් ඇති මාර්ගය කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 17.** ඇලබඩ, කොස්ගහවත්ත, ඩබ්.එම්.චන්ද්‍රරත්න මහතාගේ නිවස අසළින් ඇති මාර්ගයේ කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 18.** ගිංතොට, පියදිගම, වටරක බටහිර, ඩබ්.පී. මන්දරා මහත්මියගේ නිවස අසළින් ඇති මාර්ගයේ කාණුව කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 19.** හල්ලොලුව වත්ත අතුරු මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ- 20.** බෝපෙ සාරංග කඩේ අසළ සිට සුනිල් කළුආරච්චි මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-21.** වැලිපිටිමෝදර සහ කුරුඳුවත්ත යන ග්‍රාම සේවා වසම් දෙක මායිම් වන ප්‍රධාන කාණුව නිසි ලෙස ප්‍රතිසංස්කරණය කරන ලෙස යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ කියන්නේ බැකෝ යන්ත්‍රයක් හරි, එක්ස්කැවේටර් යන්ත්‍රයක් හරි දාලා සංවර්ධනය කරන්න. ඒකටයි යෝජනා කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු මන්ත්‍රී ඩබ්.පී. චමින්ද මැතිතුමාගේ යෝජනා</u>

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** චමින්ද මන්ත්‍රීතුමා සභා රැස්වීමට පැමිණෙනවා කියලා දැනුම් දුන්නා. ඒ අතරේදී එතුමා නැති නිසා මම ඒ යෝජනාව ඉදිරිපත් කරන්නම්.

**22.** අප ප්‍රාදේශීය සභාව සතු පෝද්දල පිට්ටනියේ ඇති අනතුරුදායක ගස සහා අරමුදලින් කපා ඉවත් කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 23.** තුංහිරිපාන කාල්ටන් සිටි ප්‍රජා ශාලාවේ වහලය සෑදීම සඳහා අප සභාව විසින් රුපියල් ලක්ෂ දෙකක මුදලක් වෙන්කර ඇති අතර එම මුදල මෙම කාර්යය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා රුපියල් දෙලක්ෂ පනස් දහසක මුදලක් ලබාදීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතකොට ඇස්තමේන්තුවක් නැද්ද.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** වහළයට අවශ්‍ය ලී දඬු සහ සෙවිලි තහඩු මිලදී ගැනීමට තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒකට ඇස්තමේන්තුවක් දාන්න ඕනනේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ අය ඒකට මිල ගණන් ඉදිරිපත් කරා සභාපතිතුමා. දැව සංස්ථාවේ ඒ මිල ගණන් වල, ලී වල මිල වැඩි වුණා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඊට පස්සේ ආවානේ මිටි වලින් ගහන කතාවක්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ මිල ගණන් අනුව රු.250,000.00 ක් යනවා. ඒක නිසා මේ යෝජනාව කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒකට ඇස්තමේන්තුවක් දාන්න එපැයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මිල ගණන් ඉදිරිපත් කරලා තියෙනවා. තාක්ෂණ නිලධාරිතුමිය විසින් සකස් කරන ලද ලී ලැයිස්තුවට ඒ අය මිල ගණන් කැඳවලා ගෙනත් දීලා තියෙනවා. ඒ මිල ගණන් අනුව දැව වල මිල ඉතා ඉහළ ගිහින් තියෙනවා. ඒ අනුව තමයි රු.250,000.00 ක් අවශ්‍ය වෙන්නේ.

(ගරු මන්ත්‍රී ඩබ්.ජී. චමින්ද මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එතකොට අපි එපැයි මිල ගණන් කැඳවන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මිල ගණන් කැඳවලා තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවෙන්ද මිල ගණන් කැඳෙව්වේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** දැව සංස්ථාවෙන් ගෙනාවේ ඒ සමිතියෙන් ගිහිල්ලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නෙමෙයිනේ දැන් කරනවා කියන්නේ. අමානෝ වහළක්නේ දැන් ගහනවා කිවුවේ. ලී මිලදී ගන්න තව මාස ගාණක් යනවා කියනවානේ. මේකට සංශෝධිත ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරන්න කියන්නකෝ. එතකොට හරිනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒක මන්ත්‍රී ප්‍රතිපාදන වලින්ද දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රී ප්‍රතිපාදන නැහැනේ. එහෙම එකක් සභාවේ නැහැනේ. මන්ත්‍රී ප්‍රතිපාදන කියලා එකක් නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මන්ත්‍රීවරුන්ට ප්‍රතිපාදන වෙන් කරලා තියෙනවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නැහැ. යෝජනා වලට වැඩ කරනවා එච්චරයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** කොට්ඨාශ 12 න් කොට්ඨාශ 11 කට වැඩ කරනවා. මගේ කොට්ඨාශයට වැඩ කරන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මාතලේ ගිහිල්ලාවත් ඒක ඉගෙන ගෙන ආවේ නැද්ද, වෙන ඒවා නම් ඉගෙනගෙන ඇවිල්ලා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ- 24.** ග්‍රාමක අපි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව නමින් මුහුණු පොතෙහි භාවිතා වන ගිණුම අවලංගු කිරීමට හෝ වෙනස් කිරීමට සුදුසු බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේක ස්වේච්ඡා සංවිධානයක්. බෝපෙ පෝද්දල බලප්‍රදේශයේ ලියාපදිංචි සංවිධානයක් මේක. ඔබතුමා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාවේ සභාපතිද, නැත්නම් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපතිද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ සභාපති ඔබතුමා නම් ගිහිල්ලා බලන්න කිතුලම්පිටියේ ලිඩ්ස් ජාත්‍යන්තර පාසලේ බැම්ම ගැන. දැන් ඔබතුමා ඒකට නඩු දාලා තියෙනවා. ඒකෙ බැම්ම ඉදිකරපු කෙනා කවුද කියලා හොයන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේකයි, ඒකයි අතර තියෙන සම්බන්ධය මොකක්ද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අධිකරණයෙන් වරදකරුවෙක් වෙච්ච මන්ත්‍රීවරයෙක් මෙතන ඉන්නවා. ඒ ගැන හොයන්න ඕන. එහෙම නැතුව මේක ස්වේච්ඡා සංවිධානයක්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි මෙහෙමයි. මේක අපේ ප්‍රාදේශීය සභාව. ලියනගේ මන්ත්‍රීතුමා නමින් තමයි මේ ග්‍රාමක අපි කියන ගිණුම මුහුණු පොතේ භාවිතා කරන්නේ. එතුමාගේ නමින් සහ ඡායාරූප සහිතව භාවිතා කරන්නේ. එතකොට මේ සඳහා එතුමා ලෝගො එකක් වගේ දෙයක් යොදාගෙන තියෙනවා. ඒක මෙන්න මේක. ඒකෙ සඳහන් වෙලා තියෙනවා පොදු අපේක්ෂාව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා. ඒක පැහැදිළිව මේකෙ තියෙනවා. තමුන්නාන්සේලා දුරකථන වලින් බලන්න ෆේස්බුක් එකේ. මේක තමයි ඒකෙ ප්‍රදර්ශනය වෙන්නේ. මම ගයාන් ගීතික ලියනගේ මන්ත්‍රීතුමා සමඟ කිසිම අමනාපයකින්වත්, ද්වේෂ සහගත හැඟීමකින්වත් නෙමෙයි මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මේක බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව නමින් යම් මන්ත්‍රීවරයෙකුට පුද්ගලිකව මුහුණු පොතේ ගිණුමක් පවත්වා ගෙන යන්න බැහැ. ඒක අනිවාර්යයෙන්ම කරන්න බැහැ. මාධ්‍ය සදාචාරයන්ටවත්, සමාජ මාධ්‍ය ජාලයේ නීති අනුව මෙවැනි උපකල්පිත හෝ නියමිත නමක් භාවිතා කරමින් කිසිදු අවස්ථාවක ඒක කරන්න බැහැ. ඒකට කිසිදු අවසරයක් නැහැ. මේක වරදක්. ඉතිං ඒක නිසා මම එතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා එතුමා මේ කාරණය පිළිබඳව නොදැනුවත්ව යම් කිසි ක්‍රමවේදයක් මේ සඳහා අනුගමනය කරනවා ඇති. අපි කියන්නේ මේක කරුණාකරලා තේරුම් අරගන්න කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එතකොට මම ග්‍රාමක අපි ස්වෙච්ඡා සංවිධානය අක්මීමන ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ නෙමෙයි, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ලියාපදිංචි කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක හරි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකෙ ලියාපදිංචි අංකයයක් තියෙනවා. මේ ඒකෙ ලියාපදිංචි සහතිකය. එතකොට මම මේකෙ අක්මීමන ප්‍රාදේශීය සභාව කියලද ගහන්න ඕන. මේක බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒකෙ ලියාපදිංචිය තියෙන්නේ ග්‍රාමක අපිද, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන එකත් එක්කද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔක්කොම එක්ක ලියාපදිංචි කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒ ලියාපදිංචි කිරීම වැරදියි. ගරු සභාපතිතුමනි, එතුමා ඒ වරද තේරුම් ගන්නවා නම් ඉතා වැදගත්. දේශපාලඥයෙක් හැටියට මම ඒකට ස්තුතිකරනවා. එතුමා ඒ වරද තේරුම් ගන්නේ නැත්නම් කරුණාකරලා ඔබතුමා පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් මේ ගැන විමසන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒකට උපදෙස් ගන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන වචනය පාවිච්චි කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** නැත්නම් මම අක්මීමන බල ප්‍රදේශය කියලද දාන්නේ සමිතියක් පිහිටුවලා. මේක බෝපෙ පෝද්දල බල ප්‍රදේශය.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, අපි බැනර් එකක් දැම්මත් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා දානවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා මට විනාඩියක් දෙන්න. මටත් මේකම වැටෙනවා. මටත් මේ ප්‍රශ්නයම එනවා. වෙනස තියෙන්නේ පොහොට්ටුව නැති එක විතරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉස්සෙල්ලා ඕක බලන්න මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා ඃ-** බලප්‍රදේශය කියලා දාන්න පුළුවන්. නමුත්, ප්‍රාදේශීය සභාව කියලා දාන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙම දාන්න පුළුවන්. ඒකට උපදෙස් ගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා මේක මටත් බලපානවා. මමත් දාලා තියෙනවා එකක් ඒකයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** අක්මීමන ප්‍රාදේශීය සභා බලප්‍රදේශය කියලා නෙමෙයිනේ මේකෙ තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මමත් එකක් දාලා තියෙනවා. වෙනස තියෙන්නේ ලෝගො එකේ විතරයි. මම දාලා තියෙන්නේ පායන හිරු කියලා. ග්‍රාමක අපි - පායන හිරු කියලා දාලා තියෙන්නේ. මගේ ලෝගො එකේ ඒක තියෙන්නේ. ඒකෙ අර පොහොට්ටුව නෙමෙයි තියෙන්නේ. පායන හිරු කියලා දාලා තියෙනවා. ප්‍රේමලාල් අබේසේකර කියලා දාලා තියෙනවා. මේකෙ නීතියට කිසි කතාවක් නැහැ මම දකින විදියට.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේක මන්ත්‍රීතුමා ඔබතුමාලගේ පක්ෂය එක්ක කතා කරන්න ඕන ප්‍රශ්නයක්. මේක සභාවට අදාළ නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාවේ න්‍යාය පත්‍රයටවත් දාන්න බැහැ මේ යෝජනාව. සභාවේ කතා කරන්න තියා න්‍යාය පත්‍රයටවත් දාන්න බැහැ. මේක සභාවට අදාළ නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** මේකෙ සභාවේ නමක් නැහැ. අපිත් දානවානේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා. මේක සභාවට අදාළ නැහැ. මේකෙ පොහොට්ටුවේ ලාංඡනය තියෙන්නේ. සභාවේ ලාංඡනය තියෙනවා නම් කමක් නැහැ. සභාවේ ලාංඡනය නෙමෙයි පොහොට්ටුවේ ලාංඡනය තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා පොහොට්ටුව කියන්නෙත් ලාංඡනයක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතන මෙහෙම දෙයක් තියෙන්නේ. ඔතන පොඩි අර්බුදයකට ලක්වෙන තැනක් තියෙනවා. ඒක නැත්තේ නැහැ. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව නම් එකයි තියෙන්නේ. ලාංඡනයේ කතාව නෙමෙයි, සභාව නම් එකයි තියෙන්නේ. ඒක නිල එකක්. වෙනත් දෙයකට ඒක භාවිතා කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තියෙනවා. ඒක නැත්තේ නැහැ. බෝපෙ පෝද්දල නම් පුළුවන්. ප්‍රාදේශීය සභාව කියන වචනය පිළිබඳ ගැටළුව තියෙන්නේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ලාංඡනය නෙමෙයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ. ලාංඡනය නෙමෙයි. නමුත් ප්‍රාදේශීය සභාව කියන නම නිල වශයෙන් පාවිච්චි කරන්න පුළුවන් අදාළ ප්‍රාදේශීය සභාවට විතරයි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** නැහැ සභාපතිතුමා, අපි මහජන මන්ත්‍රීවරු. හුසේන් කියාස්, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා දානවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා දාන්න පුළුවන්. එහෙම දාන්න පුළුවන්. මම කියන්නේ මම දකින දේ. මේක හරි වෙන්නත් පුළුවන්, වැරදි වෙන්නත් පුළුවන්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඒකට උපදෙස් ගන්න. මම උපදෙස් අරගෙන තියෙන්නේ ඒකයි කියන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මමත් හදලා තියෙනවා එකක් ග්‍රාමක අපි - පායන හිරු කියලා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක 2012 වර්ෂයේදී ලියාපදිංචි කරලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ගරු සභාපතිතුමා, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පදිංචිකරුවෙක් නම් දාන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ මෙහෙම දෙයක් එතන තියෙන්නේ. මිනිස්සු නොමඟ යන්න පුළුවන්. මිනිස්සු බලන්නේ නැහැ ලාංඡනය මොකක්ද කියලා. මට හිතෙන දේ මේ කියන්නේ. මම ඒක දක්කෙත් නැහැ. ඒක මට එවපු හින්දා දක්කේ. මිනිස්සු දැක්කම බලන්නේ ලාංඡනය අරක මේක නෙමෙයි. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන එක බලන්නේ. එතකොට මිනිස්සුන්ට හිතෙන්න පුළුවන් මේක සභාවේ නිල ෆේස්බුක් ගිණුම කියලා.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මේකෙ නමක් සඳහන් කරලා තියෙනවා ලොකුවටම. ග්‍රාමක අපි කියලා මේකෙ නමක් සඳහන් කරලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකෙ ග්‍රාමක අපි කියලා තියෙනවා. ලාංඡනයට පොහොට්ටුව තියෙන්නේ. මේ ලෙටර් හෙඩින් එකේ කොටසක් අල්ලාගෙන කියන්නේ.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** එහෙම බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ නම යොදවලා ලෝගො එකක් හදන්න පුළුවන් කියලා මම දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම එකක් තියෙනවා. ඔය ෆේස්බුක් එකේ නම් හදපු නැති එකක් තියෙනවද.

**ගරු මන්ත්‍රිනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** ඒක තමයි ඉතිං. ඔයිට වැඩිය ඒවා තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔය ෆේස්බුක් එකේ නම් හදපු නැති එකක් නැහැ ඉතිං. හැමදේම හදනවා. ෆේක් එකවුන්ට් තියෙනවා අනන්තවත්. එහෙම එකක් තියෙනවා. නමුත් දැන් මෙතන තියෙන ප්‍රශ්නය ලියනගේ මන්ත්‍රීතුමා පිළිගන්නවාද.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේක විහිළුවකට ගන්න එපා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඔබතුමා මේ විහිළුවක් කරන්නේ. මේකෙ පැහැදිළිවම ඒක තියෙනවා. මේ තියෙන්නේ සමිතියේ ලියාපදිංචි සහතිකය.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඔබතුමා ඕක කියවන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** හරි මම කියවන්නම්.

(ග්‍රාමක අපි ස්වෙච්ඡා සංවිධානයේ ලියාපදිංචි සහතිකය සභාගත කරන ලදී.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං වැරදියිනේ. ප්‍රාදේශීය සභාවේ නම නැහැනේ ඕකේ. මේ තර්ක කරන්නේ ඕක නෙමෙයිනේ. ඕක ලියාපදිංචි කරලා ඇති. නමුත් ප්‍රාදේශීය සභාවේ නම නැහැනේ ඕකේ. කෝ එවන්න ලෝගො එක බලන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඕක නිකං හොර සල්ලි අච්චු ගැහුවා වගේ වැඩක් මන්ත්‍රීතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕකට අපි උපදෙස් ඉල්ලමුකෝ. ඒකෙ ගැටලුවක් නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඕකට උපදෙස් ගන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මම ඔයිට වැඩිය කැමතියි ඕක මේකට දාන්නේ නැතුව දෙගොල්ලෝ කතා කරලා ප්‍රශ්නය විසඳ ගත්තා නම්.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** දැන් ඕකට උපදෙස් ගන්නකෝ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන කොට ගරු සභාපතිතුමා, මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමා, කාර්ය මණ්ඩලය, පළාත් පාලන කොමසාරිස්තුමා, පළාත් පාලන දෙපාර්තමේන්තුව, පළාත් පාලන අමාත්‍යාංශය සහ ගරු ආණ්ඩුකාරතුමා දක්වා විහිදිච්ච විශාල ජාලයක් තියෙනවා. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන්නේ එහි සියළු වැසියන්ගේ ප්‍රාදේශීය සභාව. එතකොට අපිට අයිතියක් තියෙනවා මේ සභාව පිළිබඳව කතා කරන්න. මෙතන ඉන්න මන්ත්‍රීවරුන්ට ඒකට වගකීමක් තියෙනවා සභාවේ නම නිවැරදි ලෙස සහ අපකීර්තියට ලක් නොවන ආකාරයට පාවිච්චි කරන්න. එහෙම මම පාවිච්චි කරත්, ඒක මන්ත්‍රීවරුන්ට හොඳ නැහැ. ඒක සභාවේ නමට හොඳ නැහැ. කීර්තිනාමයක් තියෙනවා හැම ආයතනයකටම. ඒක නිසා ඒ කීර්තිනාමයට යම් කිසි හානියක් වෙනවා කියන විශ්වාසය නිසයි මම මේ යෝජනාව ගෙනාවේ. නැතුව මේක ද්වේශ සහගත අදහසකට ගෙනාවා නෙමෙයි. තමුන්නාන්සේලා සියළු දෙනා වෙනුවෙන් ගෙනාපු යෝජනාවක් මේක. ඒකට තමුන්නාන්සේලා කැමතිනම් එකඟ වෙන්න. නැත්නම් ඉතිං එකඟ නොවී ඉන්න. මම කරලා තියෙන්නේ මගේ යුතුකම පමණයි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේක ස්වෙච්ඡා සංවිධානයක් හැටියට ලියාපදිංචි කරලා තියෙන්නේ. මේ යටතේ ස්වෙච්ඡා සාමාජිකයන් 25 ක් ඉන්නවා. මේ හරහා අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට කිසිම අපකීර්තියක් සිදු වෙලා නැහැ. මන්ත්‍රීවරු සමහර වෙලාවට මේකෙ සේවකයන්ට ගෙනාපු මස් කිලෝ දෙක උස්සගෙන ගිහිල්ලා අපකීර්තියට ලක් වෙලා තියෙනවා. මම මේකෙ ෆේස්බුක් ගිණුමක් හැදුවා නම් රමේෂ් පතිරණ ඇමතිතුමා කිවුවා වගේ බහිරවයා, කිතුලම්පිටිය ආනන්ද පිරිවෙන කියලා, ඔන්න මම වැරදියි. මම මේක හැදුවේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ස්වෙච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමේදී. මගේ ලෝගො එක හැදුවේ ඒ වෙලාවේදී. මේක 2007 වර්ෂයේදී හදපු එකක්.

**ගරු මන්ත්‍රීනි කේ.එල්.එල්. රංගනී කුමාරි මැතිණිය ඃ-** මේ වෙන තෙක් මේකට කිසිදු චෝදනාවක් නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේකෙ ලියාපදිංචි කිරීමට අදාළ ලියවිල්ල සුගත් මන්ත්‍රීතුමා මෙතන කියෙව්වානේ. ඒ ලියවිල්ලේ මේ පින්තූරය ඇතුළත් වෙලා තියෙනවාද.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ලියාපදිංචි කිරීමේ සහතිකයට අපි මේක දාන්නේ නැහැනේ. අපි අවශ්‍ය ඉල්ලීම් දෙන කොට මේක දීලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මේකෙ ග්‍රාමක අපි, පොදු අපේක්ෂාව බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඉතිං එහෙම තමයි තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ඒක නීත්‍යානුකූල නොවන විදියට මෙතනට රිංගවපු එකක්. ඒකයි අපි වැරදියි කියලා කියන්නේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ධර්මතිලක මහතාට කතා කරලා අහන්න. මම ඒකෙ නීත්‍යානුකූල තත්ත්වය ගැන ඇහුවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීවරු විදියට ඒක පාවිච්චි කරන කොට මීට වඩා සැලකිලිමත් වෙන්න ඕන. දැන් ගරු සභාපතිතුමා මේ තිස්ස මන්ත්‍රීතුමා අපේ ලෙටර් හෙඩින් එකේ ලියුමක් ලියලා දීලා තිබුණා තමන්ගේ ගමේ මිනිහෙක්ට කාණුව සුද්ධ කරලා දෙන්න කියලා. ඒකට විරුද්ධව මේ සභාවේදී කතා කරා. මේ අපේ ලෙටර් හෙඩින් එකේ තිස්ස මන්ත්‍රීතුමා ලියුමක් ලියලා දීලා තිබුණේ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** පහුගිය වකවාණුව තුළ මෙහේ ලෙටර් හෙඩින් එක මන්ත්‍රීවරුන්ට බෙදුවා. මේ සභා කාලය තුලදී තමයි ඒක ලබා නොදුන්නේ. මීට ඉහත සභා වලදී අපේ මන්ත්‍රීවරුන්ට ලෙටර්හෙඩින් දුන්නේ නැද්ද සභාවෙන්. මේ සභාවාරයේදී තමයි හාෆ්ශීට් එකක්වත් දුන්නේ නැත්තේ මන්ත්‍රීවරුන්ට. දැන් මම හිටපු පහුගිය සභාවල ලෙටර් හෙඩින් එකේ ඉඳලා ලබා දීලා තියෙනවා. ඒක සභාපතිතුමා දන්නවා ඇති.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මන්ත්‍රීවරු මේක තේරුම් ගන්න ඕන. ඇයි අපිට සභාවේ නම නැතුව මේ ෆේස්බුක් ගිණුම පවත්වාගෙන යන්න බැරි. මොකක්ද එතන තියෙන ගැටළුව. කිසි කෙනෙකුට අවනම්බු කරන්න හෝ නින්දා කරන්න හෝ අවශ්‍යතාවයක් මට නැහැ. මේ සියළුම දෙනා වෙනුවෙන් මේකෙ මම දකින වැරැද්ද මේ පෙන්වා දෙන්නේ. සමහර වෙලාවට මේ ෆේස්බුක් ගිණුමේ යන පෝස්ට් අපිට තේරෙන්නෙත් නැහැ. අපිටත් ලැජ්ජයි ඒකට. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන එක මොකටද ඒකට දැම්මේ. ඒ හැඟීම අපිට ආවේ.

(සභාව පැහැදිලි නොවීය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම දැන් කොමසාරිස්තුමාගෙන් මේ ගැන ඇහුවා. කොමසාරිස්තුමා නම් කියනවා මේක ප්‍රධාන වශයෙන්ම අදාළ මන්ත්‍රීවරයා දැන ගන්න ඕන කියලා මේකෙන් ප්‍රාදේශීය සභාව කියන උත්තරීතර ආයතනයට හානියක් වෙනවද, නැද්ද කියන එක. ඒක මන්ත්‍රීවරයා විසින් තීන්දු කරන්න ඕනලු. නීති දාලා මේක වළක්වන්න බැහැ කිවුවා පළාත් පාලන කොමසාරිස්තුමාට. එතුමා කියන්නේ මේකට සාමූහිකව කතා කරලා තීරණයක් ගන්නලු. ප්‍රාදේශීය සභාව කියන උත්තරීතර ආයතනයට මේකෙන් හානියක් වෙනවලු. ඒක නැත්තෙත් නැහැලු. නමුත් මේක නීතියෙන් එතුමාට වළක්වන්න පුළුවන් දෙයක් නෙමෙයිලු. ඒ පැත්තට යනවා නම් TRC එකට වාර්තා කරන්නලු සභා තීන්දුවක් අරගෙන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට සභා තීන්දුවක් ඕන නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** මේ සංවිධානයෙන් කාට හරි හානියක් වෙලා තියෙනවා නම් ඒක අපි පිළිගන්නවා. කාටවත් මේකෙන් හානියක් වෙලා නැහැ. මේ ග්‍රාමක අපි කියන සංවිධානයෙන් පහුගිය කාලයේදී අපිට මතකයි අපේ හිටපු මන්ත්‍රීවරුන්ව මේ සභාවට ගෙන්වලා සම්මානයක් ලබා දුන්නා. ඒ වගේ

හොඳ දෙයක් කරනවා මිසක් වැරදි වැඩක් මේකෙන් සිද්ධ වෙන්නේ නැහැ. වැරදි වැඩක් කරනවා නම් අපිට චෝදනා කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපි කතා කරේ ඒ සංවිධානයට විරුද්ධවවත්, ඒ සංවිධානයේ වැඩ වලට විරුද්ධවවත් නෙමෙයි. අපි කියන්නේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියන වැකිය මේකට භාවිතා කිරීම නීතිවිරෝධියි කියලා. ඒක සාදාචාරාත්මක නැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල කියලා කියන්නේ නැතුව අක්මීමන කියලා කියන්නද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දලට, බෝපෙ පෝද්දල කියලා කියන්නේ නැතුව වෙන මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල කියලා දැම්මට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා දාන්න බැහැ.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙම නම් ඉතිං නීතිය ක්‍රියාත්මක කරන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපිත් ඉන්න සභාව මේක.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එහෙමනම් යෝජනාව ගෙනල්ලා නීතිය ක්‍රියාත්මක කරන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** බෙදීමක් ගන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකට බෙදීමක් දෙන්න.

(සභාව පැහැදිළි නොවීය.)

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේකට බෙදීමක් දෙන්න. එතකොට මම මේක අයින් කරනවා. බෙදීමක් දෙන්න සභාවෙන්.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අනාගතයේ දවසක මේකට තීරණය කරාවි පහුගිය කාලයේ වැරැද්දක් විදියට.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒකෙ හරි වැරැද්ද අපි තීරණය කරන්නම්. අපි වැරදි නොවන විදියට ඒ සංවිධානය පවත්වා ගෙන යන්නම්. අපි ප්‍රවේශම් වුණාම ඔය කිසි ප්‍රශ්නයක් නැහැනේ. ඔබතුමාගේ යෝජනාවට බෙදීමක් ගේන්න.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** අපි මන්ත්‍රීවරුන් විදියට මේ වගේ යෝජනාවකට බෙදීමකට යන එක නෙමෙයි අපේ වගකීම.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපි කැමතිනම් මොකද කරන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැහැ මෙහෙමයි. මම නම් ඕකේ දෙපැත්තම දකිනවා. චන්ද්‍රකුමාර මන්ත්‍රීතුමා කියන එකේ යම් සත්‍යතාවයක් තියෙනවා. මේකෙ පිටින් ඉන්න සාමාන්‍ය මනුස්සයෙක් දන්නේ නැහැ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ ලාංඡනය මොකක්ද කියලා. ඒ නිසා මිනිස්සු රැවටෙන්න පුළුවන් මේක සභාවේ නිල ෆේස්බුක් ගිණුම කියලා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** රැවටෙන්නේ පොහොට්ටුව තියෙන නිසා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** පොහොට්ටුව තියෙන නිසා තව රැවටෙනවා. මම දකින විදිය කියන්නේ. කොමසාරිස්තුමා කිවුවා වගේ ඒක ගැන මන්ත්‍රීවරු දැන ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** සභාපතිතුමා කාලයත් ඉක්මවා යනවා. දැන් ඇත්තටම මෙතුමාටත් මේක ගැන අදහසක් ඇති. දැන් අපිටත් අදහස් තියෙනවා කියන්න. හැබැයි මම මේකට හේතු කියන්නේ නැහැ. මන්ත්‍රීවරයෙක් විදියට ඔබතුමාට පුළුවන් ඔය සියළු ලිපිලේඛන සහ ෆේස්බුක් එකේ තියෙන දේවල් එකතු කරලා අවශ්‍ය නීතිමය පියවර ගන්න. ඒක සභාවට ගේන්න. මේකට මට බැලූ බැල්මටම හේතු කියන්න පුළුවන්. නමුත් මම මුකුත් කියන්නේ නැහැ. ඕක තමුන්නාන්සේලාගේ ප්‍රශ්නයක්. සභාවේ ලාංඡනයක් එක්ක ඕක තිබුණා නම් අපි දන්නවා ඕකට කතා කරන්න. නමුත් ඔය ප්‍රශ්නය අපිට අදාළ නැහැ. දේශපාලන පක්ෂයක ලාංඡනයක් තමයි පෙන්වන්නේ. ඒක නිසා සභාවේ වැඩ කටයුතු

කරගෙන යන්න. ඔබතුමාට පූර්ණ අයිතිය තියෙනවා මෙතුමාගේ යෝජනාව සම්බන්ධව තියෙන සියල්ල එක්ක කටයුතු කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ප්‍රියන්ත මන්ත්‍රීතුමා මෙහෙම දෙයකුත් තියෙනවා. ප්‍රාදේශීය සභාව නම් එකයි තියෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** ඒක හරි. ඒක තමයි මාත් කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාව නම් සභාව. දැන් මට ඕක දාන්න පුළුවන්ද කියන්නකෝ වෙනත් නමක් දාලා දකුණු පළාත් සභාව කියලා. අන්න ඒ වගේ වැඩක් මේ.

**ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා ඃ-** එම ලාංඡනයම අනිත් මන්ත්‍රීවරුන්ටත් පාවිච්චි කරන්න පුළුවන්ද, ඒක කරන්න බැහැනේ. මම කියන්නේ ඔතන ප්‍රශ්නයක් තියෙනවා. මට ප්‍රශ්නය කියන්න පුළුවන්. නමුත් ඒක මම අද කියන්නේ නැහැ. ඒකට තම තමන්ගේ අනන්‍යතාවයක් තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක මෙහෙමයි. බෝපෙ පෝද්දල කියලා තිබුණා නම් ගැටළුවක් නැහැ. නමුත් ප්‍රාදේශීය සභාව කියලා තිබුණම මිනිස්සු නොමඟ යන්න පුළුවන්. එහෙම එකක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මටත් වචනයක් කියන්න ඕන. දැන් මෙතුමාගේ පැත්තෙන් මේ දකින යෝජනාව. ඒ යෝජනාව එතුමාගේ පැත්තෙන් කරන්නේ සභාවේ නම මේකට පාවිච්චි කරලා තියෙනවා කියලා. එතකොට ඇත්ත කාරණය මෙහෙමයි. තමන් නියෝජනය කරන බලප්‍රදේශය සඳහන් කරන්න පුළුවන්. විශේෂයෙන්ම මන්ත්‍රීවරයෙක් හැටියට නියෝජනය වෙනවා නම් අදාළ පුද්ගලයාගේ අනන්‍යතාවය සහිතව නියෝජනය වෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගයාන් ගීතික ලියනගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා දැම්මා නම් ගැටළුවක් නැහැ. එහෙම දැම්මානම් මේකෙ කිසි ගැටළුවක් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේකෙ එතුමාගේ නම සඳහන් කරලා නැහැ. මේක සංවිධානයක් නේ. ඒක එතුමාගේ ෆේස්බුක් ගිණුම නෙමෙයි. ගයාන් මන්ත්‍රීවරයාගේ ෆේස්බුක් ගිණුම නෙමෙයි මේ. මේක සංවිධානයක්. ඒ සංවිධානයට ග්‍රාමක අපි කියලා නමක් තියෙනවානේ. ඒ සංවිධානයට බෝපෙ පෝද්දල කියලා පාවිච්චි කරන එක ගැටළුවක් නැහැ තමයි. හැබැයි බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කිවුවම නිල ආයතනයක් තියෙනවා. බෝපෙ පෝද්දල බලප්‍රදේශය කියලා එකකුත් තියෙනවා. නමුත් ප්‍රාදේශීය සභාව කියලා කිවුවම ඒක නිශ්චිතයි. මේක ගැන අපි මෙතන තර්ක කරලා හෝ යෝජනාව සම්මත කරලා එහෙම කරන්න අවශ්‍යතාවයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම අවශ්‍යතාවයක් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මේක නීත්‍යානුකූලව බැලුවම තහනම් කරන්න හෝ නීති ක්‍රියාමාර්ග ගන්න අපේ රටේ තියෙන අණපනත් අනුව හැකියාවකුත් නැහැ. ඒකයි එතුමන්ලා කියන්නේ ඒකට නීතිමය ක්‍රියාවක් කරන්න ඒ ආයතන වලට බලයක් නැහැ කියලා. මේක ගැන කවුරුත් ස්වෙච්ඡාවෙන් තේරුම් අරගෙන මේකට යම් ක්‍රියාමාර්ගයක් අරගෙන නම ඉවත් කර ගන්න එක තමයි සුදුසු. මෙතන ගැටුමකට යනවට වැඩිය ඒක තමයි සුදුසු. ඒ නිසා මම කියන්නේ බෝපෙ පෝද්දල කියලා නිශ්චිතවම එක ප්‍රාදේශීය සභාවයි තියෙන්නේ. ප්‍රාදේශීය සභා බලප්‍රදේශය හෝ බෝපෙ පෝද්දල කියලා පාවිච්චි කරන්න පුළුවන් ඕනම කෙනෙකුට. ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන්ට පුළුවන් මන්ත්‍රීවරයාගේ නම ගහලා ඒක කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ග්‍රාමක අපි කියන සංවිධානයෙන් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව නියෝජනය වෙන්නේ නැහැ. මේක සාදාචාරාත්මකව විසඳගන්න එක තමයි සුදුසු වෙන්නේ. ඒ යෝජනාව සම්මත කරන්න ගැටුමකට යනවට වඩා එහෙම කර ගන්න එක හොඳයි.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, මේක අවසන් කරන්න විනාඩියක් විතරක් දෙන්න. අපි වගකීමක් ඇති පිරිසක් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරු විදියට අපි විසිදෙදෙනාටම එක සමාන අයිතිවාසිකම් සහ බැඳීම්වලට අයිතියි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක කියාස් මන්ත්‍රීතුමත් හදලා තියෙනවා. අබේසේකර මන්ත්‍රීතුමත් හදලා තියෙනවා.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** ගයාන් මන්ත්‍රීතුමා එක්ක මට තනියම කතා කරලා තීරණයක් ගන්නවාට වඩා සියළු දෙනා එක්ක කතා කරලා තීරණයක් ගන්න එක වටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නැවත හිතන්න. අපි මෙහෙම හිතමු. අපිට පුළුවන්ද දාන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නමින්. ඒක තමයි කියන්නේ ඉතිං. අපිට ඒක කරන්න පුළුවන්ද.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එහෙම නම් කොට්ඨාශය දාන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොට්ඨාශය කියලා දාන්න පුළුවන්. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය කියලා දාන්න බැහැ. ඒක තමයි මම කියන්නේ. බෝපෙ පෝද්දල කොට්ඨාශය කියලා දාන්න පුළුවන්. ප්‍රාදේශීය සභාව කියලා දාන්න බැහැ. එහෙම අපිට නොතේරෙන පොඩි දෙයක් තියෙනවා සුගත් මන්ත්‍රීතුමා. අපි ඔච්චර දුරට යන්න ඕන නැහැ. මම ලියනගේ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා පුළුවන්නම් මේක කරන්න. අපි අරහෙට මෙහෙට ගිහිල්ලා නෙමෙයි පුළුවන්නම් බෝපෙ පෝද්දල බලප්‍රදේශය හරි, බෝපෙ පෝද්දල කියලා හරි, මොකක් හරි දාලා හරි ප්‍රාදේශීය සභාව කියන කෑල්ල අයින්කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඒක මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම පොඩි දැනුවත් කිරීමක් කරන්නම්. ග්‍රාමක අපි කියන සංවිධානය ගයාන් මන්ත්‍රීතුමා පිහිටුවලා තියෙන්නේ කැබිනට් අමාත්‍ය ගරු රමේෂ් පතිරණ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්. ඉතිං මේක එතුමාම තමයි ලියාපදිංචි කරලා තියෙන්නේ. මේකෙ සභාපතිවරයා හැටියට ඉන්නේ ශාන්ත මහත්තයා. ලේකම් ලියනගේ මහත්තයා. ඒ වගේම මේ සමිතිය පිහිටුවීමේ මූලාරම්භය එහෙමයි. ඉතිං මම හිතන්නේ එකම පක්ෂයේ ඔබතුමන්ලා ඈණකොටා ගන්නේ නැතුව මේක කරන්න. මම හිතන්නේ මෙතන යම් කිසි වැරැද්දක් තියෙන්න පුළුවන්. ඒ වැරැද්ද අපි නිවැරදි කරගෙන යන්න ඕන. මෙතනදී හැමෝම හැල්ලුවට ලක් වෙනවා. මොකද මන්ත්‍රීවරු මන්ත්‍රීවරු ඈණකොටා ගන්න කොට හෙට මාධ්‍යයේ යාවි මෙන්න මන්ත්‍රීවරු ඈණකොටා ගන්නවා කියලා. ඒක අපේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවටත් හොඳ නැහැ. මේක බොහොම සුහදව විසඳ ගමු කියලා මම මතු කරන්නේ. මම ගයාන් ගීතික ලියනගේ මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටිනවා එක්කෝ මේකෙ ලාංඡනය වෙනස් කරලා හරි මේක කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලාංඡනයේ ගැටළුවක් නැහැ. මේකෙ ප්‍රාදේශීය සභාව කියන එක අයින් වෙනවා නම් හරි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මෙතන විශාල ගැටළුවක් මතු වෙලා තියෙනවා. ඇත්තටම උදුල මන්ත්‍රීතුමා කිවුවා වගේ මේ සංවිධානය පිහිටුවලා ලියාපදිංචි කරේ 2007 වර්ෂයේදී.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි මන්ත්‍රීතුමා මෙහෙමයි. ඔබතුමා ඕක ලියාපදිංචි කරත්, ඔබතුමාට ඕක බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා ලියාපදිංචි කරන්න බැහැ. මම දන්න විදියට ග්‍රාමක අපි කියන එක ලියාපදිංචි කරලා ඇති.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේක විශාල ගැටළුවක් නම් බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව කියලා තියා ගන්න අවශ්‍යතාවයක් නැහැ. මේක මගේ පෞද්ගලික එකක් නෙමෙයි. මේක ස්වේච්ඡා සංවිධානයක්. ශාන්ත මහතා තමයි මේකෙ සභාපති විදියට ඉන්නේ. මම ඉන්නවා, දිනේෂ් මහතාත් ඉන්නවා. අපි කතා කරලා එහේදී හදපු සමිතියක් මේක. මේකෙ විශාල වැඩ කොටසක් කරා වගේම මිනිස්සුන්ට දේවල් ටිකකුත් කරා. අපි මේක ඉදිරි කාලය තුළදී බෝපෙ පෝද්දල හැම ගමකම පිහිටුවනවා. හැම ගමකම ග්‍රාමක අපි සංවිධාන පිහිටුවන්න මම අරමුණු කරනවා. මේ සිද්ධියත් එක්ක මම ඒක කරනවා. ප්‍රාදේශීය සභාව කියන එක ඉවත් කර ගන්න පුළුවන් කිසිම ගැටළුවක් නැහැ. ප්‍රාදේශීය සභාවටවත්, එක එක පුද්ගලයන්ගේ හයියෙන්වත් කිසිම තැනක තියෙන ආයතනයක හයියෙන්වත්, දේශපාලනය කරන මිනිහෙක්ගේවත් සංවිධානයක් නෙමෙයි මේ. මම ගමේ මිනිස්සු එක්ක සුහද වෙලා එහෙම වැඩ කරනවා ඇරෙන්න අරයාගෙන් මෙයාගෙන් යැපිලා පරපෝෂිතයන් හැටියට මම දේශපාලනය කරන්නේ නැහැ. මම කිසි තැනකට ණයත් නැහැ, බයත් නැහැ. ඒක හින්දා මට මේ නමක් ඕනත් නැහැ.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** බෝපෙ පෝද්දල බලප්‍රදේශය කියලා දාන්න.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** ඔබතුමන්ලා කියනවා නම් මම ලෝගො එක පිටින්ම මේක ඉවත් කරන්නම්. මට එහෙම ගැටළුවක් නැහැ. හැබැයි මේක නීත්‍යානුකූලව ඉවත් කිරීමේ හැකියාවකුත් නැහැ. ඒකත් මම ඒවෙලාවේ අහලා තමයි මේක කරේ. නීත්‍යානුකූලව මේකට කිසිම දෙයක් කරන්න බැහැ. හැබැයි මේ මන්ත්‍රීවරු ගැන මම දැන ගත්තා. මගේ හරි හෝ වැරැද්ද හෝ සුහදතාවයෙන් මට සහයෝගය දෙනවා කියලා මම දැන ගත්තා. ඉතිං ඒ වෙනුවෙන් මම මේ ලෝගො එක වුණත් ඉවත් කරන්න සූදානම්. හැබැයි මට මේක නීත්‍යානුකූලව කරන්න වෙන්නේ ඊළඟ නිලවරණයේදී. හැබැයි මම ඊට

කලින් කරන්න පුළුවන් දේවල් ටිකක් කරන්නම් ෆේස්බුක් ගිණුමේ. ලෙටර් හෙඩින් එකේ වෙනස්කම කරන්න වෙන්නේ ඊළඟ නිලවරණයේදී. දැන් පහුගිය දවස්වල ස්වෙච්ඡා සංවිධාන ලියාපදිංචි කිරීමේදී අපෙන් තොරතුරු ඉල්ලුවා. ඒකට මම දුන්නෙත් මේ තොරතුරු ටිකම තමයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. ඒ නිසා ඉදිරි ලියාපදිංචිවීමේදී ලබන වර්ෂයේදී තමයි ඒක කරන්න වෙන්නේ. ලෝගො එකේ එක මම ඊළඟ සමිතිවාරයට දාලා අවශ්‍ය දේවල් ටික කරන්නම් සුදුසු විදියට.

**ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමාගේ තීරණය පිළිබඳව මම ඉතාමත්ම සතුටට පත්වෙනවා. ඔබතුමාට මම ස්තුති වන්ත වෙනවා. ඔබතුමා ආදර්ශමත් දේශපාලඥයෙක් හැටියට ඒ ගිනිපු තීරණය මම ඉතාමත් අගය කොට සලකනවා. ඔබතුමා මුලින්ම ඔය තීරණය ගත්තා නම් මෙච්චර දුරට මේ කතාව යන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක කොහොම වුණත් ඊට එහා කතා කරන්න ඕන නැහැ.

**( තේ පානය සඳහා සභාව කල් තබන ලදී.)**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගරු උප සභාපතිතුමාට සහ වාසනා මන්ත්‍රීතුමියට අද මහා සභාරැස්වීමට සහභාගි වෙන්න හැකියාවක් නැහැ කියලා නිවාඩු අනුමත කරන්න කියලා දැනුම් දුන්නා. ඒ දෙදෙනාට නිවාඩු අනුමත කරන්න කියලා මම යෝජනා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

(ගරු මන්ත්‍රී ජේ.ඒ. චන්ද්‍රකුමාර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 25.** වෙන්දේසි ඉඩම් සංවර්ධනය කිරීම සඳහා බලපත්‍රය නිකුත් කරන අවස්ථාවේම එම ඉඩමේ විශාලත්වය අනුව පහත සඳහන් වැකිය බැනර් මගින් ස්ථාන කිහිපයක (අදාළ ඉඩමේ) ප්‍රදර්ශනය කිරීමට කොන්දේසියක් ඇතුළත් කරන මෙන් යෝජනා කරමි.

සැලසුම් කමිටුවේ අනුමැතිය ලැබෙන තුරු ඉඩම් මිලදී ගැනීමෙන් වළකින්න.

මෙම ඉඩම සඳහා කේවියට් නියෝගයක් ................. දින සිට .................. දින දක්වා බල පැවැත්වේ.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** වැඩිපුරම ප්‍රශ්න මතුවෙන්නේ අනවසර ඉදිකිරීම් සහ වෙන්දේසි ඉඩම් සම්බන්ධව නිසා මම යෝජනාවක් විදියට මේක ඉදිරිපත් කරේ. මම මේ යෝජනාව මීට කලිනුත් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ කියන්නේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලැබෙනතුරු මේක කරන්නේ. මීට ඉස්සර අපි බැනර් එකක්නම් ගැහුවා. කීපයක්ම ගැහුවා. ඒක ඒ අයටම දෙනවා ආරක්ෂා කරලා ගහන්න කියලා. ඒ කියන්නේ සැලසුම් කමිටුවේ අනුමැතිය දෙනකම් ඒක කරන්නේ. ඊළඟට කේවියට් එකක් දාලා තියෙනවානම්, ඒ කියන්නේ ගන්න බැරි වෙන්න කියන එක නෙමෙයි, ඕන කෙනෙක් දුන්නම ගත්තට කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක බලපැවැත්වුණත් ඒ ඉඩම කවුරුහරි ගත්තට කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 26.** බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඉඩමක් වෙන්දේසි කිරීමේදී අදාළ සමාගමට බැනර් ප්‍රදර්ශනය කිරීම සඳහා අවසර දිය යුත්තේ බලපත්‍රය පරීක්ෂා කිරීමෙන් පසුව බව අදාළ නිලධාරීන්ට ලිඛිතව දන්වන මෙන් යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ- 27.** වෙන්දේසි ඉඩම් වලින් පොදු කටයුතු සඳහා වෙන් කරනු ලබන ඉඩම් කැබැල්ල කම්බි ගසා වෙන්කොට භාරදීම කළ යුතු යැයි යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ යෝජනා දෙක, තුනම මීට කලිනුත් කරලා තියෙන ඒවා. නමුත් දැන් නැවත ඉදිරිපත් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ටික සැලසුම් කමිටුවටත් සභා තීරණයක් විදියට දාන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේ තැන් දුන්නට, සමහර තැන් අපි දන්නෙත් නැහැ කොහෙද දුන්නේ කියලා. ඒවා හොයා ගන්න බැරුව ඉන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට ගරු සභාපතිතුමනි, ඔබතුමා මගේ යෝජනාවක් පැත්තකට කරලා තියෙනවා. ඒක මම දැම්මේ වෙන කිසිම ප්‍රශ්නයකට නෙමෙයි. සභාවේ සහ සියළු දෙනාගේ ආරක්ෂාව සඳහා ඒක දැම්මේ. ඒ කියන්නේ මම ඒ දාපු යෝජනාව වෙන්නේ, සභාපතිතුමා අයින් කරපු යෝජනාව වෙන්නේ මේක.

"අප ප්‍රාදේශීය සභා බලප්‍රදේශය තුල සිදු කරනු ලබන වෙන්දේසි ඉඩම්වල මාර්ග සහ කාණු පද්ධතිවල වසර පහක පැවැත්ම පිළිබඳව අදාළ වෙන්දේසිය සිදු කරන ආයතනය හෝ පුද්ගලයා හෝ සමඟ සභාව ගිවිසුම්ගතවීම සිදු වේ. ඒ අනුව වෙන්දේසි ඉඩම්වල මාර්ග සහ කාණු පද්ධතිවල වසර පහක කාලය ඇතුළත් වගකීම ඇත්තේ සභාව සමඟ සම්මුතිගත වී ඇති පාර්ශවය වෙත වේ."

මම කියලා තියෙන්නේ වෙන මොකක්වත් නෙමෙයි ගරු සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතුරු ටිකත් කියවන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** "එබැවින් එම කාර්යයේ වගකීම අදාළ කාරණය නිරීක්ෂණය කරනු ලබන වරලත් ඉංජිනේරුවරයාට හෝ අප සභාවේ තාක්ෂණ නිලධාරියාට පැවරීමට හැකියාවක් නොමැති බවට දැනුවත් කරමි."

මෙහෙමයි ගරු සභාපතිතුමා, මේක ඔබතුමන්ලාගේ, අපේ, සියළු දෙනාගේම ආරක්ෂාව සහ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඇත්තටම හොඳයි. මොකද හේතුව මේ යෝජනාව මම මීට කලිනුත් කරලා තියෙනවා. මේක නැවතත් ගෙනාවේ වෙන දෙයක් නිසා නෙමෙයි. මොකද පාරක් හදනකොට දැන් ඔබතුමා දන්නවා ඒක කරන විදිය. දැන් උදාහරණයකට මවුන්ට් පැනරෝමා එක ගමු. ඒක තමයි හොඳම උදාහරණය. ඒකෙ කාණු පද්ධතිය නිකං ගන්න බලන්න. මම මේක උදාහරණයකට ගත්තේ. දැන් අර මවුන්ට් කැල්වරි එක ගාව හදන කාණුව හොඳට පළලට දාන්න. අර එන ජල කඳක් එහෙම යන්න බැහැ. ඊළඟට අද තාක්ෂණ නිලධාරීන් නැහැ. ඒ අය දැනුවත් වෙන්න ඕන. අර ගස් කොළන් වැටිලා තිබුණ මේවා එකේ ඊට පස්සේ ගස් කපලා දැම්මා. දැන් කෙලින්ම එන ජල කඳක් එන්නේ. මේ ජල කඳ එන එකට මොකද කරන්නේ. අඩියක, අඩි එකහමාරක කාණුවක් තමයි මේ දාලා තියෙන්නේ. එතකොට මේ අඩියක, අඩි එකහමාරක කාණුවක් දාලා විතරක් නෙමෙයි, ඒවා මෙහෙට ඇවිල්ලා, ආපහු මෙහෙට ඇවිල්ලා එහෙම යන්නේ. කෙලින් එන්නේ නැතුව එහෙන් මෙහෙන් ආවම වෙන්නේ අර එන ජල කඳට යන්න තැනක් නැහැ. අරක ඔක්කොම කඩාගෙන උඩින් එනවා. ඒකට මට අත්දැකීම් තියෙනවා. දැන් අර බටුවන්තුඩාව ප්‍රධාන පාරේ කරපු කාපට් එක පවා ඉවර වෙන්න යනවා. ඒක නගරිගේවත්තටත් බලපාලා තියෙනවා. එතකොට සභාපතිතුමනි, පාරක් හදන කොට බොහොම පැහැදිලිව ප්‍රමිතිය කියලා එකක් තියෙනවා. ඒ ප්‍රමිතිය තමයි අපි දන්න විදියට, ඒ කියන්නේ අගල් හතරේ ගල් දාලා තලලා, ඊළඟට අඟල් එකහමාරේ ගල් දාලා තලලා ඊට පස්සේ තමයි මධ්‍යම ප්‍රමාණයේ ගල් දාලා, තාර දාලා මේවා කරන්නේ. මේක කිසිම තැනක කරන්නේ නැහැ. අර එක්තරා කාලයක ප්‍රේමදාස අගමැතිතුමා ඉන්න කාලයේ යෝජනාවක් ගෙනාවා බොරළු දාලා පාරවල් හදන්න. නමුත් ඒක හැමතැනටම හරි ගියේ නැහැ. මොකද හේතුව බොරළු ගැලවිලා ගියාම මාර්ගය අබලන් වෙලා යනවා. ඉතිං ඒ නිසා මේක කිසිම තැනක මේ අය කරන්නේ නැහැ. දැන් අවුරුදු පහ යන්න ඉස්සෙල්ලා දන්වන්න කියලා තියෙනවා මේවා කරන්න කියලා. දැන් මේ අය කරන්නේ මොකක්ද කියලා බලන්න. දැන් උදාහරණයකට නගරිගේවත්ත බලන්න. ඇත්තටම මේක කරන කොට ලොකු වැරැද්දක් තියෙනවා. මේ කමිටුවක් තියෙනවා. අපේ තාක්ෂණ නිලධාරීන් ඒ වගකීම භාර ගන්න ඕන. මොකද හේතුව ඇත්තටම අඟල් හතරේ ගල් දාලා නැහැ ඒ වගේ. දැන් කරන්නේ අර කඩලා ගියපු තැන් වලට අඟල් දෙකේ ගල් ආයෙම දා ගෙන ගිහිල්ලා තාර ටික දාලා, වහලා දාලා තියෙනවා. දැන් තව මාස දෙකකින්, තුනකින් අවුරුදු පහ ඉවරයි. ඊට පස්සේ ආයෙම අරක කඩලා ගියාම ඒ අය ආයේ එන්නේ නැහැ. අවශ්‍යතාවය තියෙන්නේ දැන් කාටද, ඊට පස්සේ වගකීම එන්නේ කාටද, ප්‍රදේශයේ මන්ත්‍රීවරයාට. ඒකෙ ඉන්න ජනතාව ඊට පස්සේ තමුන්නාන්සේලාගේ, අපේ ඡන්ද දායකයෝ. එතකොට ඇවිල්ලා අපිට කියනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා, මම ගිහිල්ලා ඒක බැලුවා. තාක්ෂණ නිලධාරිතුමා කිවුවා ඒ ඉංජිනේරුතුමා කියපු විදියට කිවුවා පාර හදලා තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉංජිනේරුවරයා එහෙම කියලා තියෙනවානම් ඒ ඉංජිනේරුවරයා වැරදියි. ඔබතුමා ඉන්න ඕන අපි ඉන්න තැන. ඒ මොකක්වත් හින්දා නෙමෙයි. ඒ පාර

හරියට තිබුණම ඔබතුමාට ඒ පාර හදන්න කියලා ප්‍රශ්න එන්නේ නැහැ. ඔබතුමාට ඒ හම්බවෙන ප්‍රතිපාදන ටික වෙනත් ස්ථානයකට යොදවලා වෙනත් කටයුත්තක් කරන්න පුළුවන්. වෙන්දේසිකාරයොන්ගේ ඒවා අපි කරගහන්න ඕන නැහැ. ඔබතුමා මතක තියා ගන්න දැන් පාර හදලා තියෙන්නේ අඟල් දෙකේ ගල් දාලා. දැන් අහන්න කාගෙන් හරි මොකද එහෙම කරේ කියලා. තාක්ෂණ නිලධාරීන්ට අපිට කියන්න කියලා කියන්න. මම පාර කඩලා පෙන්වනවා අඟල් හතරේ ගල් දාලා නැහැ කියලා. එතකොට ඒක වැඩක් නැහැ. ගණන් ගන්න එපා. එතකොට දැන් තියෙන වෙන්දේසි ඉඩම් කිහිපය ගත්තට පස්සේ කපුහෙම්පල, එතනින් ගියාම රජගෙදර වත්ත වගේ මේ තියෙන සියලුම තැන්වල ගරු සභාපතිතුමනි පාර කඩලා ගිහිල්ලා තියෙන්නේ. එක තැනකින්වත් හරියට දාන්නේ නැහැ. ඒ නිසා මෙහි වගකීම ගන්න ඕන කවුරුවත් නෙමෙයි. වගකීම සම්පූර්ණයෙන්ම ගන්න ඕන ඒ අය. දැන් බොහොම පැහැදිළිවම ඔබතුමන්ලා අපි ගිහිල්ලා බලලා ඉවරවෙලා රජගෙදර වත්තේ තාර දාලා නැති නිසා අපි එන බව දැන ගෙන ඉස්සරහ ටික තාර දානවා. ඒ කමිටුවට නිකංවත් කිවුවේ නැහැ තාර දානවා කියලා. ඊට පස්සෙත් ඒ අය තාර දැම්මා. ඇත්තටම කරන්න ඕන ඉස්සෙල්ලම ගල් ටික එකතු කරන එකනේ. ඒක කරලා ඉවර වෙලානේ අඟල් හතරේ ගල් එලන්න ඕන. ඒක කරේ නැහැ. ඉතිං සභාපතිතුමනි, මම දැන් බය නැතුව කියනවා. මගේ ළඟ ඒ පින්තූර ටික තියෙනවා. කඩවන්නකෝ මේ තැන් දහයක් විතර. කැඩුවම පෙනේවි ඒවා දාලද නැද්ද කියන එක. ඉතිං ඒක හින්දා මම හිතන්නේ මේක සද්භාවයෙන් ගේන එකක්. අනිත් එක මේකෙන් පනින්න බැහැ දෙගොල්ලොන්ටම. මේකට ඔබතුමන්ලා වගකියන්න ඕන නැහැ. එතනින් ගියාම තාක්ෂණ නිලධාරීන් මේකට වගකියන්න ඕන. වෙන කවුරුවත් නෙමෙයි. තාක්ෂණ නිලධාරීන් විදියට ඒ අය වගකියන්න ඕන. කොහොමද ඒ සහතිකය දෙන්නේ අවුරුදු පහකට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමනේ අබේසේකර මන්ත්‍රීතුමා, ඔබතුමා තාක්ෂණ නිලධාරියෙක් වුණත් සම්පූර්ණයෙන්ම ඕවා කරන කොට ඔතන ඉන්න බැහැනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** බැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි ඉංජිනේරුවන්ගේ සහතිකය අරගෙන ගෙවන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක ගැන ඔබතුමයි, මමයි, දෙන්නම දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට අපි මොකද කරන්නේ කියලා කියන්නකෝ. අපිට පුළුවන්ද එතකොට තාක්ෂණ නිලධාරියාව පුද්ගලිකව සම්පූර්ණයෙන්ම වගකීමට බැඳෙනවා කියලා දෙන්න.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒකට තමයි කමිටුවක් පත් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ කමිටුවට යෝජනා දෙන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කමිටුව පත් කරපු එක ගැන මම දැනුවත් කරන්නම්. ඒ ටිකේ හරි කමිටුවේ කට්ටිය ගිහිල්ලා බලනවා මේක දාලාද නැද්ද කියලා. ඒ මොකක්වත් කරේ නැහැ. මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඒක ඉල්ලනවා. මේ වෙද්දි ඉතාම පැහැදිළිව ඉන්න. ඒකෙ ගෞරවය කවදා හරි දවසක ඔබතුමන්ලාට එනවා ඒ පාරවල් ටික කෙරුණම. ඊට පස්සේ ඒ ප්‍රතිපාදන ටික ප්‍රදේශයේ වෙනත් තැනකට යොදවන්න පුළුවන්. නැත්නම් දැන් බලන්න හැමතැන්වලම තව ටික දවසක් යනකොට වෙන දේ. දැනටම බලන්න පැතුම් උයනට මොකක්ද වෙලා තියෙන්නේ කියලා. මේ එක තැනක්වත් හරියට කරේ නැහැ. බෝක්කු දැම්මේ නැහැ. කාණු දැම්මේ නැහැ. කාණුව නිකං අලවාගෙන ගියා. ඉතිං ඔය දාන ඒවායේ එක යකඩ කම්බියක්වත් නැහැ. දැන් ඒ අය කරගෙන යන එක තමයි යකඩ පෙන්වන්න තැන් තැන් වලින් යකඩ කෑලි කපලා උඩින් හයිකරගෙන යන එක. යට ඉඳලා දාන්නේ නැහැ. ඉතිං ඒක හින්දා මම හිතනවා ගරු සභාපතිතුමනි, මම කරන ලද යෝජනාව නැවත ඔබතුමාට මතක් කරන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක අයින් කරන්න හේතුව නම් පුද්ගලිකව මට කියන්න බැහැ තාක්ෂණ නිලධාරි කෙනෙකුට ඒක ගෙවන්න කියලා. ඒ මට්ටමේ නම් මට කියන්න බැහැ. ඉංජිනේරුවෝ සහතික කරලා දුන්නට පස්සේ තාක්ෂණ නිලධාරීන්ට කරන්න දෙයක් නැහැ. ඉංජිනේරුවෝ සහතික කරලා දුන්නට පස්සේ තාක්ෂණ නිලධාරීට ඒක අභියෝගයට ලක් කරන්න බැහැ. එතකොට අපිට කියන්න බැහැ පුද්ගලිකවම මේ වගකීම ගන්න කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේ පාරක වගකීමක් සම්බන්ධව මේ අය බැඳෙන්නේ නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් අපිටත් ඕනකම තියෙන්නේ ඒකයි. සභාව මේකට ක්‍රියා කරන්නෙත් නැත්නම්, සභාවට මේකට වගකීමක් දරන්නත් බැරිනම්, ඔබතුමන්ලා මේ සභාවේ ගෙනාපු

යෝජනාව ප්‍රතික්ෂේප කරා. ඒක හැබැයි ප්‍රතික්ෂේප කරා කියලා ඔබතුමන්ලා කියනවා නම් ඒකත් ප්‍රතික්ෂේප කරනවා මම. මේ වරලත් ඉංජිනේරුවරුන් හැමකෙනෙකුටම මේක යවන්න. මම ගුණවර්ධන මහතාට නම් කතා කරලම කිව්වා. ගුණවර්ධන මහත්තයා ඔබතුමාට මුදල් පස්සෙම යන්න ඕන නැහැනේ, මේක මෙහෙමයි කියලා මම කිව්වා. ඇයි ඔබතුමන්ලා මේ වගේ ඒවා කරන්නේ කියලා මම කිව්වා. අපි දන්නේ නැහැ, අපිව දැනුවත් කරලා නැහැ කියලා කියන්නේ එතකොට. ඒක හින්දා මම කියනවා කරුණාකරලා මේකට තියෙන වගකීම පිළිබඳව බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක යවන්න ප්‍රශ්නයක් නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක යවන්න කියන එකත් එක්ක තමයි මම කිව්වේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** යවන්න ඕන නැහැ. ඒ අය ඒක ගැන දැන ගන්න ඕන. ඒ අයට වරළත් ඉංජිනේරුවෙක් විදියට අපි මේක යවනවාට වඩා ඒ අයගේ වගකීම ගැන ඒ අය දැන ගන්න ඕන. ඒ මට්ටමට අපි සභාවක් විදියට වැටෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකට මම මේක ඇතුළත් කරන්නේ වෙන දෙයක් නිසා නෙමෙයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම අහන්නේ ඒක නෙමෙයි. වරළත් ඉංජිනේරුවෙක්ට ඒ අයගේ වගකීම ගැන කියලා අපි ලියුම් යවන කොට මොකක්ද සභාවේ තත්ත්වය. මම නිකං අහන්නේ මන්ත්‍රීවරුන්ගෙන්. එතකොට ඒ අය වගකීම දන්නේ නැද්ද.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඕකට පියවරක් නොගත්තොත් හැමදාම ඔහොම තමයි.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඕකමනේ වෙන්නේ. දැන් මට ඕන ඇත්තටම අපි පෞද්ගලිකව හරි නීත්‍යානුකූල ක්‍රියාමාර්ගයකට යන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙමනම් ඕක කියලා දන්වන්න වෙන්නේ මෙන්න මෙහෙමයි කියලා. පොදුවේ කරන දෙයක් මේ. වෙච්ච දේවල් තියෙනවා කියලා කියන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දිගින් දිගටම මම පෙන්වන්නම්. මම ඔක්කොම සටහන් ටික ගත්තා. ඒ ඒ කාලවල් වලදී මම දැනුවත් කරලා තියෙනවා. හැබැයි ඒක වෙන්නේ නැහැ. ඒ අය කරලා දීපුවත් තියෙනවා. දැන් දාන්න ඕන ඒක නෙමෙයි. මේ අය කරලා තියෙන පාරට කොහොමද මේ සහතිකය දුන්නේ කොහොමද කියලා දාන්න ඕන. ඒක කර ගන්න පුළුවන්. එක තැනකට දාන කොට ඔය ඔක්කොම ඒවි එතකොට.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නැත්නම් පොදුවේ දාමු ඔයි ඉංජිනේරුවොන්ට. අපිට සම්බන්ධ අය ඉන්නවානේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මේකට මේ සාධාරණය ඉෂ්ඨ වෙන්නේ කොහොමද, ඒකට විධික්‍රමයක් කියන්නකෝ. අපේ තාක්ෂණ නිලධාරීන් වගකියන්න ඕන නැත්නම් වරළත් ඉංජිනේරුවරයා දෙන සහතිකයටත් වගකීමක් නැත්නම් මොකද කරන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සහතිකය දෙන කෙනාව ඕන අල්ලගන්න.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම පැහැදිළිව දුරකථනයෙන් කතා කරේ. ඒ හඬ පටිය පවා මගේ ළඟ තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකටද.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මම ගුණවර්ධන මහතාට කතා කරලා කිව්වා මේවාට සහතික දෙන්න එපා මෙහෙම මෙහෙමයි කියලා. ඔබතුමන්ලා මේවාට සහතික දීලා නිකං කුණු ගොඩවල් ගා ගන්න එපා කියලා කිව්වා. ඒක තියෙනවා. අපිට ඕන තරම් දේවල් කියන්න තියෙනවා දිගටම. මේකට විසඳුමක් තියෙන්න ඕනනේ සභාපතිතුමා. ඔබතුමන්ලා අපි අන්තිමට වැඩක් නැතුව යනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර වගේම වැඩක් තමයි වෙන්නේ. ටෙස්ටින් කරලා රිපෝට් ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** එක තැනක විතරක් නෙමෙයි හැමතැනකම එකයි. තව මාස කිහිපයකින් ඒකෙ අවුරුදු පහ ඉවරයි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීවරුන්ට පොදුවේ කියන්න ඕන කාරණයක් තියෙනවා. දැන් සභාපතිවරයා විදියට මම තමයි ඒ හැමදේකටම මුහුණ දෙන්න ඕන. දැන් ඔය කියනවා වගේම බෝපෙ පෝද්දලට එන්නේ නැහැ කියලා ගොඩක් අය කතා කරලා කියනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං එන්න ඕන නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපි බෝපෙ පෝද්දල ඉඩම් වෙන්දේසි කරන්නේ නැහැ කියලා කියනවා. ඊට පස්සේ අපි තව මේවා එකක් දැම්මානේ. දැන් ඒකත් අපි බොහොම සද්භාවයෙන් දැම්මේ. අපි නොදකින පැත්තක් මේ හැම එකකටම තියෙනවා. අපි කොන්දේසියක් දැම්මානේ සභාවෙන් මේ පාරවල් කරන්න ඕන කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඉතිං දාන්නකෝ. ඒක හොඳයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ආයතන හැම එකකින්ම කතා කරලා කිව්වා මින් ඉදිරියට අපි කරන්නේ නැහැ කියලා. ඒ අයගේ කොන්ත්‍රාත් කරන අය ඉන්නවා කිව්වා. ඒ අයගේ රේට්ස් අපේ රේට්ස් එක්ක අහසට පොළව වගේලු. මේ කියන ඒවා සභාව දැනුවත් කරන්න ඕන හින්දා මම මේ කියන්නේ. අද උදෙත් ඇවිල්ලා කිව්වා ඕක ගැන කතාවක්. ඒ අය පාරවල් කපන අතරේදී ඉඩම සුද්ධ කර ගන්න ඕන වුණාම ඉඩමත් සුද්ධ කරගන්නවාලු. ඒවත් කර ගන්නවාලු. ඉඩමේ තියෙන සියලු දේවල් ඒ අය කර ගන්නවාලු. පාරවල් විතරක් නෙමෙයිලු කරන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒවා ප්‍රමිතියෙන් තොරයි. ප්‍රමිතියට නොකරනවා නම් වැඩක් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ප්‍රමිතිය අපි පරීක්ෂා කරන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේ ටිකනේ දැන් කතා කරන්නේ. දැන් උදාහරණයක් මම කියන්නම්. ඕපාත ඉඩමක් වෙන්දේසි කරනවා. මම දන්නේ නැහැ තැන කොතනද කියලා. මට රුක්මන් කියලා කෙනෙක් කතා කරා. මම කවුද කියලා දන්නේ නැහැ. ඊට පස්සේ හෝම්ලෑන්ඩ් ආයතනයෙන් කතා කරා. මෙහෙම දෙයක් තියෙනවා කියලා එයාලා දන්නේ නැහැ කිව්වා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිට මොකක්ද තියෙන වුවමනාව. මේ තියෙන ඉඩම් ටික විකුණවන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි අබේසේකර මන්ත්‍රීතුමා අපිට එහෙම කියන්නත් බැහැ. මිනිස්සුන්ට ඉඩම් අවශ්‍යතාවය තියෙන නිසා තමයි මිනිස්සු ඒවා ගන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපේ මිනිස්සුනේ ගන්නේ. ඒ නිසා ඒ මිනිස්සුන්ට හරි දේ දෙන්න ඕනනේ. ඔය ඉඩම මොකක්ද කියලා දන්නවාද, උපාලි කලංසූරිය කියන මගේ යාළුවාගේ ඉඩම ඔය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම ඇත්තටම දන්නේ නැහැ ඒක මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඔය උපාලි කලංසූරියගේ ඉඩම. ඇත්තටම ඒක ෂෝක් ඉඩමක්. ඇයි ඒක හරියට කරන්න බැරි.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා කියපු කතාව ඇත්ත. මටත් ඒක ගැන ෆිනෑන්ස් ආයතන කිහිපයක්ම කිව්වා. මගේ හිතමිත්‍රයෙක් ඉන්නවා. එයත් ඉඩමක් ගන්න බලලා ගත්තේ නැහැ අපේ බලප්‍රදේශය තුළ. ප්‍රියන්ත මන්ත්‍රීතුමත් ඒක ගැන දන්නවා. ඉතිං එතනදී ඒක මිලදී ගත්තේ නැහැ. ඒ අය කියනවා ඉඩම අරගෙන සභාවෙන් කියන විදියට ඇස්තමේන්තු හදලා ඒක කරන්න ගියාට කරන්න බැහැ කියලා. සභාවෙන් හදන ඇස්තමේන්තුවට 20% ක ලාභයක් තියෙනවා කියලා කිව්වා. ඒ ඔක්කොම දාලා හැදුවම ඒ අයට ඒ ගාණට කරන්න බැහැ කියලා කිව්වා. මේ අය කොන්ත්‍රාත් කරන කොට එහෙම කරන්නේ නැහැනේ. අනිත් එක අපේ වැරැද්දක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය වැරදි මතයක් බෝපෙ පෝද්දලින් පිට නිර්මාණය කරනවා. මේ මන්ත්‍රීවරු සල්ලි ගන්න ඕන හින්දා, තමන්ගේ කොන්ත්‍රාත්කරුවන්ට මේ වැඩ දෙන්න ඕන හින්දා, ගනිපු සභා තීරණයක් කියලා කියනවා මේක. මන්ත්‍රීවරුන්ට තමන්ට හිතවත් කොන්ත්‍රාත්කරුවන්ට මේ වැඩ දෙන්න ඕන හින්දා ගනිපු තීන්දුවක් කියලා තමයි මේක ඒ අය සමාජගත කරන්නේ. ඒකෙ ලොකු හානියක් සභාවට තියෙනවා.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** සභාපතිතුමා මෙහෙම දෙයක් තියෙනවානේ. අපි සභාවෙන්නේ අබේසේකර මන්ත්‍රීතුමා මේක කරන්නේ. සභාවේ කමිටුවකින්නේ පාරවල් මෙහෙම දාන්න, කාණු මෙහෙම දාන්න කියලා කියන්නේ. ඒ වගේම මන්ත්‍රීවරු කරන යෝජනා තමයි සභාවෙන් කරන්නේ.

එතකොට තාක්ෂණ නිලධාරීන් ඇස්තමේන්තුව හදනවා. එතකොට අධීක්ෂණය කරන්නේ තාක්ෂණ නිලධාරියා. දැන් මෙතන තියෙන ප්‍රශ්නය ඒ අය මේක හැඳුවට කමක් නැහැ, සභාවේ ඉන්න තාක්ෂණ නිලධාරීන් මේක අධීක්ෂණය කරන්න ඕන. ගිහින් බැලුවා නම් හරි මේක ප්‍රමිතියට හදලද නැද්ද කියලා. හරියට අධීක්ෂණය කරානම් එතකොට ප්‍රශ්නයක් නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් මෙහෙම කරමු. අපේ තාක්ෂණ නිලධාරීන්ට ගල් එලුවට පස්සේ පෙන්වන්න කියලා කියමු. අඟල් හතරේ ගල් එළලා පෙන්වන්න ඕන. අඟල් එකහමාරේ ගල් දාලා පෙන්වන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒ අය කරපු දෙන්. අපේ තාක්ෂණ නිලධාරීන් අධීක්ෂණය කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක කරන්න ඕන තමයි. නමුත් ඒක කෙරුණේ නැහැනේ. අපි මුල ඉඳලම කිව්වා අපේ අධීක්ෂණයෙන් ප්‍රමිතියට මේක කරන්න ඕන කියලා. නමුත් ඒක කෙරුණේ නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** අපේ තාක්ෂණ නිලධාරීන් ගිහින් අධීක්ෂණය කරනවා නම් ප්‍රශ්නයක් නැහැ. ඒ අය හරියට කරනවාද කියලා බැලුවා නම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙම දෙයක් තියෙනවා. ෆිනෑන්ස් කියන ඒවා දහයක්, පහළොවක් එක පාර කරන්නේ නැහැනේ. ෆිනෑන්ස් එකයි, දෙකයි කරන්නේ. ඒක බලන්න බැරි කමක් නැහැ.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක කරන්න බැරිකමක් නැහැ. ඒක කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ අය අපිට දැනුම් දෙන්න ඕන අහවල් දවසේ පාර හදනවා, තාර දානවා කියලා. එතකොට තාර දාන්න කලින් බැලුවම හරිනේ. ගල් එළන වෙලාවේදී ළඟ ඉන්න ඕන නැහැ එතකොට.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපිවත් දැනුවත් කරලා ඒ ප්‍රදේශයේ ඉන්න මන්ත්‍රීවරයාටත් ඒ වගකීම භාර දෙන්න. එතුමාටත් ගිහින් ඒ පාර බලන්න කියන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔය ක්‍රමවේදය නොකෙරුන නිසා තමයි ඔහොම වුණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අපිට බැරිද සැලසුම් කමිටුවෙන් දෙන්න මෙන්න මේ පියවර කරන්න. අඟල් හතරේ ගල් දාන්න කියලා. ඒක දෙන්නේ නැහැනේ සැලසුම් කමිටුවෙන්. එතනනේ වැරැද්ද තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** සභාපතිතුමා ඒක දෙන්න ඕන නැහැ. පාරක් හදනකොට ප්‍රමිතියක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඕක මෙහෙමයි මන්ත්‍රීතුමා. ඒක දෙන්නේ නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාරක් හදන කොට ඔක්කොම එක වගේ කරන්නේ නැහැනේ. පාරක් හදන කොට තැන් තැන් වලදී ඒක වෙනස් වෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙදී රිංගන්නේ එතනින්. අපි දෙන්න ඕන පාර හදන කොට විස්තර. මේ පාර කොන්ක්‍රීට්ද කරන්න ඕන, මේ පාර ඒ.බී.සී. දාලද කරන්න ඕන, මේ පාර අඟල් හතරේ ගල් දාලාද කරන්න ඕන කියලා විස්තර දෙන්න ඕන.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒ.බී.සී. ගල් දාලා කොහේවත් පාරවල් කරන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සමහර කරන ඒවා තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒකට පාර කරන්න කලින් අපි ඒ නිර්දේශ දෙන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ.බී.සී. දාන්නේ අඟලක් දෙකක් නෙමෙයිනේ. ඒකට ලොකු ලේයර් එකක් දාලා කරනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මෙහෙම තියෙන්නේ සභාපතිතුමා. ඒ.බී.සී. දාලා කරනවට මෙහේ කවුරුවත් නිර්දේශ කරන්න එපා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා දන්නවාද අබේසේකර මන්ත්‍රීතුමා කාපට් කරන පාරවල් කොහොමද කාපට් කරන්නේ කියලා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කාපට් කරන පාරවල් කොහොමද කරන්නේ කියලා දන්නවා. ඉස්සෙල්ලා පාර කරලා කාපට් කරන තාක්ෂණය එක්ක කාපට් එක එළාගෙන යන්න තියෙන්නේ.

(ගරු මන්ත්‍රී ප්‍රියන්ත කේ. බටුවන්තුඩාව මැතිතුමා, ගරු මන්ත්‍රී එන්.එම්. අනිල් බන්දුතිලක මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** හරිනම් කලින් පාර හදන්න ඕන. දැන් කරන්නේ තාර දාපු ඒවාම කාපට් කරන එකනේ. එතකොට උඩින් කාපට් එක එළාගෙන යනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමහරි සැලසුම් කමිටුවෙන් දුන්නම ඉවරයි සංවර්ධන බලපත්‍රය දෙනකොට මෙන්න මේ පාර මේ විදියට කරන්න කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කරන ක්‍රමවේදයකට අපේ අධීක්ෂණය යටතේ කරන්න දෙන්න ඕන. ඕක කරන්න බැරි හේතුවක් තියෙනවා සභාපතිතුමා. හැම පාරක්ම එකම විදියටම නෙමෙයිනේ කරන්නේ. සමහර පාරවල් වල තැන් තැන්වල ස්වභාවයන් වෙනස්. ඒ අනුව සාමාන්‍යයෙන් කරන විදිය වෙනස් වෙනවානේ. දැන් ඒකෙදී ප්‍රමිතියකට කරන්න පුළුවන් ඒවා තියෙනවා. සමහර තැන්වල මඩ ගොහොරු තියෙනවා. සමහර තැන්වල පහත්, තවත් සමහර තැන්වල ගල් තියෙනවා. එතකොට ඒවා කරන කොට ඒ තැන් වලදී මේක වෙනස් වෙනවා. ඉතිං එහෙම නම් පාර හදන්න කලින් අපි අනුමත කරන්න කලින් කරන්න ඕන තාක්ෂණ නිලධාරියා පාර බලලා මේ මේ තැන් වලින්, මේ මේ විදියට කරන්න ඕන කියලා, කරන්න ඕන ක්‍රමය කියන්න ඕන පාර හදන්න කලින්. එතකොට ඒ අනුව කරනවද කියලා අධීක්ෂණය කරන්න පුළුවන්. අපි නිශ්චිත ක්‍රමවේදයක් ඒකට යෝජනා කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් එතන තියෙන වැරැද්ද මේකනේ. ඔතන රිංගලා යන තැන තමයි මම දන්න විදියට මේක. ඔය ෆිනෑන්ස් එක කරන අය කියනවා එයාලව දැනුවත් කරලා නැහැ කියලා. අඟල් හතරේ ගල් දාන්න ඕන කියලා කිවුවේ නැහැ කියනවා. මම මේ කියන්නේ පොදුවේ කියන කාරණය. අපි අරහේ කරන්නේ මෙහෙමයි, මෙහේ කරන්නේ මෙහෙමයි කියනවා මේක ගැන ඇහුවම. එයාලට එහෙම අඟල් හතරේ ගල් දාන ක්‍රමවේදයක් නැහැ කියලා කියනවා. එහෙම සභාවල් තියෙනවා අබේසේකර මන්ත්‍රීතුමා. ඒ නිසා හොඳම දේ අපි සැලසුම් කමිටුවෙන් දෙන්න ඕන මේක මෙන්න මේ විදියට කරන්න ඕන කියලා. එහෙම දීලා තාර දාන කොට අපේ නිලධාරියෙක් ඒක අධීක්ෂණය කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සංවර්ධන බලපත්‍රය දෙන්න කලින් ඒවා කරලා තියන්න කියලා අපි කියන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙම කරනවානම් හරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක සභාපතිතුමා අපි සංවර්ධන බලපත්‍රය දෙන්න කලින් කරන්න ඕන. කොන්දේසි ටික අපි දෙන්න ඕන. නැත්නම් ඒ අය රිංගලා යනවා.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** අපි මොන හේතුවක් නිසාවත් ගරු සභාපතිතුමා මෙන්න මෙහෙම මේක කරන්න ඕන, තාර දාන්න ඕන මෙහෙමයි කියලා දෙන්න ඕන නැහැ. කොන්ක්‍රීට් දාන්න ඕන මෙහෙමයි කියලා අපි දෙන්න ඕන නැහැ. පාරවල් කොන්ක්‍රීට් කරනවා නම් ඒක කරන ප්‍රමිතියක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි දැන් ඔය දෙකම කරන්න බැහැ. අරක අයින් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඒක තමයි මම කිවුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අරක අයින් කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** මොකක්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සභාවෙන් කරනවා කියන එක. මේ දෙකම යන්න බැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මේක අහන්න. ඒක අයින් කරනවා නම් ඒ අය පාරවල් කරන්න ඕන ප්‍රමිතියක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන ක්‍රමය කියන්නකෝ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** දැන් මෙහෙම තියෙන්නේ. දැන් අපි කියනවා පාර කොන්ක්‍රීට් කරන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට ඉංජිනේරුවා දෙන ඇස්තමේන්තුව සැලසුම් කමිටුවට ඉදිරිපත් කරහම හරිනේ. එතකොට ඒක කොහොමත් දන්නවානේ මේ වැඩේ කරන්න ඕන කියලා. ඒක අනුව අධීක්ෂණය කරහම ඉවරයිනේ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** ඊළඟට දැන් කියන්න පාර කොන්ක්‍රීට් කරනවා නම් මොකද වෙන්නේ. අපි දන්නවා පාර කොන්ක්‍රීට් කරන කොට මොකක්ද කරන්නේ කියලා. බලන් හිටියොත් සිමෙන්තිත් දානවා, ගලුත් දානවා, වැලිත් දානවා. හැබැයි එකක් කරනවා. වතුර වැඩියෙන් දාලා පාර දා ගෙන යනවා. කොන්ත්‍රාත්කාරයාට කරන කොට ගෙවන්නේ මීටර් ගාණටනේ. එතකොට එහෙම කරලා යනවා. සිමෙන්ති ටික බහිනවා. කොන්ක්‍රීට් දැම්මට වැඩක් නැහැ. ගලවලා යනවා. ඉතිං ඒක හින්දා ඒක කරන ප්‍රමිතියට හරියට කරන්න ඕන. ඒක නොකෙරුණොත් ඉවරයි. එතකොට අපිට ඇත්තටම එකක් තියෙනවා. සභාවකින් උපදෙස් දෙන්න යන්න ඕන නැහැ පාරක් මේ ප්‍රමිතියට කරන්න ඕන කියලා. තාර දානවා නම් ප්‍රමිතියක් තියෙනවා. ඒකට අපි අඟල් හතරේ ගල් දාන්නත් ඕන. එහෙම කියලා මොන විදියකින්වත් දෙන්න ඕන නැහැ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** සභාපතිතුමනි, මේ මුකුත් ඕන නැහැ. ප්‍රාදේශීය සභාවේ වැඩ කරන ක්‍රමයක් තියෙනවානේ. පාරක් කරනවා නම් කරන ක්‍රමයක් තියෙනවා. කොන්ක්‍රීට් දානවා නම් කරන ක්‍රමයක් තියෙනවා. අපේ තාක්ෂණ නිලධාරීන් තමයි ඇස්තමේන්තුව හදන්නේ. අන්න ඒ විදියට මේක කරන්න කියන්න. වෙන මුකුත් ඕන නැහැ.

**ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා ඃ-** කිසි තැනක අඟල් දෙකේ ගල් දාලා කරන්න කියලා නැහැනේ.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අඟල් හතරේ ගල් දාලා, ඊට උඩින් අඟල් එකහමාරේ ගල් දාලා, චිප් ගල් දාලා, තුන්කාලේ ගල් දාලා කරන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ඒක හොඳයි සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** ඒ ක්‍රමයට කරන්න. එතකොට කිසි ප්‍රශ්නයක් නැහැ. ඒක ඒ අයට කරන්න කියන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එහෙම නම් දැන් මේක මෙහෙම හරිනේ. ඉංජිනේරුවා දෙන ඇස්තමේන්තුව සැලසුම් කමිටුවට අරගෙන ඊට පස්සේ අපේ අධීක්ෂණය යටතේ, අපේ තාක්ෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ කරන්න ඕන.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එතකොට ඉංජිනේරුවා ඒක දෙන්න ඕන අපේ සභාවෙන් කරන විදියට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** පාර දාන්න කලින් පාරේ ස්වාභාවය වෙනස් වෙන තැන්වල ඒ ඒ විදියට දාන්න කියලා අපි නිර්දේශ කරන්න ඕන. ඒ පාර අපි කියන්න ඕන මේ විදියට කරන්න කියලා. නැත්නම් බැහැනේ. ඒක දුන්නට පස්සේ අරයා හරහා ඒ විදියට එන්න ඕන. නැත්නම් කවදාවත් අපි කියන දේ කරන්නේ නැහැ. අනිත් එක ගරු සභාපතිතුමා මේ වෙන්දේසි ඉඩම් වල ප්‍රශ්න තියෙනවා. හැමදාම ඉඩම අනුමත කරන්න දාන්නේ ඔක්කොම කරලා ඉවර වෙලා. මම කියනවා මේ දැනුත් තියෙනවා ඒවාට සාක්ෂි. ඉඩම දැන් වෙන්දේසියට දාන්නේ සංවර්ධනය කරලා නෙමෙයි. ඉඩම කට්ටි කරලා ඒ ප්ලෑන් එක නෙමෙයි අපිට දාන්නේ. සම්පූර්ණ ඉඩම මේ අනුමත කරන්නේ. හරි විදියටනම් සභාවට ඉඩමක් අනුමත කරන්න දාන්න ඕන කිසිදු වෙනස්කමක් නොකර. හැබැයි දැන් සිද්ධ වෙන්නේ මොකක්ද කියලා බලන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හැබැයි ඒක තියෙන්නේ නාගරික සංවර්ධන අධිකාරිය යටතේ. මොකද, ඒ අයගෙන් ක්ලියරන්ස් ගන්න කියලා අපි කිවුවොත් ඒ අය ක්ලියරන්ස් දෙන කොට බලන්න ඕන ඉඩම සංවර්ධනය කරලද, නැද්ද කියලා. එහෙම එකකුත් තියෙනවා. එතකොට ඒ අය තමයි දෙන්නේ අදාළ ආයතන වලින් නිර්දේශ ගේන්න කියලා. ඒක කරන්නේ නාගරික සංවර්ධන අධිකාරියෙන් ක්ලියරන්ස් ගන්න ගියාම.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, සංවර්ධන බලපත්‍රයක් ගන්න කලින් අපෙන් අනුමත කරන්න ඕන නැද්ද, ඉඩමට අනුමැතිය ගන්න ඕන නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නාගරික සංවර්ධන අධිකාරියෙන් ක්ලියරන්ස් ටික ගන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** එතකොට අපෙන් අනුමත කරන්න ඕන නැද්ද, ඉඩමේ ප්ලෑන් එක අපෙන් අනුමත වෙන්න ඕන නැද්ද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අර ලියකියවිලි ටික ආවට පස්සේ තමයි අපි අනුමත කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** සංවර්ධන බලපත්‍රය සහිතවද එන්න ඕන. දැන් ප්‍රශ්නය තියෙන්නේ ඒකයි. එතනදී ගරු සභාපතිතුමා ප්‍රශ්නයක් වෙනවා. සංවර්ධන බලපත්‍රය දීපු ගමන් අර මිනිස්සු අරගේ ඔක්කොම ඩෝසර් කරනවා. එතකොට ඉඩම සම්පූර්ණයෙන්ම වෙනස් කරලා තමයි අපිට මේක අනුමැතියට දාන්නේ. ඔය නිසාම තමයි ප්‍රශ්නය තියෙන්නේ. සමහර බෑවුම් තියෙන්න ඕන තැන් ඒ අය වෙනස් කරනවා. එහෙම වෙනස් කරහම පහුකාලයේදී අතුරු ප්‍රශ්න පැන නගිනවා. එතකොට අපිට ආපහු ගොඩකරන්න බැහැනේ. කපලා දාන්න පුළුවන්. නමුත් ගොඩ කරන්න බැහැ. ඒ නිසා මේ ප්‍රශ්නයට නිශ්චිත ක්‍රමවේදයක් නාගරික සංවර්ධන අධිකාරිය එක්ක කතා කරලා විසඳුමකට යන්න. මේ තියෙන ප්‍රශ්න ටිකට අදාළව ඒක බලන්න. නැත්නම් හැමදාම අපි මේකෙ කෑ ගහනවා විතරනේ. බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව එක්ක වැඩ කරන්න බැහැ කියන්නේ ඒකනේ. දැන් අපි ඉන්න ඕන කොන්ත්‍රාත්කාරයෝ හරි සමාගම් හරි වෙනුවෙන් පෙනී සිටින්නද, නැත්නම් මේ තියෙන ප්‍රශ්න ටික අවම කර ගෙන ප්‍රදේශයේ සංවර්ධන වැඩ කටයුතු ටික කරන්නද, ඒක අපි තීරණය කර ගන්න ඕන. ගරු සභාපතිතුමනි, මේ වැඩේට අපි කලින් මේ සභාවේ යෝජනා කර ගත්තා වගේ මොනවා හරි කොන්දේසි මාලාවක් දෙන්න ඕන ඒ ආයතන වලට කතා කරලා. ඒ අය එක්ක කතා කරලා මේකට එකඟතාවයකට යන්න ඕන.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** මේ වෙන්දේසි සමාගම් වලින් කරන ඉඩම් ගැන ඔක්කොම කතා කරනවා.

(ගරු මන්ත්‍රී ප්‍රේමලාල් අබේසේකර මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, අද සිකුරාදා දවස නිසා මම පල්ලියට යන්න ඕන. මම අර එන ගමන් දෙයක් දැක්කා. ඒක සභාවේ යෝජනා වලට දාලා නැහැ. අර පින්නකොළ දූව පාරේ, පාර හරහා බටයක් දාලා තමයි වතුර බස්සවලා තියෙන්නේ. ඒක අඩි 08 ක විතර පාරක්. ඒක කැඩිලා වතුර උතුරලා නිසා දැන් එතන මඩ වෙලා. ඒකට පොඩි කාණු කෑල්ලක් හදලා දෙන්න. එතන මීටර් 2 ක් 3ක් විතර ඇති. පොඩි කාණු කෑල්ලක් තියෙන්නේ. ඒකට කොන්ක්‍රීට් ටිකක් දාලා දෙන්න. ඒක මම යෝජනා කරනවා. මම ඒක ලිඛිතව දෙන්නම්. හදිසි යෝජනාවක් විදියට ඒක දාන්න. තුන් හතර දෙනෙක් අත්සන් කරලා මම ඒකට ලියුමක් දෙන්නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක න්‍යාය පත්‍රයට යන්න ඕන.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙමනම් ඒක ඊළඟ මාසයේ තමයි කරන්න වෙන්නේ. පොඩි මේවා එකක් තියෙන්නේ.

අනිත් එක සභාපතිතුමා ඔබතුමන්ලා සියළු දෙනාටම සුභ අළුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා සිංහල දෙමළ අළුත් අවුරුද්ද වෙනුවෙන්. ඒකට අපගේ උණුසුම් සුභ පැතුම් මේ අවස්ථාවේදී පුද කරනවා. ඔබතුමන්ලා අවුරුද්ද පටන් ගන්න කොටම අපි බඩගින්නේ ඉන්න පටන් ගන්නවා. අපි නෝම්බු පටන් ගන්නවා 14 වෙනිදා ඉඳගෙන. ඒක නිසා අපි සුහදව සිංහල දෙමළ අළුත් අවුරුද්ද සමරනවා වගේම අපේ නෝම්බු අවුරුද්දත් අපි ඉතාම සංතෝෂයෙන් සමරනවා කියලා ප්‍රකාශ කරමින් මම නික්ම යනවා. නෝම්බු අවුරුද්දට කලින් අපේ ප්‍රදේශයේ තියෙන වීදි ලාම්පු ටික අළුත්වැඩියා කරලා දෙන්න. රාත්‍රී කාලයේදී තමයි නෝම්බු කාලසීමාවේදී ආගමික කටයුතුවල වැඩිපුර නිරත වෙන්නේ. ඒ නිසා ඒකට අවශ්‍ය කටයුතු සලසලා දෙන්න. හැම සභා වාරයකදීම ඒක කරා. මම දන්න කාලයේ ඉඳන්ම ඒක කරා. මම 2002 ඉඳලා ඒක දන්නවා. ඔබතුමත් ඒක දන්නවා. සතියකට වගේ කලින් ඉඳලා ඒ පැත්තේ ලයිට් ටික හදලා දෙන එක කරනවා. මේ සැරේ ඒක පොඩ්ඩක් ප්‍රමාද වුණා. හෙට අනිද්දම ඒ ටික කරලා දෙන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හෙට පුළුවන්.

**ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා ඃ-** එහෙමනම් බොහොම ස්තුතියි මම යනවා සභාපතිතුමා, සුභ අළුත් අවුරුද්දක් වේවා සියළු දෙනාටම.

(ගරු මන්ත්‍රී එම්.එන්. හුසේන් කියාස් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**<u>ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, සුභ දවසක් වේවා සියළු දෙනාටම. පැමිණිලා ඉන්න නිලධාරි මණ්ඩලයෙන් සහ මාධ්‍යවේදීන් ඇතුළු සියළු දෙනාගෙන්ම අවසරයි.

ගරු සභාපතිතුමනි, මම මුලින්ම මගේ අවස්ථාවේදී ඔබතුමාගේ අවධානය යොමු කරනවා. මම යෝජනා කිහිපයක් යොමු කරා. ඉන් එක යෝජනාවක් ඔබතුමා යම් හේතුවක් ඉදිරිපත් කරලා ඉවත් කරලා තියෙනවා. ඒ යෝජනාව මම ඉදිරිපත් කලේ මාම්පිටියේ ඉඩම සම්බන්ධයෙන්. ඒක ඔබතුමා දන්නවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට මන්ත්‍රීතුමා අපි මාස දෙකකට කලින් යෝජනාවක් ගෙනල්ලා තියෙනවා එතන භොජුන්හලක් හදන්න. ඒ නිසා මේ යෝජනා දෙක පරස්පරයි. ඒ යෝජනා දෙක පටලැවෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මට ඒ සිද්ධිය මතකයි. ඒ ඉදිරිපත් කරපු යෝජනාව සම්බන්ධව මට මේ කාරණය ඉදිරිපත් කරන්න තියෙනවා. ඒ ඉඩමේ ප්ලෑන් එක මට ඉදිරිපත් කරලා තියෙනවා. ඒකෙ පැහැදිළිව සඳහන් කරනවා මේක ක්‍රීඩා පිට්ටනිය කියලා. ක්‍රීඩාංගනයට වෙන් වෙච්ච ඉඩමක් මේක. ඒ ගෙවල් පහළොව සඳහා. ඒක නිවාස සංකීර්ණයක්. මේක ඇවිල්ලා නිවාස යෝජනා ක්‍රමයක්. ඒ යටතේ ලබා දීපු නිවාස පහළොවක් මේ. ඒ නිවාස පහළොවේ නිවැසියන් වෙනුවෙන්, පදිංචිකරුවන් වෙනුවෙන් ඒක වෙන් කරලා තියෙනවා. එතකොට අපි මේක කොයි තරම් දුරට සාධාරණද කියලා බලන්න ඕන. නිශ්චිත කාරණාවකට වෙන් කරපු ඉඩමක් විදියට තියෙන එකක් සභාවට වෙනත් කටයුත්තකට ගන්න බැහැ ඒ ප්‍රදේශවාසීන්ගේ අනුමැතියක් හෝ එකඟතාවයක් නැතුව. ඒක බලහත්කාරයෙන් කරන්න යන එක සාධාරණ නැහැ. ඒක පළවෙනි කාරණය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මන්ත්‍රීතුමා මෙහෙමයි. ඔතන කතාව ගත්තම ඔය ඉඩමට අපිට ප්‍රාදේශීය ලේකම් දීලා තියෙනවා ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් කියලා, ඒක තේරුණාද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔව් ඒක පැහැදිළියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔතන ගෙවල් පහළොවයි තියෙන්නේ. ඔතන ක්‍රීඩාපිටියක් කියන එක තිබුණට ඔතන ක්‍රීඩා කරන්නේ අපි ඒක සභාවෙන් මොකකට හරි ගන්නවා කිවුවම විතරයි. ඒක හොයලා බලන්න. පහුගිය දවස්වල එතන වොලිබෝල් ක්‍රීඩා පිටියක් හදලා තියෙනවා. නමුත් ඒක ඇතුලේ තියෙන්නේ වැලි ගොඩක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක මම දැක්කා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම හැම පැත්තෙන්ම සාධාරණය ගැන කතා කරන්නේ. ඔබතුමා එක පැත්තක් අරගෙන බලන්න එපා. සභාපතිවරයා විදියට මම හැම පැත්තම බලන්න ඕන. ඔතන තියෙන ගෙවල් පහළොවේ ඉන්නවද සෙල්ලම් කරන අය. මම ඒකට අභියෝග කරනවා. ඔය ගෙවල් පහළොවේ අයගෙන් බහුතරයක් අය දැන් මෙහේ පදිංචි නැහැ. ඒ අය කොළඹ ඉන්නේ. මම කියන්නේ මෙහෙමයි. ඔය කියන තර්කයේ පොඩි සාධාරණයක් තියෙනවා. ඉතිං අපි ඒකටත් ඉඩක් හදන්න ඕන. ඒ අය කියන්නේ ගෙදරක මොකක් හරි උත්සවයක් වුණොත් වාහනයක් පාර්කින් කරන්න ඉඩ තියෙන්න ඕන කියලා. එතන පොඩි සාධාරණයක් තියෙනවා. ඉතිං අපි ඒක මත මේක කියන්න බැහැ. අපි එහෙම නම් කියනවා දැන් කලේගාන සභාව සතු භූමිය තියෙන්නේ පොළ භූමිය සඳහා. එහෙමනම් අපි දැන් ඒකෙ පොළ තියාගෙන යනවා ජීවිත කාලයටම. එහෙමනම් අපිට ඒකෙ ඉදිකිරීම් කරන්න බැහැ. නමුත් අපි ඔතන වෙන දෙයක් කරන්න හැදුවේ සද්භාවයෙන්. ඒක අද මේ බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාවට තියෙන වටිනාම ඉඩමක්. ඉතිං ඒකෙදි කාටත් පුළුවන් විදියට ඒක කරන්න ඕන. ඒ අයටත් කඩ කාමර දෙකක් විතර දෙන්න පුළුවන් ඉල්ලනවා නම්. අපි බැලුවේ එතන භොජුන් හලක් හදන්න. ඒකට කෝටියක විතර මුදලක් ආවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, ඒ ප්‍රදේශවාසීන් කියන දේ මෙහෙම තියෙන්නේ. එයාලා ඉල්ලා සිටින්නේ මේක මෙහෙම කරන්න කියලා. මේක ඒ ප්ලෑන් එකෙන් මේ අය වෙනුවෙන් නිශ්චිතව වෙන් කරපු ඉඩමක්. ඒ නිවාස සංකීර්ණය වෙනුවෙන් ඒක තියෙන්නේ. ඒක පැහැදිළිව සඳහන් වෙනවා. එතකොට ඒ අය කියන්නේ මෙතෙක් කලක් මේ ඉඩම පොදු කටයුතු සඳහා භාවිතා කරා කියලා. ඒකෙ පොඩි ගොඩනැගිල්ලක් තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ පොඩි ගොඩනැගිල්ල තව මාස එකහමාරකින් දෙකකින් කඩාගෙන වැටෙනවා. ඒක හදන්න කියන්න ඒ අයට ඉස්සෙල්ලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක නඩත්තු කරන්න පුළුවන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක හදන්න බැහැ. ඒක කඩන් වැටෙනවා. කොහොමත් ඒ ගොඩනැගිල්ල අයින් කරන්න ඕන.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක කන්ඩම් කරලා තියෙනවා වෙන්න පුළුවන් ඒ ගොඩනැගිල්ල දිරාපත් වෙලා නිසා. දැන් ඒක ඉදිකරලා කාලයක් වෙනවානේ. එක්දහස් නමසිය හැත්තෑ ගණන් වල ආරම්භ කරපු නිවාස සංකීර්ණයක් මේක. ඇත්තටම ඒ කාලය තුළ සහ මේ කාලය තුල අවුරුදු හතළිහක් විතර

වෙනවා. ඒ වෙනකොට වෙන්න පුළුවන් කාරණා ගොඩක් තියෙනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඒ නිවාස සංකීර්ණයේ පදිංචි ප්‍රදේශවාසීන් ඉල්ලා සිටින්නේ ඒක පොදු කටයුතු සඳහා වෙන් කරලා තියෙන ඉඩමක් නිසා ඒක වෙනත් කටයුතු සඳහා පවරා ගන්න එපා කියලා. ඒක එයාලට පොදු කටයුතු සඳහාම භාවිතා කරන්න අවස්ථාව දෙන්න කියලා කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි මන්ත්‍රීතුමා ඔබතුමා කියන එක හරි. සුද්ධ සිංහලෙන් කිවුවම ඇත්ත කතාව ඕක. මම ඒකනේ කියන්නේ. ඕකේ අපිට වටිනාකමක් තියෙන දෙයක් කරනවානම්ද හොඳ, නැත්නම් බොරුවට අපි මොකක් හරි කරනවා කියපු ගමන් ඇවිල්ලා පස් හය දෙනෙක්ට සෙල්ලම් කරන්න ඉඩ දෙන එකද කරන්න ඕන. අර ගොඩනැගිල්ල කඩගෙන වැටෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** අපි කොහොමද සභාපතිතුමා එහෙම තීරණය කරන්නේ. දැන් අපි හිතමු මේ ගෙවල්වල මේ වෙලාවේදී සෙල්ලම් කරන වයසේ ළමයි නැත්නම්, තරුණ වයසේ ළමයි නැත්නම්, ඒක කවදාවත් එහෙම නැති වෙන්නේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඔබතුමා කියන එක හරි මන්ත්‍රීතුමා. නමුත් පොදුවේ කාරණය මොකක්ද කියන එක තේරුම් ගන්නකෝ. අපිට පුළුවන්ද, භොජුන්හලක් මිහිඳු මාවතේ කන්ද උඩ හදන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමනි, මෙහෙමයි. එහෙමනම් කලේගාන හන්දිය ඊට වැඩිය ජනාකීර්ණයි. මංසන්ධියක් හැටියටම තියෙනවානේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොතනද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** කලේගාන පොළ භූමිය තියෙන මංසන්ධිය ගැන මම මේ කියන්නේ. එතන ඉදිකරනවානේ ගොඩනැගිල්ලක්. එහෙම යෝජනා වෙලත් තියෙනවානේ. ඒ වෙළඳසංකීර්ණය ඉදිකරන කොට භොජුන්හලක් විතරක් නෙමෙයි, ඉඩම තියෙන නිසා එතන තව ඒවාට අවස්ථාව ගන්න පුළුවන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකටද එතන අවස්ථාවක් ගන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** භොජුන්හලක් වෙනුවෙන්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එතන භොජුන්හලක් හදන එකද හොඳ, පාර්කින් ඔක්කොම දාලා වෙළඳ සංකීර්ණයක් හදන එකද හොඳ. එතකොට එතන භොජුන් හලක් හදන්න පුළුවන්ද.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක අපි යෝජනා කරලා සුදුසුද නැද්ද කියලා බලන්න ඕන. තව ඉඩම් තියෙනවද කියලා බලන්න ඕන. ඒ මිනිස්සු කියන්නේ එයාලට වෙන් වෙච්ච එක මේ වෙලාවේදී ගන්න එපා කියලා. එයාලගෙ පොදු පහසුකම් වෙනුවෙන් වෙන් වෙච්ච ඉඩම ඒ අයට දෙන්න කියලා කියනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක වෙන්වුණා කියලා කිවුවට පාවිච්චි කරන්නේ නැහැ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ අය ඒක පාවිච්චි කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක පාවිච්චි කරන්නේ ඒ අයගේ ගෙවල් හදනකොට වැලි දාන්න ඕවට මේවට.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඔබතුමා මේ කියන්නේ ඊයේ පෙරේදා වැලි ගොඩක් ගහලා තියෙන එක. ඇත්තටම එතන පුංචි පුංචි ඉඩම් කෑලිනේ තියෙන්නේ. වැලිගොඩ දාන්න තැනක් නැති නිසා එතන දාලා තියෙන්නේ. ඒ මිනිස්සු ඒක ඉවත් කරගෙන තියෙනවා. ඒවා තියාගෙන ඉන්නේ නැහැ ඒ මිනිස්සු එතන. ඒ වෙනුවෙන් පාවිච්චි කරනවා කියන එක නෙමෙයි මේ කියන්නේ. ඒක ඔබතුමා තීරණය කරන්න. ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම මත මම මේක ඉදිරිපත් කරේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මම තීරණය කරන්නම් ප්‍රාදේශීය ලේකම්ගෙන් නැවත මේක හොයලා බලලා. නීතිඥවරුන්ගෙන් වෙනම බලන්නම් මේ කාරණය මොකක්ද කියලා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒ ඉල්ලීම ප්‍රදේශවාසීන් විසින් යෝජනා කරේ වෙන මුකුත් නිසා නෙමෙයි. ඒ අය කියන්නේ මේක ඒ අයගේ සුභසාධන කටයුතු සඳහා වෙන් කරලා තිබුණ ඉඩමක් නිසා ඒක ඒ වෙනුවෙන් තියෙන්න අරින්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඉන්දික මන්ත්‍රීතුමා ඔය කාරණය අද අපිට කතා කරන්නත් බැහැ. මොකද මීට මාස දෙකකට විතර කලින් ඔබතුමත් ඉඳපු සභාවකදී අපි සභා තීන්දුවක් අරගෙන තියෙනවා ඔතන භොජුන්හලක් හදන්න.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** සභා තීන්දුවක් ගත්තට සභාපතිතුමා ඒකෙ තීන්දුව ගන්නේ ඉඩම බලලා නෙමෙයිනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔය ඉඩම නම් කරලා අරගෙන තියෙන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** අපි කිව්වානේ සභාවට අයිති ඉඩම් ඔක්කොම වෙන් කර ගන්න කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඔය ඉඩම නම් කරා. එස්.ඕ.එස්. ළමා ගම්මානය අසළ ප්‍රාදේශීය සභාව සතු ඉඩමේ භොජුන්හලක් හදන්න කියලා අපි සභා තීන්දුවක් අරගෙන තියෙනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** දැන්නේ ප්‍රදේශවාසීන් ඒකට විරෝධතාවය දක්වන්නේ. ඒක හින්දා ඔබතුමා ඒක තීරණය කරන්න. ඊළඟට මගේ අනිත් යෝජනා ටික ඉදිරිපත් කරන්නම්.

**28.** උක්වත්ත, හේනවත්ත පාර, වැලුව පාර අවට ප්‍රදේශවල කසළ එකතු කිරීම ක්‍රමවත්ව සිදු නොවන බැවින් ඒ සම්බන්ධව සොයා බලා එම කටයුතු විධිමත් කිරීමටත්, එම මාර්ග දෙපස කාණු පද්ධති අවහිර වී ඇති බැවින් සභාවේ කම්කරුවන් යොදවා එම කටයුතු සිදුකර දීමටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖- 29.** උක්වත්ත පාසල අසළ මාතෘ සායන ගොඩනැගිල්ලේ උඩු මහලේ ඉඩකඩ භාවිතා කරමින් ප්‍රදේශවාසීන්ගේ හා දරුවන්ගේ දැනුම වර්ධනය කිරීම උදෙසා පුස්තකාලයක් ලෙස සංවර්ධනය කොට පවත්වාගෙන යාමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා ៖-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** මේකට ඉල්ලීමක් තියෙනවා. සභාවට ඒකට අවස්ථාව දෙන්න පුළුවන්නම් මම කියන්නේ ඒක ප්‍රයෝජනවත් වේවි. දැනට මාතෘ සායනයට සතියකට එක දවසක් වගේ තමයි පාවිච්චි කරන්නේ. ඒ අතරමැදි ඉඩකඩ අරගෙන ඒක කරන්න පුළුවන්නම් වටිනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ៖-** ඒක බලමු.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ៖-** ඊළඟට ගරු සභාපතිතුමනි, මම මේක අවස්ථාවක් කර ගන්නවා. මම පහුගිය සභාවේදී ඉදිරිපත් කරපු යෝජනා දෙකක් තිබුණා. ඒ යෝජනා දෙකට සභාව ක්‍රියාත්මක වෙලා අදාළ ලිපි නාගරික සංවර්ධන අධිකාරියට, මාර්ග සංවර්ධන අධිකාරියට සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට යොමු කරලා තියෙනවා. නාගරික සංවර්ධන අධිකාරිය වෙත යොමු කරේ අර හෝළුවාගොඩ දැනට කෙරෙන සංවර්ධන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ව්‍යාපෘති වාර්තාව සහ ඇස්තමේන්තුව සභාවට යොමු කරන්න කියලා. ඒ ඉල්ලීම දැන් පහුවෙලා හරි කරලා තියෙනවා. අප්‍රේල් හත් වෙනිදා දිනයෙන් තමයි ඔබතුමා ඒක ඉදිරිපත් කරලා තියෙන්නේ. මම තුන්වෙනි මාසයේදී කරපු යෝජනාවක් මේ. පහුවෙලා හරි මේකට ක්‍රියාත්මක වීම සම්බන්ධව පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා.

ඊළඟට ප්‍රශ්නය තියෙන්නේ ගරු සභාපතිතුමා මේක විධිමත්ව කරන්න සිද්ධ වේවි අනිවාර්යයෙන්ම. දැනටම පාර ගිලා බහිමින් සහ පැලෙමින් තියෙනවා. ඒකට හේතුව වෙන්නේ හෝළුවාගොඩ තියෙන්නේ ඉතාමත් වෙල් පසක්. ඒ පස ඉතාමත් හැල් පසක්. ඒක මොනම ලෙසකින්වත් වළක් හාරන කොට එන පීඩනය දරා ගන්න තරම් සුදුසු, හයිය පසක් නෙමෙයි. ඒ නිසා ඉදිරියේදී මාර්ග සංවර්ධන කටයුත්තකුත් තියෙන නිසා ඒක ගැන සැලකිලිමත් වෙන්න වේවි. නැත්නම් මාර්ගය ගිලා බහින එක වළක්වන්න බැහැ. ඒ නිසා දැනටම ඒකට ක්‍රියාත්මක වෙමින් තියෙනවා. ඒ සම්බන්ධයෙන් මේ වාර්තාව ඉතා ඉක්මනින් ගෙන්වා ගමු. ව්‍යාපෘති වාර්තාවේ ඒක ගැන සඳහන් වෙලා ඇතිනේ. ව්‍යාපෘතියක් පර්යේෂණ වාර්තාවක් අරගන්නේ නැතුව කරන්නේ නැහැනේ. ඒ නිසා ඒකේ මේ ගැන සඳහන්ව ඇති බොහෝ විට. මම විශ්වාස කරනවා එහෙම ඇති කියලා. අපිට මේක ගැන අධ්‍යයනය කරන්න ඉක්මනින්ම සභාගත කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම මතුවෙච්ච අනිත් කාරණය තමයි සභාපතිතුමා අර පාරවල් දෙපස කාණු දාන එක ගැන. ගරු අබේසේකර මන්ත්‍රීතුමත් මේ සභාවේදී ඒ කාරණය ගැන මතු කරා. දැන් මමත් ඒක ගැන මතුකරා. ඔබතුමාට මම දැන් කතා කරපු මවුන්ට්ප්ලසන්ට් එකේ ඉඩම හරහා දාල තියෙනවා, කාපට් පාරේ දැන් කාණුවක් දාලා තියෙනවා. ඉඩම අසලින් දාලා තියෙනවා කාපට් පාරේ දෙපස ඉතාමත් අවිධිමත්ව දෙපස කාණු පද්ධතියක්. ඒකට ඒ අය කියන්නේ අපි පෙන්වලා දුන්නේ නැති නිසා ඒ අයට හිතෙන විදියට කරා කියලා තියෙන ඉඩකඩ බලලා. ඒ නිසා අවසානයේදී දැන් පාර පටු වෙලා තියෙනවා සමහර තැන්වලදී. ඔබතුමාට පේන්නත් ඇති දැන් ඒකෙ තියෙන ගැටළු පාර කාපට් කරන්න ගියාට පස්සේ. නිවාස හිමියන් තියෙන ඒවාගෙන් අල්ලගන්න බලන්නේ. එතකොට දැන් ප්‍රශ්නය තියෙන්නේ අපි ඒ අයව විවේචනය කරනවා. ඒ ගොල්ලොත් එක්ක නඩු කියන්න ලේස්ති වෙනවා. ඒක නිසා දැන් ප්‍රශ්න ගොඩකට මැදිහත් වෙලා තියෙනවා. ඒ නිසා වහාම තියෙන එකවත් රැකගන්න අපි මැදිහත් වෙන්න ඕන ඉස්සෙල්ලා. තියෙන ප්‍රමාණයට වඩා පාරවල් පළල් කරන්න ඉඩ ගන්න බැහැනේ ලේසියකට ඇත්තටම. ඒ නිසා මේකට ඉක්මනින්ම ක්‍රියාත්මක වෙන්න. අනිත් එක ගරු සභාපතිතුමනි, අර ඉඩම් වෙන්දේසියේදී ඉතාමත් අවිධිමත්ව යන මේ ක්‍රම ඇතුලේ අපිට අතුරු ප්‍රශ්න ගණනාවකට ඉස්සරහට මුහුණ දෙන්න සිදු වෙනවා. අපි කල් තියා මේවා දැකලා තියෙද්දිත් ක්‍රියාත්මක වෙන්නේ නැති එක ගැන ප්‍රශ්නයක් තියෙනවා. මවුන්ට් ප්ලසන්ට් ඉඩම සම්බන්ධව මම මේ සභාවෙන් විමසනවා. මේ ඉඩමේ සංවර්ධන කටයුතු දැන් සිදු වෙමින් පවතිනවා. මේක සම්බන්ධව අපිව දැනුවත් වෙලා තියෙනවද, නමුත් අපි කවුරුවත් ඒ ගැන දැනුවත් වෙලා තිබුණේ නැහැ. එවෙලේ මම ලේකම්තුමාගෙන් මේ ගැන විමසුවා. එතකොට තාක්ෂණ නිලධාරිතුමාගෙනුත් මේ ගැන විමසුවා. ඒ වෙන කොටත් අපිව දැනුවත් කරලා තිබුණේ නැහැ. අපේ අයගෙන් මේ ගැන විමසලා බැලුවා. මෙහෙම කටයුතු සිද්ධ කරනවා නමුත් අපිට මේ ගැන දැනුවත් කරලා නැහැ කියලා කිවුවා. අපිට පෞද්ගලික ඉඩම් වලට මැදිහත් වෙන්න බැහැ කියලා කිවුවා. මම ග්‍රාම නිලධාරිතුමියගෙනුත් මේ ගැන විමසුවා. එතුමියටත් පුළුවන්කම තියෙනවා ඒ අවස්ථාවේදී වගකිව යුතු නිලධාරියෙක් විදියට සහ රජයේ නිලධාරියෙක් විදියට මේකට මැදිහත්වීම සිදු කරන්න. එතුමිය ඒ මැදිහත්වීම සිදු කරනවා. පස් කපනවා ඇතුලේ. නමුත් ඒ පස් පිටට ගෙනියන්නේ නැති හින්දා අපිට නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගන්න බැහැ. ඇතුලේ පස් කපලා ඇතුලෙම දානවා. නමුත් විශාල ඉඩමක භූමියේ යම් වෙනසක් කරනවා නම්, ඒක පරිසරයට හානියක් වෙන කාරණයක් විදියට බලපානවා නම් ඒ ගැන හොයා බලන්න රජයේ නිලධාරීන්ට රජය වෙනුවෙන් වගකීමක් තියෙනවා. එයාලා කිවුවේ වගා කරන්න සංවර්ධනය කරනවා කියලා. එහෙම වුණාට පස්සේ මැදිහත් වෙන්න තියෙන ඉඩකඩත් නැති වෙනවා. දැන් කියන්නේ වෙන කතාවක්. හැබැයි අවසානයේදී දැන් ඇවිල්ලා තියෙන්නේ වෙන්දේසියකට ඉඩම් කට්ටි කිරීමට. දැනට ඉඩම කට්ටි කරමින් තියෙනවා. මේ වෙනකොට ඒ ඉඩම අනුමත කරන්න ඉදිරිපත් කරනවා ඉඩමේ පිඹුර. එතකොට දැන් අශ්වයා ගියාට පස්සේ තමයි අපිට ඉස්තාලය වහන්න වෙන්නේ. ඒ හින්දා කරුණාකරලා මේවා සම්බන්ධයෙන් ඒ ආයතන එක්ක විධිමත්ව කතා කරලා වහාම ක්‍රියාත්මක වෙන්න. නැත්නම් ඒක ප්‍රශ්නයක්. ඒක අක්කර පහක විතර ඉඩමක්. ඒ ඉඩම සම්පූර්ණයෙන්ම සුද්ධ කරලා තියෙනවා තණකොළ ගහක්වත් නැති වෙන්න. කඳු බෑවුමක් නිසා ඒ සියළු වතුර පාර ගලා යනවා. මේක ඔබතුමාගේ බලප්‍රදේශය. මේක ගැන ඔබතුමා හොඳටම දන්නවා. මම හිතන්නේ ඔබතුමා බලන්න ගිහිල්ලත් ඇති. ඒ කාණු පද්ධතිය අඩියක්වත් පළල නැහැ. අඟල් හයක් උස නැහැ සමහර තැන්වල. ඒ එන වතුර ධාරිතාවට කොහෙත්ම ඔරොත්තු දෙන්නේ නැහැ ඒක. එතන හන්දියේ පහළ කොටස ජලයෙන් යට වෙන්න පුළුවන් මේ නිසා. අනිවාර්යයෙන්ම මහ වැස්සක් ආවොත් එතන යට වෙන්න පුළුවන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේවා විධිමත් කරන්න. කොච්චර මෙතන සාකච්ඡා කරත්, අපි මේ සභාව ඇතුළේ කොච්චර යෝජනා ගෙනාවත් මේවා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රායෝගික ප්‍රශ්න ගණනාවකට මුහුණ දීලා තියෙනවා. ඒවා ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තියෙනවා. කරුණාකරලා ඔබතුමා මේවා සම්බන්ධව කල් ඇතුව තීන්දු තීරණ ගන්න. නැත්නම් අපිට පස්සේ පසුතැවිලි වෙන්න විතරයි වෙන්නේ. මිනිස්සුන්ගේ චෝදනාවල් වලට සහ විවේචන වලට ලක්වෙන්න සිදුවේවි. ඒක ගැන ඔබතුමා සභාවේ සභාපතිවරයා විදියට සහ සියළු වගකීම් දැරිය යුතු පුද්ගලයා විදියට සැලකිලිමත් වෙන්න. මේකෙ විධායකයා ඔබතුමා. එතකොට ඔබතුමාගේ පැත්තෙන් අපි යෝජනා කරනවා සහ ඒවා සාකච්ඡා කරනවා. ඒවා සම්බන්ධව ක්‍රියාත්මකවීම හෝ ඒවා ක්‍රියාවට නැගීම ඔබතුමා හරහා ඔබතුමාගේ තීන්දු තීරණ අනුව සිද්ධ වෙන්න ඕන. ඒ නිසා ගරු සභාපතිතුමනි, පහුගිය කාලයේදී ඒ කරපු යෝජනා සම්බන්ධයෙන් අවධානය යොමු කරලා නැවතත් ඉතාමත් ඉක්මනින් මේවා නිරවුල් වෙන්න, නිරාකරණය වෙන්න කටයුතු කරන්න. අපිට නැවතත් ජනතාව විසින් පෙරලා විවේචන එල්ල නොකරන තැනට මේ කටයුතු සිදු කරන්න කියලා නැවතත් ඉල්ලා සිටිනවා. බොහොමත්ම ස්තුතියි.

**<u>ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 30.** නරාවල පන්විල පාරේ, පොඩි කඩය අසළ සිට මුලන දෙසට යන මාර්ගයේ නල ජලය ලබා දීම සඳහා බැකෝ යන්ත්‍රයක් භාවිතා කර කාණු කැපීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ- 31.** මුලන සුසාන භූමියේ පිහිටි ගොඩනැගිල්ල සභා අරමුදලෙන් ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ ගොඩනැගිල්ල දැනට කඩා වැටෙන්න ආසන්න වෙලා තියෙන්නේ. සභාවට ගෙවීම් කරලා තමයි මම හිතන්නේ ඒකෙ භූමදාන කටයුතු කරන්නේ. සියලුම දේ නොවුණත් සමහර ඒවාට සභාවට ගෙවලා තමයි ඒ තැන්පත් කිරීම් කරන්නේ. ඒ නිසා මේ කටයුත්තට අවධානය යොමු කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒ වගේම සභාපතිතුමා මගේ චෝදනාවක් තියෙනවා ඔබතුමාට. ඔබතුමා නරාවල කොට්ඨාශයේ ජනතාවගේ ප්‍රශ්න වලට කිසිම සාධාරණයක් කරන්නේ නැහැ. අද වෙනකොට අනවසර ඉදිකිරීම් කරනවා. තාප්ප බඳිනවා. ඒ සඳහා කිසිම මැදිහත්වීමක් සභාවෙන් වෙන්නේ නැහැ. කිසිම නිලධාරියෙක් එන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ගුටි කැවෙත් නරාවලින් විතරයි. ජීවිතයටම දෙමාපියන්ගෙන්වත් ගුටි කාලා නැහැ. කොහොමද කියන්නේ මැදිහත් වෙන්නේ නැහැ කියලා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** චෝදනාව කියලා කියන්නේ ඇයිද කියලා මම ප්‍රශ්නය කියනකම් ඉන්න. මේකෙ මැදිහත් වෙන්නේ නැහැ කියලා කියන්නේ මේකයි. මම ඔබතුමාට කිවුවා තාක්ෂණ නිලධාරීව වෙනස් කරලා දෙන්න කියලා. දැන් කිසිම මනුස්සයෙක් සභාවට කතා කරලා දෙයක් කියන්න කැමති නැහැ. මොකද කිවුවට පස්සේ අනිත් පැත්තෙන් තාක්ෂණ නිලධාරියා ඒක කිවුවේ කවුද කියලා කියන නිසා. ඉතිං ඔබතුමාට මැදිහත් වෙන්න විදියක් නැහැ ඒක නිසා. ඔබතුමා ජනවාරි පළවෙනිදා ඉඳන් තාක්ෂණ නිලධාරිව අයින් කරලා වෙන කෙනෙක්ව දානවා කිවුවා. පෙබරවාරි පළවෙනිදා ඉඳන් ඒක කරනවා කිවුවා. මාර්තු පළවෙනිදා ඉඳන් ඒක කරනවා කිවුවා. අප්‍රේල් පළවෙනිදා ඉඳන් ඒක කරනවා කිවුවා. අද අප්‍රේල් නමවෙනිදා. අද වෙනතුරු ඒ කාර්යය වෙලා නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අප්‍රේල් පළවෙනිදා කරන්න බැහැ මෝඩයාගේ දවස හින්දා. ඒ දවස මෝඩයාගේ දවස නිසා කරන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක තමයි දැන් මම මෝඩයා වෙලා ඉන්නේ. අද වෙනතුරු ඒක වෙලා නැහැ. අනවසර ඉදිකිරීම් ගැන දැන් කියන්න කෙනෙක් නැහැ. දැන් මාර්ටින් පෙරේරා මාවතේ ඔබතුමාට ගහපු මනුස්සයත් අනවසර ඉදිකිරීමක් කරනවා. ඒවා කියන්න ඕන. මේවා සභාවේදී කතා කරන්න ඕන. ඔබතුමාට පහරදීපු මනුස්සයත් දැන් අනවසර ඉදිකිරීමක් කරනවා බැම්මක් දාලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ජුනි පළවෙනිදා ඉඳගෙන ස්ථානමාරු ක්‍රියාත්මකයි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඒක හැමදාම හුරු වචනයක්. පළවෙනිදා කියන එක. දැන් ජුනි පළවෙනිදා වෙනකම් ඉන්න ඕන. මේක කියන්න කෙනෙක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මොකක්ද කියන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** දැන් අනවසර ඉදිකිරීමක් නවත්වා ගන්න විදියක් නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මට ඒ තැන් ටික කියන්න.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** තැන් ටික කිවුවට වැඩක් නැහැ සභාපතිතුමා. ඒවා කියන්න බයයිනේ. අනිත් පැත්තෙන් ඒක කියනවානේ. ඒකනේ වැඩේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම කියන්නම්. එතකොට ඔබතුමා නෙමෙයිනේ කියන්නේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඔබතුමා නෙමෙයිනේ කියන්නේ. තාක්ෂණ නිලධාරිතුමා පරික්ෂණයට ගියාට පස්සේ එහෙම කියන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** නෑ ඉතිං එතකොට තාක්ෂණ නිලධාරි කියන්නේ මම කිවුවා කියලනේ.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** හැල්ලුවට ලක් කරලා කතා කරන්න එපා සභාපතිතුමා. මමත් මේ සභාවේ මන්ත්‍රීවරයෙක්. මමත් ජනතාව නියෝජනය කරලා මෙතනට ඇවිල්ලා තියෙන්නේ. මාස ගාණක් තිස්සේ මම මේ ඉල්ලීම කරන්නේ මට මේ මනුස්සයා එක්ක වැඩ කරන්න බැහැ කියලා. තව දේවල් මම හොයලා කිවුවොත් සභාවට කළු පැල්ලමක් එන්නේ. කරපු දේවල්, ගනිපු දේවල් කියන්න ගත්තොත් මගෙන් අහගන්න එපා. මට මේ නිලධාරියාව මාරු කරලා දෙන්න. මම දැන් මාස ගාණක් තිස්සේ මේක ඉල්ලන්නේ. මාස ගාණක් නෙමෙයි අවුරුදු ගාණක් තිස්සේ මේක කියන්නේ. මාව නිකං පොඩි එකා විදියට හැල්ලුවට ලක් කරලා හැමදාම සභාවේදී විහිළු කරනවා. ඒක නිසා සභාපතිතුමනි, මට අවුරුද්දෙන් පස්සේ හරි වෙන තාක්ෂණ නිලධාරි කෙනෙක්ව පත්කරලා දෙන්න මගේ කොට්ඨාශයට. ඔබතුමා උප සභාපතිතුමාට මේක කරලා දුන්නා නම් ඇයි මට කරලා දෙන්න බැරි. මම මන්ත්‍රීවරයෙක් නෙමෙයිද. ඇයි මට කරලා දෙන්න බැරි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒ උප සභාපතිනේ. උප කෑල්ල අයින් කරහම ඒ සභාපති. ඒකට මොනවා කරන්නද.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** උප සභාපතිතුමාව පත් කරෙත් ජනතාව, මාව පත් කරෙත් ජනතාව. විහිළු කරන්න එපා සභාපතිතුමා.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ගරු මන්ත්‍රීතුමා මෙහෙමයි. නිලධාරියෙක්ට ස්ථාන මාරුවක් කරන කොට ඒකට විධිමත් ක්‍රමවේදයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ස්ථාන දෙකක් අතර නෙමෙයිනේ මේක කරන්නේ. සභාව ඇතුළේනේ මේක කරන්නේ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මෙහෙම තියෙන්නේ. අභ්‍යන්තර ස්ථාන මාරුවකදී වුණත් විධිමත් චෝදනා ඉදිරිපත් කරන්න ඕන. ඒ පුද්ගලයාට පුළුවන් එහෙම කරන හේතුව මොකක්ද කියලා අහන්න. ඒ නිසා මම මේ කියන්නේ නිලධාරීන් සම්බන්ධව කටයුතු කරන කොට ඒකට කරන විදියක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** ඔබතුමන්ලා මෙතන බයිල ගහනවා. කතා කරන එක තේරෙන්නෙත් නැහැ.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක ඔබතුමා තීරණය කරන්න. නිලධාරීන් ස්ථාන මාරු කරන විදියක් තියෙනවා. මම කියන්නේ එතුමා සම්බන්ධව වැරැද්දක් තියෙනවා නම් ඒක වෙනම බලන්න ඕන.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** අභ්‍යන්තර ස්ථාන මාරු කරන්න පුළුවන්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** මම කියන්නෙත් අභ්‍යන්තර ස්ථාන මාරු ගැන තමයි.

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** මම ඉල්ලන්නේ කරන්න පුළුවන් දෙයක්.

**ගරු මන්ත්‍රී ඉන්දික විජයවික්‍රම මැතිතුමා ඃ-** ඒක කරන්න පුළුවන්. ඒක කරන්න පුළුවන් වුණාට ඒක කරන ක්‍රමයක් තියෙනවා. ඒකයි මම කියන්නේ. එතුමා සම්බන්ධව ප්‍රශ්නයක් තියෙනවා නම් විධිමත්ව පරීක්ෂණයක් කරලා ඒක කරලා දාන්න.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි. මම ඒකට ඉක්මනට උත්තරයක් දෙන්නම්.

**<u>ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමාගේ යෝජනා</u>**

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 32.** කැබලි කර විකුණනු ලබන ඉඩම් (වෙන්දේසි ඉඩම්) කට්ටි සඳහා නල ජල පහසුකම් අත්‍යාවශ්‍ය සාධකයක් බැවින් මේ වන විට ජල සම්පාදන මණ්ඩලය මගින් නල ජල පහසුකම් ලබාදීම සිදුකරනු ලබන අතර අදාළ ඉඩම් සඳහා අනුමැතිය ලබාදීමට පෙර නල ජල පහසුකම් සපුරා ඇතිද යන්න අනිවාර්යයයෙන්ම පරීක්ෂා කළ යුතු බව යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** දැන් ඒ ගැන ගැටළුවක් නැහැ. දැන් ඒ විදියට තමයි යන්නේ.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ- 33.** පෞද්ගලික හෝ සමාගම් මගින් කැබලිකර විකුණන ඉඩම් සඳහා වූ පිවිසුම් මාර්ගය නාගරික සංවර්ධන අධිකාරියේ නීති රීතිවලට අනුව පිරිවිතර තිබිය යුතු බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.යූ.ජී. යසරත්න මැතිතුමා ඃ-** එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කොහොමත් ඒක සැලසුම් කමිටුවෙන් තමයි තීරණය කරන්නේ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** ඒක කියන්න හේතු වෙලා තියෙන්නේ මේකයි. ගයාන් ගීතික මන්ත්‍රීතුමා කිවුවා වගේ පොඩි පොඩි ඉඩම් කැබලි, සමහර වෙලාවට පර්චස් 30 - 80 වෙනකම් ඉඩම් අයිතිකරුවන් විසින් කැබලි කරලා විකුණන්න කියලා වෙන කාටහරි පවරනවා. ඒක පවරලා දෙන්නා එක්ක ගිවිසුමකට එනවා සියයට ගාණකට මුදල බෙදා ගන්න ඉඩම් කැබලි විකුණලා ඉවර වෙලා. එහෙම ආවම මේ වැඩේට එන්නේ වෙන කවුරුහරි. ඒකට අයිතිකාරයා එන්නේ නැහැ. ඊට පස්සේ කරන්නේ අරහෙන් දානවා, මෙහෙන් දානවා, වංගු දාලා අරකේ ඉඩම් කැබලි ටික දඩිබිඩි ගාලා විකුණලා දානවා. අන්තිමට පිවිසුම් මාර්ගයක් ඇත්තෙත් නැහැ. ඒ මිනිස්සුන්ට නළ ජල පහසුකම් ඇත්තෙත් නැහැ. ඉඩම් වලත් ගැටළු. දැන් එහෙම එකක් පවත්වා ගෙන යනවා. හෙට අනිද්දාට ඒකට අනුමැතිය සඳහා ඒවි. ඉසුරු පෙදෙසේ ඉඩමක් මේක. ගුරු මහත්මයෙක් ඒක කරන්නේ. එයාගේ නෝනාගේ නමටද කොහෙද තියෙන ඉඩමක් ඒක. මේක කෙලවරේ තියෙන ඉඩම් කැල්ලේ පර්චස් පහයි දශම ගාණක් තියෙන්නේ. නමුත් ඒක යටින් ගහලා තියෙනවා අනිත් ඉඩම හා සම්බන්ධ වේ කියලා. වෙන මිනිහෙක්ගේ ඉඩමක් එහා පැත්තේ තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක මොකක්ද.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** පර්චස් පහයි දශම ගාණක් තියෙන ඉඩමක් ඒක. කට්ටි පහෙන් පස්වෙනි එක මේක. ඒකට ගහලා තියෙනවා යට කොටසේ ඒ ඉඩම් කට්ටිය අල්ලපු ඉඩම හා සම්බන්ධ වේ කියලා. අල්ලපු ඉඩම හා සම්බන්ධ වේ කියලා කොහොමද අනුමැතිය දෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කෝ මට ඒක පෙන්වන්න. එහෙම දෙන්න බැහැ.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** තියෙනවා. ඒක දැනට මෙහෙට භාර දීලා තියෙනවා කියලා මට දැන ගන්න තියෙනවා. මම කියන්නේ හරි ප්‍රවේශමෙන් මේවා කරන්න ඕන. නෙළුව, ඕපාත, තවලම, දෙල්ලව ඉඳලා එන මිනිස්සු මේවා ගන්නේ. ඒ මිනිස්සු මේ ඉඩම් ගන්නවා. ඒ මිනිස්සු මේක ගැන දැනුවත් නැහැ. ඒ මිනිස්සුන්ට අන්තිමට විදුලියත් නැහැ. ජලයත් නැහැ. මොකක්වත්ම නැහැ. ඒ මිනිස්සු මේකෙ පාර පස්සේ දුවනවා. ඒක හොඳට බලන්නකෝ. හතරක් වෙනම කඩලා තියෙනවා. එකක් වෙනම කඩලා තියෙනවා. පාර අඩි හයයි තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක නම් මම පිළිගන්නේ නැහැ. ඒක එහෙම වෙන්න බැහැ මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** තාම අනුමැතිය දීලා නැහැ. කරුණාකරලා මේ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(ඊ) කාරක සභාවල වාර්තා ඃ-</u>**

**<u>01. මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව</u>**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2021-03-17 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** II. 2021-03-19 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** III. 2021-03-24 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** IV. 2021-04-06 දින පැවති මුදල් සහ ප්‍රතිපත්ති සැකසුම් කමිටුව

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. තාක්ෂණික සේවා කමිටුව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** I. 2021-03-24 දින පැවති තාක්ෂණික සේවා කමිටුව

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. නිවාස සහ ප්‍රජා සංවර්ධන කමිටුව :- නැත**

**04. පරිසරය සහ පහසුකම් කමිටුව :- නැත**

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**(උ෴) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම ඃ-**

**01. ලැබීම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ ලැබීම් සාරාංශය (ප්‍රා.ස. 16)

**ගරු මන්ත්‍රී ඕ.කේ. චනක චමල් පද්මකුමාර මැතිතුමා ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**02. වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය (ප්‍රා.ස.14)

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**03. එකතු කල ආදායම පිළිබඳ ප්‍රගති වාර්තාව**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ මාර්තු මස මාසික ඒකාබද්ධ හිඟ ආදායම් ප්‍රකාශය (ප්‍රා.ස. 07)

**ගරු මන්ත්‍රිනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එම වාර්තාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** එම වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**04. වෙනත් ලේඛන ඃ- නැත**

**(ඌ) රැස්වීම් කැඳවීම් දැන්වීමේ දක්වා ඇති වෙනත් කාරණා**

**පසුගිය මහා සභා රැස්වීම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාවල ප්‍රගතිය සමාලෝචනය**

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** 2021 වර්ෂයේ අප්‍රේල් මස මහා සභාවට ඉදිරිපත් කරන ප්‍රගතිය සමාලෝචනය.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** ගරු සභාපතිතුමනි, මටත් හදිසි යෝජනාවක් ගරු සභාවට ඉදිරිපත් කරන්න තියෙනවා. කපුහෙම්පල විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේගේ ඉල්ලීමක් තියෙනවා අද සභාවට ඉදිරිපත් කරන්න කියලා. එම විහාරස්ථානයට ප්‍රවිෂ්ඨ වෙන මාර්ගය 2020 වර්ෂයේ දෙසැම්බර් මාසයේ මම හිතන්නේ කාපට් ව්‍යාපෘතියක් විදියට කරන්න අපේ ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමාගේ අතින් මුල් ගල් තියලා ඒ පාර කරන්න පටන් ගත්තා. නමුත් මේ වන තෙක් ඒකෙ කටයුතු සිදු වෙලා නැහැ. ඉතිං මට අද ගරු ස්වාමීන් වහන්සේ ඉල්ලීමක් කරා සභාව හරහා කතා කරලා අපි මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරලා මේක ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු සකස් කරලා දෙන්න කියලා. මොකද මම හිතනවා මේක කඩිනමින් කරා නම් හොඳයි කියලා. මේ ප්‍රදේශවාසීන් මම හිතන්නේ මේ වෙන කොට උද්ඝෝෂණ ව්‍යාපාරයකට සූදානම් වෙනවා කියන ආරංචිය තියෙනවා. ඒ නිසා කඩිනමින් මේ කටයුතු කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

(ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක ගැන මන්ත්‍රීතුමිය ඇමතිතුමා එක්ක කතා කරානම් හොඳයි කියලා හිතෙනවා. නැත්නම් ඕකට වෙනත් ගැටළුවකට මුහුණ දෙන්න සිද්ධ වේවිද දන්නේ නැහැ. මොකද ඕක ඇමතිතුමා ගිහින් මුල්ගල් තියලා ආරම්භ කරපු එකක්.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** එහෙමනම් අපි මේ ගැන ඇමතිතුමාව දැනුවත් කරමු.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මේක ගැන ඇමතිතුමාව දැනුවත් කිරීම තමයි මම දකින්නේ හොඳම දේ විදියට. ඒක සභාව විදියට ඇමතිතුමාව දැනුවත් කරමු. නැත්නම් වෙනත් ප්‍රශ්නයකට මුහුණ දෙන්න වේවි ඊට පස්සේ.

**ගරු මන්ත්‍රීනි එම්. ගයාත්‍රි කාංචනා මැතිණිය ඃ-** බොහොම ස්තුතියි.

**ගරු මන්ත්‍රී ගයාන් ගීතික තල්පෙ ලියනගේ මැතිතුමා ඃ-** හාමුදුරුවොන්ට දන්වලා යවමු ඔබවහන්සේට මුල්ගල හරි තියෙනවා. ගොඩකන්ද පාරට එහෙමවත් නැහැ කියලා.

(ගරු මන්ත්‍රී යූ.එල්. තුසිත චාමින්ද මැතිතුමා, ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** වැලිකැටියවත්ත මාර්ගයේ පැති බැම්ම ඉදිකිරීමේ තත්ත්වය මොකද දන්නේ නැහැ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඉතිං ඒකෙ පැතිබැම්ම හදන්න කියලා මම කිවුවානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** මම ඊයේ ඇවිල්ලා ඇහුවම නිලධාරීන් කිවුවා ඒක ගැන දන්නේ නැහැ කියලා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** කියන්න එපැයි ඒක හදන්න කියලා. අපි ඒක කරන්න කිවුවානේ. ඒකට සභා යෝජනාවක් තියෙනවානේ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ඊට පස්සේ ඒක පළාත් පාලන දෙපාර්තමේන්තුවට දාලා අනුමැතිය ගන්න ඕන කියලා කිවුවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකෙ ඇස්තමේන්තුව කීයක් කියනවාද.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ලක්ෂ තිස් හයක් තියෙනවා ඇස්තමේන්තුවේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ලක්ෂ තිස් හයක් නම් දාන්න බැහැ.

**ගරු මන්ත්‍රී යූ. විශ්වජිත් ජයනෙත්ති මැතිතුමා ඃ-** ලක්ෂ දහයක හරි, ලක්ෂ පහළොවක හරි කොටසක් දාන්න අඩු ගාණේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මම තාක්ෂණ නිලධාරියා එක්ක ඒක ගැන කතා කරන්නම්.

(ගරු මන්ත්‍රී කේ.යූ.පී. යසරත්න මැතිතුමා සභා ගර්භයෙන් පිටවීම සිදුවිය.)

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගරු සභාපතිතුමා, ඩඩ්ලි මන්ත්‍රීතුමා කරපු ප්‍රකාශයේ පොඩි වැරැද්දක් තියෙනවා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක එතුමා ඉද්දි කියන්න තිබුණානේ. එතුමා එනවා කිව්වා. එතකොට මේක ගැන කතා කරමු.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** අර වීදි ලාම්පු හයි කරපු එකේ ගැටළුව තියෙන්නේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මෙහෙමයි මන්ත්‍රීතුමා, මම මේක සියළුම මන්ත්‍රීතුමන්ලාගෙන් සහ මන්ත්‍රීතුමියන්ලාගෙන් ඉල්ලා සිටිනවා. තමන් අලුත් ලයිට් එකක් හයි කරනවා නම් තමනුත් එතනට ගිහින් ඒක හයි කරන්න. මොකද දන්නවාද, පණිවිඩය කියලා දුරකථනයෙන් දැනුම් දීලා ඊට පස්සේ හයි කරපු තැනින් නැවත ගලවන කොට ගැටළුවක් සිද්ධ වෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** ගැටළුවක් වුණේ නැහැනේ සභාපතිතුමා.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** මිනිස්සු ඒකට චෝදනා කරනවා. දාපු ලයිට් එක ගලවන කොට ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** දැන් නාගරුක්ඛාරාම පාරට හැරෙන තැන ලයිට් එකක් තියෙනවා.

(ගරු මන්ත්‍රී ඒ.ඩබ්ලිව්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා සභාවට සහභාගිවීම සිදුවිය.)

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** හරි මන්ත්‍රීතුමා, ඒක නෙමෙයි මම කිව්වේ. එක ළඟ ලයිට් දෙක තියෙන තැනුත් තියෙනවා. නමුත් මේ කියන්නේ ඒක නෙමෙයි. ලයිට් එකක් දාන කොට නිශ්චිත තැනට දාන්න. ඔයගොල්ලෝ ලයිට් හයි කරන දවසුත් ඉල්ලා ගන්නවා. ඒකත් අපි කොහොම හරි අමාරුවෙන් දෙනවා. ඔබතුමාගේ එකට නෙමෙයි මම ඒක කිව්වේ. ලයිට් එකක් අලුතෙන් දාලා ඒක ගලවන්න යන්න එපා. එතකොට එතන අර්බුදයක් නිර්මාණය වෙනවා. වීදි පහනේ ගැටළුවක් නැහැ කියලා තිස්ස මන්ත්‍රීතුමා කියනවා. මොකක්ද එතන වුණේ තිස්ස මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඩබ්.එච්. තිස්ස මැතිතුමා ඃ-** එදා රැස්වීමක් තිබුණ නිසා මම ලයිට් ටික හයි කරන්න ඕන තැන් ටික කිව්වා. නමුත් ඒක කියපු තැන නෙමෙයි හයි කරලා තිබුණේ. ඊට පස්සේ එක තැන ලයිට් දෙකක් තියෙනවා. ඒ නිසා මම ඒක ගලවලා ඒ කියපු තැනට ගෙනල්ලා ඊට ඉස්සරහ තියෙන තුන්මංහන්දියේ දැම්මා. ඒකට මෙතුමා චෝදනාවක් කරලා තියෙනවා. එහෙම දෙයක් වුණේ නැහැ. මගේ කොට්ඨාශයේ මට ඕන තැන මම හයි කරේ. මම ගැලෙව්වා, මම හයි කරා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** සභාපතිතුමා පැහැදිළිවම කතන්දරේ මේ අනවශ්‍ය වැඩක්. මේක අනවශ්‍ය ප්‍රශ්නයක්. මෙතන කලින් ලයිට් එකක් තිබුණා. මෙතනට ඇවිල්ලා ඒක ගලවලා එල්.ඊ.ඩී. ලයිට් එකක් දාලා තිබුණා. ඒක මමත් දැක්කා. සති එකහමාරක් විතර මේ ලයිට් එක තිබුණා. ඊට පස්සේ හිටි ගමන් ඒ ලයිට් එක ගලවා ගෙන ගිහිල්ලා. ඒ පාර මිනිස්සු මට කිව්වා මෙතන හැරෙන තැන ලයිට් එකක් දාලා තිබුණා, ඒක හොඳයි කියලා. මොකද එතන තියෙන අනවසර ගොඩනැගිල්ල අයින් කර ගන්න බැරි වුණානේ. ඒක දාපු නිසා පාර පැහැදිලිව පේනවා. ඒක හොඳයි. මම කිව්වා සභාවෙන් තමයි මේක දාන්න ඇත්තේ කියලා. මම දන්නේ නැහැ ඒක කවුරු දැම්මද කියලා. හැබැයි මේක දැන් ගලවා ගෙන ගිහිල්ලා කියලා කිව්වා. ඒ පාර මම බලන කොට ඒ ලයිට් එක නැහැ. එතනට වෙන එකක් දාලා තියෙනවා. ඒක තමයි මම මේ කියන්නේ. ඇයි එතනට ඒ ලයිට් එක සුදුසු නැත්නම් දැම්මේ. දාපු ලයිට් එකක් ගලවපු නිසා තමයි මේ ප්‍රශ්නය ආවේ. නැත්නම් මේ මිනිස්සු ඇවිල්ලා ඕක කියන්නේ නැහැනේ. ඒ මිනිස්සු ලයිට් එකක් ඉල්ලන්නේ නැහැනේ. එතන ඉන්න කවුරුවත් ලයිට් එකක් ඉල්ලලා නැහැ. එතනට ගිහිල්ලා ලයිට් එකක් සවිකරලා ඒක සති එකහමාරක් තියෙන්න ඇරලා ගලවා ගෙන ගිහින් තවත් තැනක හයි කරලා තියෙනවා. ඒක ඒ පාරෙම ඊට පොඩ්ඩක් එහායින් දාලා තියෙනවා. මිනිස්සු කියනවා මේක ගලවා ගෙන ගිහින් අතන හයි කරලා කියලා. ඇයි එහෙම ගලවලා හයි කරන්නේ. ඇයි අනවශ්‍ය තැන්වල ලයිට් දාන්නේ. මේ දා ගනිපු ලෙඩක්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒක තමයි කියන්නේ තිස්ස මන්ත්‍රීතුමා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** දැන් මම කියන්නේ එතනට ලයිට් එකක් දාලා දෙන්න ඒ හයි කරපු එක ගැලෙව්වා නම්.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කරන්න කිවුවා බෝපෙ පෝද්දල තරුණ සේවා නිලධාරිතුමිය ප්‍රාදේශීය ක්‍රීඩා උත්සවය තියෙනවා කියලා හපුගල මහා විද්‍යාලයේදී උදේ 08.00 ඉඳගෙන හවස 05.00 වෙනකම් 11 වෙනි ඉරිදා. උදේ 08.00 ඉඳන් හවස 05.00 වෙනකම් ඒක තියෙනවා කියලා කිවුවා. සියලු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීතුමියන්ලාට ඒකට ආරාධනා කරන්න කියලා කිවුවා.

**ගරු මන්ත්‍රී සුගත් කලංසූරිය මැතිතුමා ඃ-** අපේ ආදාහනාගාරය හදන එකට තීන්දුවක් ගත්තේ නැහැනේ.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** ඒකට නර්ඩ් ආයතනයෙන් ඉල්ලලා යැව්වා ඒ ආයතනයේ නිර්දේශ දෙන්න කියලා මේ අයගෙන් වැඩිම පළපුරුද්ද තියෙන්නේ කාටද කියලා. පළපුරුද්ද, අත්දැකීම්, මූල්‍ය හැකියාව වැඩියෙන්ම තියෙන්නේ කාටද කියලා එහෙන් නිර්දේශ අරන් සභාවට දාලා තීන්දුවක් ගමු.

සියලු දෙනාටම ලබන්නා වූ සිංහල දමිළ අලුත් අවුරුද්ද සිතුම් පැතුම් ඉටුවෙන වාසනාවන්ත සුභ අලුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

**ගරු මන්ත්‍රී ඒ.ඩබ්. ඩඩ්ලි ඩන්ස්ටන් මැතිතුමා ඃ-** මැයි මාසේ මුල සභාවක් කැඳවනවා කියලා කිවුවා නේද.

**ගරු සභාපති දිල්රුක් එන්. අබේකෝන් මැතිතුමා ඃ-** සමහර විට විශේෂ සභාවක් කැඳවන්න පුළුවන් ආදාහනාගාරය පිළිබඳව තීන්දුව ගන්න.

**<u>සභා රැස්වීමේ වැඩ කටයුතු අවසන් කිරීම.</u>**

මීළඟ මහා සභා රැස්වීම 2021-05-19 වන බදාදා දින පෙ.ව 09.30 ට බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව දන්වා සිටිමින් මහා සභා රැස්වීම අවසන් කරන ලදී.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපෙ පෝද්දල ප්‍රාදේශීය සභාව.